2024 ජූනි 24
2024 யூன் 24
24 June 2024

NAOSL

| | | |
|---|---|---|
| වාර්තාවේ අංකය | : | පීඑස්ඊ/බී/එෆ්එස්එල්ආර්ඊපී/2023/01 |
| அறிக்கை இல. | : | பீஎஸ்ஈ/பீ/எப்எஸ்எல்ஆர்ஈபீ/2023/01 |
| Report No | : | PSE/B/FSLREP/2023/01 |

# ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත සිදුකරනු ලැබූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

# ஆசிய அபிவிருத்தி வங்கியின் கடன் உதவியின் அடிப்படையில் மேற்கொள்ளப்பட்ட உணவுப் பாதுகாப்பு மற்றும் வாழ்வாதார மீட்பு அவசர நிதிஉதவித் திட்டம் தொடர்பான விசேட கணக்காய்வு அறிக்கை.

# Special Audit Report on the Food Security and Livelihood Recovery Emergency Assistance Project carried out on the Loan Assistance of the AsianDevelopment Bank

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



# ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත සිදුකරනු ලැබූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව



**වාර්තාවේ අංකය : පීඑස්ඊ/බී/එෆ්එස්එල්ආර්ඊපී/2023/01**

**ජාතික විගණන කාර්යාලය**

# පටුන


| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| 01 | | විධායක සාරාංශය | 01 |
| 02 | | හැඳින්වීම | 06 |
| | 2.1 | පසුබිම | 06 |
| | 2.2 | විගණන අරමුණ හා නිර්ණායක | 10 |
| | 2.3 | විගණන විෂය පථය හා විෂය පථය සීමා වීම | 14 |
| | 2.4 | විගණන ප්‍රවේශය | 14 |
| | 2.5 | විගණන ක්‍රමවේදය | 15 |
| | 2.6 | විගණනය සඳහා අධිකාර බලය | 15 |
| | 2.7 | දත්ත භාවිතයන් සඳහා සීමාවන් | 16 |
| 03 | | විස්තරාත්මක විගණන නිරීක්ෂණ | 17 |
| | 3.1 | සමෘද්ධි දීමනා ලබා දීම | 17 |
| | 3.2 | වැඩිහිටි පුද්ගලයන් සඳහා මූල්‍ය දීමනා ලබා දීම (ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව) | 27 |
| | 3.3 | ආබාධිත පුද්ගලයින් සඳහා මූල්‍ය දීමනා ලබා දීම | 37 |
| | 3.4 | වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය දීමනා ලබා දීම | 41 |
| | 3.5 | ගර්භණී සහ කිරි දෙන මව්වරු සඳහා මූල්‍ය දීමනා ලබා දීම | 43 |
| | 3.6 | වී ගොවීන් සඳහා මූල්‍ය දීමනා ලබා දීම | 56 |
| | 3.7 | ප්‍රතිලාභ සමෘද්ධි බැංකු මගින් ගෙවීමේ කාර්යක්ෂමතාවය | 80 |
| | 3.8 | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් සමඟ ව්‍යාපෘති අරමුණු ගැලපීම | 85 |
| | 3.9 | ව්‍යාපෘති නියාමන කාර්යයන් | 86 |
| 04 | | නිර්දේශ | 91 |
| | | ඇමුණුම් | 92 |

## 01. විධායක සාරාංශය

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ පමණ සිට ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපායන් අඛණ්ඩව පිරිහෙමින් පැවති අතර, එහිදී දිළිඳු හා අවදානමට ලක් වූ පුද්ගලයන්ගේ ආහාර සහ ජීවනෝපායන් ආරක්ෂා කිරීම පිණිස රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවෙන් හදිසි ආධාර ඉල්ලා සිටින ලදී. ඒ අනුව, ලද ඩොලර් මිලියන 200ක ණය මුදලට අදාළ ගිවිසුම 2022 සැප්තැම්බර් 09 වන දින අත්සන් තබා තිබූ අතර මෙම විගණනයේ අරමුණ වූයේ එසේ ලද ණය මුදල උපයෝජනය කිරීමට අපේක්ෂිත වූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ කාර්යසාධන ඇගයීම විය. 2022 වර්ෂයේ සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා ණය ආධාර යටතේ සමෘද්ධිලාභීන්, අඩු ආදායම්ලාභී වැඩිහිටි හා ආබාධිත පුද්ගලයින් සහ වකුගඩු රෝගීන්, 2023 මාර්තු සහ අප්‍රේල් මාසයන්හි දීමනා ලද ගර්භණී සහ කිරි දෙන මව්වරුන් සහ 2022 මහ කන්නයේ වී වගා කළ ගොවීන් සඳහා ද ගෙවන ලද දීමනා පිළිබඳව මෙහිදී අවධානය යොමු කරන ලදී. එසේම විගණනය සඳහා කුරුණෑගල, හම්බන්තොට, මොණරාගල, අනුරාධපුර හා මඩකලපුව යන දිස්ත්‍රික්ක නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී.

රජයේ සියළු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත අනුව කළ යුතු වුවද, සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවා ගත් කමිටුවකින් සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගෙන තිබීම, 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සිදුකළ සමීක්ෂණයක් මත ඉවත් කිරීම සුදුසු යැයි හඳුනාගත් ප්‍රතිලාභී පවුල් 449,979ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම, 1995 වර්ෂයේ සිට වර්ෂ 28ක කාලය තුළ සවිබල ගැන්වූ පුද්ගලයන් සංඛ්‍යාව 62,943ක් පමණ වීම හා එය 2022 සැප්තැම්බර් මාසය වන විට සිටි ප්‍රතිලාභීන්ගෙන් සියයට 3.6ක් පමණක් වීම යන කරුණු සමෘද්ධි ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ සමෘද්ධිලාභීන්ට ගෙවීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි බැංකු 1090ක් වෙත රුපියල් මිලියන 35,184.4ක් ලබා දී තිබුණි. එසේම විගණන නියැදියට ඇතුළත් වූ දිස්ත්‍රික්කවල 2022 දෙසැම්බර් 28 දිනට සමෘද්ධිලාභීන් **643,641**කට රුපියල් මිලියන **10,320**ක් ගෙවීම් කර තිබුණි. නියැදියට අයත් වූ දිස්ත්‍රික්ක වල සමෘද්ධිලාභීන් දිස්ත්‍රික්කයේ වූ දුගීබවේ දර්ශකය අනුව විශ්ලේෂණයේ දී සැළකිය යුතු විචලනයක් පැවතීම, ගෙවීම් සඳහා මුදල් බැර කිරීමේ දී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට හා සමෘද්ධි බැංකුවෙන් සමෘද්ධිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර වීමේ ප්‍රමාදයන් පැවතීම, ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් සුදුසුකම් තිබුණද දීමනා නොලබන පුද්ගලයන් 244ක් සිටීම ද නිරීක්ෂණය විය.

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව ප්‍රතිලාභීන් 3,486,449ක් සමෘද්ධි බැංකු 1090ක් වෙත දීමනා ලබා ගැනීමට යොමුකර තිබුණි. දීමනා ගෙවීම සඳහා බැංකු තුල පරිගණක මෘදුකාංග ස්ථාපිත කර තිබුණ ද ඒවායේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය මොඩියුල් අවසන් කර නොතිබීම, බැංකු 66ක පරිගණක පද්ධතියක් මඟින් ගිණුම් කටයුතු සිදු නොවීම, බැංකු 199ක පරිගණක පද්ධතියක් හරහා පාස්පොත් මුද්‍රණය නොවීම, පරිගණක පද්ධතිය ඇති බැංකුද හස්ත ක්‍රමය (Manual) යටතේ ගණුදෙනු ලෙජර්වල සටහන් කිරීම හේතුවෙන් ප්‍රතිලාභීන් හා නිලධාරීන් දැඩි අපහසුතාවයන්ට පත් වී තිබීම ද නිරීක්ෂණය විය.

සමෘද්ධි බැංකුවල පුරප්පාඩු තනතුරුවල කාර්යයන් ඉටුකිරීම සඳහා අනෙකුත් කාර්යය මණ්ඩලය යෙදවීම, එක් නිලධාරියෙකුට සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 300ත් 700ත් අතර වීම, එම ප්‍රතිලාභීන්ට අමතරව වැඩිහිටි, වකුගඩු, ආබාධිත, ගැබිණි හා කිරි දෙන මව්වරු සඳහා ගිණුම් ආරම්භ කිරීමට සිදුව තිබීම, අවම කාර්යමණ්ඩලයක් සිටීම හේතුවෙන් බැංකුවේ ණය ලබාදීම් හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් ප්‍රමාදවීම, සමෘද්ධි ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම, නියැදියට අයත් වූ බොහෝ බැංකුවල කාර්යාල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, සමෘද්ධි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ තොරතුරු අනුව පරිගණක, ලිපිද්‍රව්‍ය, ඉන්ධන හා ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම, අඛණ්ඩ අන්තර්ජාල හා විදුලි පහසුකම් නොමැති වීමෙන් බැංකු කටයුතු කාර්යක්ෂමව සිදුකළ නොහැකි වීම, නව බැංකු ගිණුම් ආරම්භ කිරීමේ දී පාස් පොත් නොමැතිවීම, පාස් පොතේ ගණුදෙණු මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය උපකරණ නොමැතිවීම, ආරක්ෂක පහසුකම්, සනීපාරක්ෂක හා පානීය ජල පහසුකම්, දීමනාලාභීන් සඳහා අසුන්ගැනීමේ පහසුකම් නොමැති වීම, අදාළ ආයතන විසින් අවශ්‍ය ගොනු හා ලේඛන නිසි පරිදි පවත්වා ගෙන ගොස් නොතිබීම හා නුසුදුසු සහනාධාරලාභීන් හඳුනා ගැනීමේ නිසි ක්‍රමවේදයක් නොමැති වීම නිරීක්ෂණය විය.

අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයින් සඳහා මාස තුනක කාල පරිච්ඡේදයේ ගෙවීම් කිරීම පිළිබඳව සලකා බැලීමේ දී (වැඩිහිටි දීමනාව) වයස අවුරුදු 70ට වැඩි පුද්ගලයින් 490,000 කට ආසන්න ප්‍රමාණයකට රුපියල් මිලියන 5,474.7 ක් හා වයස අවුරුදු 100 සපිරූ පුද්ගලයන් 374 ත් 387 ත් අතර වූ ප්‍රමාණයකට රුපියල් මිලියන 7.1ක මුදලක් ගෙවා තිබීම, සත්‍ය වශයෙන් දීමනා ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඒ සඳහා සුදුසු යැයි හඳුනාගන්නා ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාවට වඩා අඩු අගයක් ගැනීම, අතිරේක දීමනා ඇස්තමේන්තු ද්විකරණය වීම් හා බැංකු ගිණුම් විවෘත නොකරන ලද ප්‍රතිලාභීන් සිටීම, අපේක්ෂිත මුදල් ප්‍රමාණයන්ට වඩා අඩුවෙන් ගෙවීම් කර තිබීම හේතුවෙන් පරීක්ෂාවට ලක් කළ සෑම බැංකුවකම පාහේ ගෙවීම් කාලයන් අවසානයේ සැලකියයුතු මුදල් ප්‍රමාණයක් රැඳී තිබීම යනාදිය නිරීක්ෂණය විය. තවද තැපැල් කාර්යාල 3995ක් මගින් ගෙවන ලද වැඩිහිටි දීමනා සමෘද්ධි බැංකු 1090ක් මගින් ගෙවීම හේතුවෙන් බැංකු තුළ තදබදයක් ඇති වීම හා බොහෝ වැඩිහිටියන් අපහසුතාවයන්ට

පත්ව තිබීම, සෑම මාසයකම 15 වන දින වනවිට වැඩිහිටි දීමනා ගෙවීම ආරම්භ කළයුතු වුවත් මසක පමණ කාල පමාවකින් පසු දීමනා ගෙවීම් කර තිබිම, සමෘද්ධි බැංකු වෙත යවන ලද මුදල් බැංකු විසින් විවිධ පදනම් යටතේ ගිණුම් තැබීම් සිදු කර තිබීම යනාදිය නිරීක්ෂණය කරන ලදී.

ආබාධ සහිත තැනැත්තන් හා වකුගඩු රෝගීන් සම්බන්ධයෙන් වූ කළ, පිළිවෙලින් රු. මිලියන 1,385.3 ක හා රුපියල් මිලියන724.4 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණි. දීමනා ගෙවීම් සමෘද්ධි බැංකු හරහා පමණක් ගෙවීමෙන් ප්‍රතිලාභීන් විශාල ප්‍රමාණයකට නව බැංකු ගිණුම් විවෘත කිරීමේ දී අපහසුතාවන් සිදු වී තිබීම, නිවැරදි උපදෙස් කාලීනව සන්නිවේදනයේ දුර්වලතාවයන් පැවතීම, බැංකු තුල පැවති භෞතික හා මානව සම්පත් හිඟතාවයන්, බැංකු මගින් හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් දීමනා ලබා ගත් ප්‍රතිලාභීන් සමෘද්ධි බැංකු වෙත යොමු කිරීම නිසා බැංකු තුල තදබදයක් ඇති වී තිබීම, වගකිව යුතු ආයතන විසින් නිවැරදි හා කාලීන දත්ත පවත්වාගෙන නොයැමෙන් දීමනා ගෙවීමට අවශ්‍ය තොරතුරු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් වරින් වර කැඳවීමට  සිදුවීම නිසා වැඩසටහනේ කාර්යක්ෂමතාවයට සෘණාත්මක බලපෑමක් ඇති වීම නිරීක්ෂණය කරන ලදී.

ගර්භණී සහ කිරි දෙන මව්වරුන් සම්බන්ධයෙන් වූ කළ රුපියල් මිලියන 1533.2 ක දීමනා ලබා දී තිබුණි. ආයතන අතර නිවැරදිව තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රමවේදයක් නොතිබීමෙන් ඇතැම් සමෘද්ධි බැංකු වෙත අතිරික්තව හා ඌනතාවයන් සහිතව මුදල් ලැබී තිබීම, ප්‍රමාණවත්ව මුදල් ලැබී නොතිබීමෙන් සුදුසුකම්ලත් අයදුම්කරුවන් 392 ක් සඳහා ගෙවීම් කිරීමට නොහැකිව තිබීම, නිලධාරීන්ගේ අතපසුවීම් හා  සමෘද්ධි බැංකු වෙනස් වීම මත ප්‍රතිපාදන  ප්‍රමාණවත්ව නොලැබීමෙන් ප්‍රතිලාභ නොලද ගර්භණී මව්වරුන් 299 ක් සිටීම, සමෘද්ධි බැංකු වෙත යැවූ මුදල් වලින් සියයට 43ක් බැංකු ගිණුම් තුල තිබී පසුව එම මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබීම, ගර්භණී හා කිරි දෙන මව්වරුන් ප්‍රතිලාභීන් ලෙස තෝරා ගැනීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් හඳුනා නොගැනීම හා මුදල් ගෙවීමට නියෝග ලබා දීමට මාස 6කට ආසන්න කාලයක් ගත කර තිබීම විගණනයේ දී නිරීක්ෂණය විය.

2022/2023 මහ කන්නයේ වී වගා කළ ගොවීන් සම්බන්ධයෙන් වූ කළ, හෙක්ටයාරයකට රුපියල් 20,000 ක් වන පරිදි  උපරිමය හෙක්ටයාර් 2 කට සීමා වන සේ  ගොවීන් 600,000 කට වාරික දෙකක දී **බිම් සකස්කිරීමට පෙර සහ පැළ සිටුවීමෙන් පසුව**  මූල්‍ය දීමනාවන් ගෙවිය යුතු වූ නමුත් හෙක්ටයාරයකට රුපියල් 10,000 ක් පමණක් වන සේ මූල්‍ය දීමනා ගෙවා තිබුණි. දීමනා ගෙවන අවස්ථාව වන විට මහ කන්නයේ බිම් සැකසීම හා පැළ සිටුවීම අවසන් වී තිබීම, ප්‍රතිලාභ අපේක්ෂිත කාල සීමාව තුල දී ලබාදීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබීම, සහනාධාර ලැබුණු හා නොලැබුණු ගොවීන් සංඛ්‍යාව පිළිබඳව

ප්‍රාදේශිය හා කෘ.ප.නි.ස. නිලධාරින් නිශ්චිතව දැන නොසිටීම, ප්‍රතිලාභ ගෙවීම සහ සැසඳුම් කටයුතු සඳහා මාස 07 කට අධික කාලයක් ගත කර 2023 ජූලි 31 දිනය වන විට ගොවීන් 1,039,961 සඳහා රුපියල් 7,424,062,928 ක් ගෙවා තිබුණ ද ගොවීන් 31,008 ගේ බැංකු ගිණුම් අක්‍රිය වීම හේතුවෙන් රුපියල් 181,109,892 ක දීමනා ගෙවීම් කිරීමට නොහැකි වී තිබීම නිරීක්ෂණය විය.

තවද Geo Goviya දත්ත පද්ධතිය තුල ගොවීන්ගේ ස්ත්‍රී /පුරුෂ භාවය පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබීම, මඩකලපුව දිස්ත්‍රික්කය හැර අනෙකුත් කිසිදු දිස්ත්‍රික්කයක ප්‍රතිලාභීන්ගේ කාන්තා නියෝජනය සියයට 45 ක් වී නොතිබීම, Web Server ඇතුළු භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් Geo Goviya පද්ධතිය මගින් ගොවීන්ට කාර්යක්ෂම සේවාවක් ලබා දීමට නොහැකි වී තිබීම, දත්ත පද්ධතිය හරහා ගොවිජන සේවා මධ්‍යස්ථානවල ප්‍රාදේශිය නිලධාරීන්ට දත්ත ඇතුලත් කිරීමට, අවශ්‍ය නිවැරදි කිරීම්වලට සහ නිවැරදිතාවය තහවුරු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම, ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අදාලව දීමනා ලැබුණු සහ නොලැබුණු ගොවීන් සංඛ්‍යාව වෙන්කර හඳුනාගැනීමට නොහැකිවීම යන තත්ත්වයන් නිරීක්ෂණය විය.

නිමවුම් (Output) ඇගයීමේ දී සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු රෝගීන් හා වී ගොවීන් සඳහා ගෙවීම් ඉහළ නිමවුම් මට්ටමක පැවතීම, ආබාධිත තැනැත්තන් හා ගැබිණි හා කිරි දෙන මව්වරුන්ගේ නිමවුම් අපේක්ෂිත මට්ටමට ආසන්නව නොතිබීම, තිරසර සංවර්ධන අරමුණු සමඟ ව්‍යාපෘති අරමුණු ගලපා ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණුවල ප්‍රගතිය පරීක්ෂාවේදී තිරසර සංවර්ධන සභාවේ දත්ත ද්වාරය තුළ අරමුණ 01 යටතේ ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනය, ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනය, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ආවරණය වන ජනගහනය, දිළිඳුභාවය අඩු කිරීම සඳහා සංවර්ධන ආධාර ලැබීම හා අරමුණු 02 යටතේ ආහාර සුරක්ෂිතතාව නොමැති ජනගහනයේ පරිමාණය පිලිබඳව යාවත්කාලීන වූ දත්ත හා අරමුණ 12 යටතේ තිරසර පාරිභෝජන සහ නිෂ්පාදන සඳහා ප්‍රතිපත්ති සම්පාදන හා ඒක පුද්ගල ආහාර අපතේ යෑම් හා පසු අස්වනු හානි දත්ත නොමැති බව නිරීක්ෂණය විය.

2002 අංක 24 දරන සුබ සාධක ප්‍රතිලාභ පනත අනුව 2022 ඔක්තෝබර් මස නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව සියළු සුබසාධක වැඩසටහන් සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්ගේ බලතල අනුව ක්‍රියාත්මක කිරීම, සමෘද්ධි බැංකු පරිගණක පද්ධතිය (CRM system) නවීකරණය මගින් කාර්යක්ෂම සේවයක් ලබා දීම, එසේම ඒ සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් අදාල ආයතන වෙත ලබා දීම, වාර්තාව තුල සාකච්ඡා කරන ලද ඉලක්කගත කණ්ඩායම් සඳහා ප්‍රතිලාභ ලබා දීමේ දී විශේෂ අවධානයකින් වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, Geo Goviya පරිගණක පද්ධතිය තුළ මිනුම් කළ භූමි ප්‍රමාණය ඇතුලත්


කිරීම හා ගොවීන්ගේ තොරතුරු අනුව අවශ්‍ය සංශෝධන කඩිනමින් සිදු කළ හැකි පරිදි පරිගණක පද්ධති වැඩි දියුණු කිරීම, ගොවි දිරිය බැංකු ගිණුම් සක්‍රීයව පවත්වා ගැනීමට රාජ්‍ය බැංකු සමඟ එකඟතාවයක් ඇති කර ගැනීම, හදිසි ප්‍රතිලාභ ගෙවීමේ දී ලිඛිත චක්‍රලේඛ උපදෙස් නව තාක්ෂණික ක්‍රම මගින් අදාළ නිලධාරීන් වෙත කාලීනව යොමු කිරීම හා අදාළ ක්‍රියාමාර්ග ගැනීම, රජයේ සියළු පරිගණක පද්ධතිවල ස්ත්‍රී පුරුෂ දත්ත වෙනම ලබා ගැනීමේ ක්‍රමවේද සකස් කිරීම, තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට දැනට පවතින අඩුපාඩු (Gaps) හඳුනාගෙන ඒ සඳහා අදාළ වගකිව යුතු ආයතන අවශ්‍ය කටයුතු සිදු කිරීම, රජයේ සුබ සාධක ගෙවීම් සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ කාලීනව, කාර්යක්ෂම ක්‍රමවේද හරහා අදාළ අරමුණු කරා ගමන් කර වීමට අදාළ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය මගින් ඉක්මනින් අවධානමට ලක්වන පුද්ගලයන්ගේ සුරක්ෂිතතාව ඇති කිරීම ඉහත නිරීක්ෂණයන් සඳහා නිර්දේශ ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

## 02. හැඳින්වීම

### 2.1 පසුබිම

### 2.1.1 ආහාර අනාරක්ෂිතභාවය හා ජීවනෝපායන් තර්ජනයට ලක්වීම

2022 වර්ෂයේ මැදභාගයේ සිට ශ්‍රී ලංකාව තුළ ඉන්ධන සහ මූලික ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාමත්, කෘෂිකාර්මික නිෂ්පාදනය සැලකිය යුතු මට්ටමකින් අඩුවීමත් තුලින් ජනගහණයෙන් කොටසකට ආහාර සඳහා වැය කල හැකි මිල දැරිය නොහැකි තත්ත්වයකට පත් වී තිබුණි. එසේම රට තුළ ආහාර හිඟයක් ඇති විය හැකි බවට රජය විසින් පුරෝකථනය කිරීමද සිදු කර තිබුණ අතර ජීවනෝපායන් අහිමි වීමේ තර්ජනද මතුව තිබුණි. මෙම තත්ත්වය තුළ රට පුරා දිස්ත්‍රික්ක 25 ක ඇස්තමේන්තුගත පුද්ගලයින් මිලියන 5.7 කට මානුෂීය ආධාර අවශ්‍ය බව හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතා රේඛාව පරීක්ෂා කිරීමේදී එය 2020 වසරේ සිට 2022 වසර දක්වා පහත පරිදි ක්‍රමානුකූලව ඉහළ ගොස් තිබුණි.




*දරිද්‍රතා රේඛාව*

*මූලාශ්‍රය: ව්‍යාපෘති පරිපාලන අත්පොත*
*(ව්‍යාපෘති අංක 56175-001 හා ණය ගිවිසුම 4205-SRI)*

### 2.1.2 ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය

2022 මැද භාගයේ සිට ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපායන් අඛණ්ඩව පිරිහෙමින් පැවති අතර, ඉන් පසු මාසවල තත්ත්වය වඩාත් අයහපත් විය. එබැවින්, රට තුළ පැවති ආහාර අනාරක්ෂිතතාව පිළිබඳ අර්බුදයකට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා රජය විසින් 2022 මැයි මාසයේදී දිළිඳු හා අවදානමට ලක් වූ පුද්ගලයන් සඳහා ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීම සහ

ඔවුන්ගේ ජීවනෝපායන් ආරක්ෂා කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) හදිසි ආධාර ඉල්ලා සිටින ලදී. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවෙන් එහි සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත්වලින් ඩොලර් මිලියන 200.00 ක ණයක් සහ ව්‍යාපෘතිය සඳහා Japan Fund for Prosperous, Resilient Asia and the Pacific අරමුදලෙන් ඩොලර් මිලියන 3 ක ප්‍රදානයක් ද ලබා දීමට 2022 අගෝස්තු 30 දින අනුමත කර තිබුණි. ණය සහ ප්‍රදාන ගිවිසුම් 2022 සැප්තැම්බර් 9 වන දින අත්සන් තබන ලද අතර එම ගිවිසුම් 2022 සැප්තැම්බර් 16 දින සිට බලාත්මක වේ. දිළිඳු සහ අවදානමට ලක්විය හැකි, විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමුන්ගේ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙන් අරමුණු කෙරේ. ව්‍යාපෘතිය පහත දක්වා ඇති නිමවුම් තුනෙන් සමන්විත වේ:

(i) දිළිඳු සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයන් සඳහා සෘජු මූල්‍ය ආධාර තාවකාලිකව ඉහළ නැංවීම සහ පුළුල් කිරීම;

(ii) දිළිඳු හා අවදානමට ලක්වූවන්ගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා වැඩිදියුණු කළ සහායක් ලබා දීම;

(iii) සමාජ ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.

නිමවුම 1: දිළිඳු සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයන් සඳහා සෘජු මූල්‍ය ආධාර තාවකාලිකව ඉහළ නංවා පුළුල් කිරීම.

සමෘද්ධි සහනාධාර වැඩසටහන ජ්‍යෝෂ්ඨ පුරවැසි දීමනාව, ආබාධිත ආධාර වැඩසටහන, සහ වකුගඩු රෝගීන් සඳහා ආධාර ඇතුළුව පවත්නා සමාජ ආධාර වැඩසටහන් තුළින් සීඝ්‍රයෙන් ඉහළ යන ආහාර මිල හිලව් කිරීම සඳහා අවම වශයෙන් මාස 03 ක් සඳහා දිළිඳු සහ අවදානමට ලක්වූවන් සඳහා සෘජු මූල්‍ය ආධාර ලබා දීමට අපේක්ෂා කර තිබුණි.

| **සහනාධාර කාණ්ඩය** | **පවතින සහනාධාරය (රු.)** | **අතිරේක සහනාධාරය (රු.)** | **පවත්නා ප්‍රතිලාභීන් සංඛ්‍යාව (මිලියන)** | **පොරොත්තු ලේඛනගත පවුල් (මිලියන)** |
|---|---|---|---|---|
| සාමාජිකයන් 4ක් හෝ ඊට වැඩි සාමාජිකයන් සංඛ්‍යාවක් සිටින පවුල් | 4,500 | 3,000 | 1.76 (පවුල්) | 0.73 (පවුල්) |
| සාමාජිකයන් තිදෙනෙකු සහිත පවුල් | 3,200 | 3,100 | | |
| සාමාජිකයන් 3කට වඩා අඩු පවුල් | 1,900 | 3,100 | | |
| ජ්‍යෝෂ්ඨ පුරවැසි දීමනාව | | | | |
| - අවුරුදු 70 ට වැඩි | 2,000 | 3,000 | 0.42 | 0.24 |
| - අවුරුදු 100 ට වැඩි | 5,000 | 2,500 | | |
| ආබාධිත ආධාර | 5,000 | 2,500 | 0.11 | 0.07 |
| වකුගඩු රෝගීන් සඳහා ආධාර | 5,000 | 2,500 | | |
| ගැබිණි මව්වරුන් | 5,000 | - | 0.3 | |

*සමෘද්ධි, ජේෂ්ඨ පුරුවැසි, ආබාධිත, වකුගඩු රෝගීන් සඳහා වන පොරොත්තු දීමනාව - 5000

**නිමවුම 2: දිළිඳු හා අවදානමට ලක්විය හැකි පුද්ගලයන්ගේ ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වැඩිදියුණු කළ සහායක් ලබා දීම.** ජීවනෝපායන් යථා තත්ත්වයට පත් කිරීම සහ හැකියාව සහ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා දිළිඳු හා අවදානමට ලක්විය හැකි, විශේෂයෙන් ගොවීන් සහ අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ආධාර, පුහුණුව, තාක්‍ෂණික සහ දැනුමැති සහාය, උපදේශනය සහ පුහුණු කිරීම්වල සංයෝජනයක් හරහා ව්‍යාපෘතිය මගින් වැඩිදියුණු කළ සහායක් ලබා දෙනු ඇත.

| සහනාධාර කාණ්ඩය | සහනාධාරය (රු.) | ඇස්තමේන්තුගත ප්‍රතිලාභීන් |
|---|---|---|
| උපරිම හෙක්ටයාර් 2ක් | හෙක්ටයාරයකට 20,000 (වාරික 2) | 600,000 |
| අඩු ආදායම්ලාභී පවුල් | 100,000 | පවුල් 7,500 |

*මූලාශ්‍රය - ව්‍යාපෘති පරිපාලන අත්පොත*

*(ව්‍යාපෘති අංක 56175-001 හා ණය ගිවිසුම 4205-SRI)*

**නිමවුම 3: සමාජ ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.** ව්‍යාපෘතිය එහි අපේක්ෂිත ප්‍රතිලාභීන් වෙත ළඟා වන බව සහතික කිරීම සහ සමාජ ආරක්ෂණ පද්ධතිවල අනාගත හදිසි අවස්ථා සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම, ව්‍යාපෘතිය මගින් මුදල් ලබා දෙන ප්‍රතිලාභීන් තෝරා ගැනීම, සත්‍යාපනය, අධීක්ෂණය සහ සන්නිවේදනය සහ සමෘද්ධි වැඩසටහන සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (DAD) සඳහා පවතින තොරතුරු තාක්ෂණ පද්ධති සහ ඩිජිටල් මෙවලම් නවීකරණය කිරීම මගින් මුදල් හුවමාරු ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණවල කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩි කිරීම මෙම නිමවුම මගින් සිදු කරයි. එසේම නවීකරණය කරන ලද තොරතුරු තාක්ෂණ පද්ධති සහ ඩිජිටල් මෙවලම් සඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා ජාතික, ප්‍රාදේශීය සහ ක්ෂේත්‍ර මට්ටමේ කාර්යාලවල නිලධාරීන්ගේ ධාරිතාව ගොඩ නැංවීම සිදුකරනු ලබයි.

### 2.1.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණ විධිවිධාන


ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය මුදල් අමාත්‍යාංශය වන අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වේ.

සම්බන්ධිත ආයතන සම්බන්ධීකරණය කිරීම සඳහා ලෝක බැංකුව විසින් සක්‍රීය කරන ලද අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර සංරචකය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් 2022 මැයි මාසයේදී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව තුළ සම්බන්ධීකරණ ඒකකයක් ස්ථාපනය කරන ලදී. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය

යටතේ, එම සම්බන්ධීකරණ ඒකකය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ කළමනාකරණය සඳහා සමස්ත මග පෙන්වීම සහ සහාය සැපයීම සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය ලෙස ද ක්‍රියා කරයි.

අදාළ වන රජයේ නීති සහ රෙගුලාසි මෙන්ම ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ අනුගමනය කරමින් කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු සහ ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල දෛනික කළමනාකරණය සඳහා වගකිව යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය මගින් පිහිටුවා තිබේ. එසේම කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල දෛනික කළමනාකරණය සඳහා වගකිව යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පිහිටුවා තිබේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සමස්ත ක්‍රියාවලිය පහත දක්වා ඇති පරිදි වේ.




DSD - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, NSEC - පූර්ව ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය,
NSE - ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය, NSPD - ආබාධිත පුද්ගලයින් සඳහා වන මහ ලේකම් කාර්යාලය,
DPCS - පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, WB - කාන්තා කාර්යාංශය,
DAD -ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, DOA - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මූලාශ්‍රය: ව්‍යාපෘති පරිපාලන අත්පොත

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර ඇති පිරිවැය ඩොලර් මිලියන 203.36ක් වේ. ව්‍යාපෘති ආයෝජන වියදම්වලට හදිසි මුදල් ආධාර, දත්ත රැස් කිරීම සහ අධීක්ෂණය සහ ඇගයීම, පුහුණුව, තොරතුරු තාක්ෂණ නිෂ්පාදන සහ සේවා, තොරතුරු තාක්ෂණ උපකරණ, උපදේශන සේවා සහ ව්‍යාපෘති කළමනාකරණය ඇතුළත් වේ. භෞතික සහ මිල අවිනිශ්චිතතා එකතුව ඩොලර් මිලියන 1.61 කි. 2023 සැප්තැම්බර් 09 දින අත්සන් තබන ලද හා 2023 සැප්තැම්බර් 16 දින සිට බලාත්මක වන ව්‍යාපෘතිය 2024 පෙබරවාරි 29 දින වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි.

## 2.2 විගණන අරමුණ හා නිර්ණායක

### 2.2.1 විගණන අරමුණ

මෙම විගණනයේ අරමුණ වන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කරන ලද ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගයීම වේ.

### 2.2.2 විගණන නිර්ණායක

| උප විගණන ප්‍රශ්න | විගණන නිර්ණායක | මූලාශ්‍රය |
|---|---|---|
| 1. රජයේ සුබසාධන ආධාර වැඩසටහනේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, පද්ධති සහ භාවිතයන් එකිනෙකට අනුකූල වී තිබේද? | 1.1 ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ණය ගිවිසුමේ අදාල කොන්දේසි | අංක 4025 දරන ණය ගිවිසුම |
| | 1.2 ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි අවශ්‍යතා | ව්‍යාපෘති පරිපාලන අත්පොත |
| | 1.3 2013 අංක 1 දරන සමෘද්ධි පනතේ අවශ්‍යතා | 2013 අංක 1 දරන සමෘද්ධි පනත |
| | 1.4.2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ අවශ්‍යතා | 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත |
| | 1.5 1996 අංක 28 දරන ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ අවශ්‍යතා | 1996 අංක 28 දරන ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත |
| | 1.6 වකුගඩු රෝගීන් සඳහා මාසික ජීවන ආධාර ලබා දීම. | සමාජසේවා අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2015 |

| | | |
|---|---|---|
| | 1.7 2002 අංක 24 දරන සුබසාධන ප්‍රතිලාභ පනතේ අවශ්‍යතා | 2002 අංක 24 දරන සුබසාධන ප්‍රතිලාභ පනත |
| | 1.8 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ අවශ්‍යතා | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත |
| | 1.9 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ අවශ්‍යතා | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත |
| | 1.10 රජයේ ආයතන විසින් නිකුත් කරන ලද අදාළ චක්‍රලේඛ අවශ්‍යතා | |
| 2.1ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සැලසුම් කර ඇති පරිදි නිමැවුම් 1 සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාකාරකම් සිදු කර තිබේද? | විස්තරාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව ක්‍රියාකාරකම් | ව්‍යාපෘති පරිපාලන අත්පොත |
| 2.2 ප්‍රතිලාභීන් තෝරා ගැනීම, මුදල් ගෙවීම් හා වැඩසටහනේ සාධාරණත්වය සහ කාලෝචිත බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් විනිවිදභාවයක් සහ වගකිව යුතු බවක් තිබේද? | 2.2.1 අඩු ආදායම්ලාභී සමෘද්ධි, වැඩිහිටි ජ්‍යෙෂ්ඨ පුරවැසි, වකුගඩු රෝග වලින් පෙලෙන පුද්ගලයින් සහ ආබාධිත පුද්ගලයින් වැඩසටහන සඳහා තෝරාගෙන තිබීම. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 15 උප වගන්තිය |
| | 2.2.2 ගර්භයට මාස 3ක් වූ ගර්භනී මවක් වීම හෝ මාස 1-4 අතර දරුවකු සිටින කිරිදෙන මවක් පෝෂණ වැඩසටහන සඳහා තෝරා ගෙන තිබීම. | කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ 2022 ඔක්තෝබර් 14 දිනැති හා 06/2022 චක්‍රලේඛය |
| | 2.2.3 අදාළ මාසයේ මුදල් ලැබී දින 03ක් ඇතුලත සමෘද්ධි මුදල් ප්‍රතිලාභී ගිණුම්වලට බැර කළ යුතු වීම. | 2017 මාර්තු 31 දිනැති හා අංක 08/2017 දරන සමෘද්ධි දෙපාර්තමේන්තු ගිණුම් චක්‍රලේඛය |
| | 2.2.4 තෝරාගත් වැඩිහිටි පුද්ගලයින් සඳහා නියමිත මාසයන්හි 15 දින වන විට අදාළ දීමනා ගෙවීම් කටයුතු ආරම්භකර තිබීම. | සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය ලේකම්ගේ 2018 ඔක්තෝබර් 15 දිනැති හා අංක NSE/DEV/03/04 දරන චක්‍රලේඛය |

| | | |
|---|---|---|
| | 2.2.5 වකුගඩු රෝගවලින් පෙළෙන සහ ආබාධ වලින් පෙළෙන තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා නියමිත පරිදි දීමනා ගෙවා තිබීම. | 2015 අප්‍රේල් 27 දිනැති හා අංක 01/03/2015/NSPD දරන ආබාධිත මහලේකම් කාර්යාලයේ චක්‍රලේඛය |
| | 2.2.6 ගර්භනී හා කිරිදෙන මව්වරුන් සඳහා රු. 10,000ක මුදලක් ගෙවා තිබීම. | කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ 2022 ඔක්තෝබර් 14 දිනැති හා 06/2022 චක්‍රලේඛය |
| 3.1ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සැලසුම් කර ඇති පරිදි නිමැවුම් 2 සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාකාරකම් සිදු කර තිබේද? | 3.1.1විස්තරාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව ක්‍රියාකාරකම් | ව්‍යාපෘති පරිපාලන අත්පොත |
| 3.2 නිමවුම 2 සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම, මුදල් ගෙවීම් හා වැඩසටහනේ සාධාරණත්වය සහ කාලෝචිත බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් විනිවිදභාවයක් සහ වගකිව යුතු බවක් තිබේද? | 3.2.1 2022/2023 මහ කන්නයේ වී වගාකල ගොවීන් තෝරාගෙන තිබීම.<br>3.2.2 තෝරාගත් ගොවීන් හට වාරික දෙකකදී බිම සකස් කිරීමට පෙර සහ පැළ සිටුවීමෙන් පසු හෙක්ටයාරයකට රු. 20,000 වන සේ (උපරිම හෙක්ටයාර් දෙකක් දක්වා) ගෙවීම් සිදුකර තිබීම. | ව්‍යාපෘති පරිපාලන අත්පොතේ 16 උප වගන්තිය |
| | 3.2.3 සෑම ගොවිජන සංවර්ධන සභාවක් විසින්ම ස්වකීය බලප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම් මැනීමට සැලැස්විය යුතු වීම. | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 55 වගන්තිය |
| | 3.2.4ඉලෙක්ටේරානික ලේඛණ සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ආකාරයෙන් සුභසාධන ප්‍රතිලාභින් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතු වීම. | 2002 අංක 24 දරණ සුභසාධන ප්‍රතිලාභ පනතේ 27 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග |
| | 3.2.5 ස්ත්‍රී/පුරුෂ සමානාත්මතාවය (ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂිත 600,000ක් වූ ගොවීන්ගෙන් සියයට 45ක් කාන්තාවන් වීම.) | ව්‍යාපෘති පරිපාලන අත්පොත |

| | | |
|---|---|---|
| 4. අදාළ ක්‍රියාකාරකම් තුළින් ව්‍යාපෘති අරමුණු ළඟා වී තිබේද? | 4.1 ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම සහ අපේක්ෂිත නියාමන කාර්යයන් නියමිත පරිදි සිදුකර තිබීම. | |
| | 4.2 ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි ix පරිදි කාර්යසාධන දර්ශක.<br>• ආහාර අනාරක්ෂිතතාවය සියයට 30කින් අඩු කිරීම<br>• මහ කන්නය (2022 සැප්තැම්බර් - 2023 මාර්තු) ඉහළ එලදාව සහිත කලාපවල ඉඩම් සියයට 80ක් වගා කිරීම<br>• 2020 – 2021 වර්ෂවල මහ කන්නයේ ලැබූ වී අස්වැන්නෙන් අවම වශයෙන් සියයට 75ක අස්වැන්නක් ලබා ගැනීම<br>• අඩු ආදායම්ලාභී පවුල්වල ප්‍රතිලාභීන් මිලියන 1.76ක් හා පොරොත්තු ලේඛනගත මිලියන 0.73ක් සඳහා මුදල් ආධාර ලබා දී තිබීම<br>• අඩු ආදායම්ලාභී වැඩිහිටියන් (අවු 70ට වැඩි හා අවුරුදු 100 සම්පූර්ණ කළ) මිලියන 0.42 හා පොරොත්තු ලේඛනගත මිලියන 0.24ක් සඳහා මුදල් ආධාර දීම<br>• අඩු අදායම්ලාභී ආබාධිත තැනැත්තන් 71,000 ක් හා පොරොත්තු ලේඛනගත 61,000ක් සඳහා මුදල් ආධාර දීම<br>• අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් 38,000ක් හා පොරොත්තු ලේඛනගත 5,000කට ආධාර ගෙවීම.<br>• ගර්භනී හා කිරිදෙන මව්වරුන් 300,000 කට මුදල් ආධාර ලබාදීම<br>• අවම වශයෙන් වී ගොවීන් 600,000කට මහ කන්නය (2022 සැප්තැම්බර් 2023 මාර්තු) සඳහා වගා කළ ප්‍රමාණයට මුදල් ආධාර ලබාදීම | ව්‍යාපෘති පරිපාලන අත්පොත |
| | 4.4.2. 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ අවශ්‍යතා | 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත |

### 2.3 විගණන විෂය පථය හා විෂය පථය සීමා වීම්

#### 2.3.1 විගණන විෂය පථය

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර වැඩසටහන යටතේ මූල්‍ය දීමනා ලබා ගැනීම සඳහා 2022 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අඩු ආදායම්ලාභී පවුල් සහ පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්, ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ වැඩිහිටි දීමනාව සඳහා සුදුසුකම් ලබා සිටින සහ පොරොත්තු ලේඛනගත කර සිටින වයස අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන් හා වයස අවුරුදු 100 ඉක්ම වූ වැඩිහිටියන්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී සිටින ආබාධිත හා පොරොත්තු ලේඛනගත කර ඇති පුද්ගලයන්, වකුගඩු දීමනා ලබා ගන්නා සහ පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සහ දීමනා සඳහා හිමිකම් ලැබූ ගර්භණී හා කිරි දෙන මව්වරුන් හා 2022/2023 මහ කන්නයේ වී වගාකළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ගොවීන් මෙමඟින් ආවරණය කෙරේ. තවද මෙම විගණනය සඳහා කුරුණෑගල, හම්බන්තොට, අනුරාධපුර, මොණරාගල සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක තෝරාගන්නා ලදී. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) විසින් සකස් කරන ලද දරිද්‍රතා රේඛා දර්ශකයට අනුව ඉහත දිස්ත්‍රික්කවල දිළිඳු හා අවදානමට ලක්විය හැකි පුද්ගලයින් වැඩි පිරිසක් සිටීම හා වැඩිම කුඹුරු ඉඩම් ප්‍රමාණයක් පවතින එම දිස්ත්‍රික්ක ඒ සඳහා පාදක වේ.

#### 2.3.2 විෂය පථය සීමා වීම

ඉහත ව්‍යාපෘතිය යටතේ ආවරණය වූ වී ගොවීන්, සමෘද්ධිලාභීන්, ආබාධිත හා වැඩිහිටි පුද්ගලයන්, වකුගඩු රෝගීන්, ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා මුදල් ආධාර ලබාදීම පිළිබඳ පරීක්ෂා කිරීමේදී පවතින සීමිත කාර්ය මණ්ඩලයක් හා භෞතික සම්පත් හේතුවෙන් භෞතික පරීක්ෂා කිරීම් සීමාකිරීමට සිදුවිය.

### 2.4 විගණන ප්‍රවේශය

ISSAI 3000/40 හි දක්වා ඇති පරිදි, මෙහි භාවිතා කර ඇති ප්‍රවේශය ප්‍රතිඵල සහ පද්ධති ප්‍රවේශයේ සංයෝජනයකි. මෙම විගණනය මගින් ප්‍රතිඵල ප්‍රවේශයට අනුව ව්‍යාපෘතියේ නිමැවුම් හා අරමුණු සාක්ෂාත් කර ගෙන තිබේද යන්නත් පද්ධති ප්‍රවේශය යටතේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී කළමනාකරණ හා තොරතුරු පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව පරීක්ෂා කරන ලදී.

## 2.5 විගණන ක්‍රමවේද

මෙම විගණනය සඳහා පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරන ලදි.

(අ) මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ මහා භාණ්ඩාගාරයේ සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීම, ප්‍රශ්නාවලි මගින් තොරතුරු ලබා ගැනීම හා මූලා වාර්තා විශ්ලේෂණය කිරීම.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද පරිපාලන අත්පොතෙහි සඳහන් කොන්දේසි හා නිර්ණායක වලට අනුගත වීම සහ අණපනත්, මාර්ගෝපදේශන හා චක්‍රලේඛ, උපදෙස් ලිපි යනාදියට අනුගත වීම පරීක්ෂා කිරීම.

(ඇ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලවල, ගොවිජන සේවා මධ්‍යස්ථානවල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය නිලධාරීන්, කෘ.ප.නි.ස නිලධාරීන් මගින් දත්ත ලබා ගැනීම.

(ඈ) ව්‍යාපෘතියට අදාල මෙහෙයුම් දත්ත පද්ධතිය වන Geogoviya දත්ත පද්ධතිය භාරව කටයුතු කරනු ලබන ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, නිලධාරීන් සමග සාකච්ඡා කිරීම සහ Geogoviya දත්ත පද්ධතිය මගින් දත්ත ලබාගැනීම.

(ඉ) ගොවි සංවිධාන නියෝජිතයන් සහ 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන් සමග රැස්වීම් පැවැත්වීම, සාකච්ඡා කිරීම සහ තොරතුරු කැඳවීම.

(ඊ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් තොරතුරු ලබාගැනීම.

## 2.6 විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ මෙම විශේෂ විගණනය සිදු කරන ලදී.

## 2.7 දත්ත භාවිතයන් සඳහා සීමාවන්

(අ) සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු හා ආබාධිත, ගර්භණී සහ කිරි දෙන මව්වරු සහ 2022 මහ කන්නයේ වී වගා කළ ගොවීන් යන ප්‍රතිලාභී කාණ්ඩයන් අදාළ ආයතන විසින් තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් වන අතර සියලුම ප්‍රතිලාභීන් නිවැරදි පදනම් මත තෝරා ගත් ප්‍රතිලාභීන් ද යන්න සෘජුව සනාථ කර ගත නොහැකි වීම.

(ආ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ CRM දත්ත පද්ධතිය තුළ ඇතැම් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ උපන්දින, හැඳුනුම්පත් අංක වැනි අවශ්‍ය තොරතුරු නොපැවතීම.

(ඇ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳව තොරතුරු ලබාගැනීම සඳහා අදාළ දත්ත පද්ධතියට පිවිසීමේ පහසුකම විගණකවරුන්ට ලබා දී තිබුණද කිසියම් නිශ්චිත දිනකට ගොවීන් විසින් වගාකරන ලද ඉඩම් ප්‍රමාණයන්, ලබාදෙන ලද මූල්‍ය දීමනා ප්‍රමාණය, දීමනා ගෙවීම් ප්‍රතික්ෂේප වූ ප්‍රමාණයන් හා ප්‍රතික්ෂේප වූ මුදල ආදී තොරතුරු විගණකවරුන්ට සෘජුවම ලබාගත නොහැකිවීම.

## 03. විස්තරාත්මක විගණන නිරීක්ෂණ

### 3.1. සමෘද්ධි දීමනා ලබා දීම

ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන ආහාර සුරක්ෂිතතාවය හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2022 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා සමෘද්ධිලාභීන්ට (පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් ද ඇතුළත්ව) ගෙවීම සඳහා සමෘද්ධි ප්‍රජාමුල බැංකු 1090ක් වෙත රුපියල් 35,184,484,440ක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවට ලක්කළ නියැදියට ඇතුළත් වූ කුරුණෑගල, හම්බන්තොට, අනුරාධපුර, මොණරාගල හා මඩකලපුව යන දිස්ත්‍රික්කවල සමෘද්ධිලාභීන් 640,000කට පමණ රුපියල් 10,320,855,050 ක් 2022 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා වූ මාස 03ක කාලපරිච්ඡේදය සඳහා ගෙවා තිබුණි.

ඉහත දිස්ත්‍රික්ක 05හි විගණනය විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක්කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09ක සමෘද්ධිලාභීන් 67,000කට පමණ ප්‍රතිලාභ ගෙවීම සඳහා සමෘද්ධී සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රුපියල් 1,171,249,200ක මුදලක් සමෘද්ධි කලාප 27කට යවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

#### 3.1.1 සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගැනීම

ශ්‍රී ලංකාව නිදහස ලබාගැනීමෙන් පසුව ගත වූ දශක ගණනාවක් තිස්සේ ජනතාව වෙත විවිධ සහනාධාර ලබාදී ඇත. දිළිඳුබව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය ලෙස 1995 අංක 30 දරන පාර්ලිමේන්තු පනත මගින් ආරම්භ කර පසුව 2013 අංක 01 දරන දිවි නැගුම පනත යටතේ දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම හා 2017 අංක 02 දරන දිවිනැගුම (සංශෝධන) පනත යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332ක ග්‍රාම නිලධාරී වසම් 14,022ක් ආවරණය වන පරිදි සමෘද්ධි බැංකු 1090 පිහිටුවා ඇත. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව මිලියන 2.49කි. දිළිඳුබව තුරන් කරමින් ජීවනෝපාය, ආර්ථික කටයුතු තුළින් සවිබල ගැන්වූ ප්‍රජාවක් යන දැක්ම අනුව වසර 28ක් තිස්සේ රජය විසින් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

අඩු ආදායම්ලාභී පවුල් සමීක්ෂණය පදනම් කරගෙන විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුව සමෘද්ධි සහනාධාරලාභීන් තෝරා ගැනීම 2017 ජුනි 23 දිනැති අංක SDD/HO/FT/BIMS දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙහි අධ්‍යාපනය, සෞඛ්‍ය, ආර්ථික තත්ත්වය, වත්කම්, නිවාස, පවුලේ සෞඛ්‍ය තත්ත්වය යන අංශ 06 යටතේ අනු නිර්ණායක 29ක් මගින් ඇගයීම් කර දුප්පත්කමින් වැඩි පවුල් හඳුනාගෙන තිබුණි. එමෙන්ම 2002 අංක 24

දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(1) ප්‍රකාරව නියමිත නිර්නායක අනුව යම් පුද්ගලයෙකු සුබසාධක ප්‍රතිලාභ ගෙවීමට සුදුසු තැනැත්තෙකු බවට තහවුරු වූ විට මාස 12ක මූලික කාලසීමාවක් සඳහා සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසු තැනැත්තෙකු ලෙස සලකණු ලැබිය යුතු අතර ඒ බව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කොමසාරිස්වරයා විසින් ඔහුට දැනුම්දිය යුතු වේ. එම මූලික කාලසීමාව අවසානයේදී ඒ තැනැත්තාට සුදුසුකම් ඇතිනම්, මේ පනතේ නියම අනුව සුබසාධක යෝජනා ක්‍රමයට ඇතුළු වීම සඳහා ඉල්ලුම් කිරීමට ඔහු සුදුස්සෙකු වේ. එසේම තවදුරටත් එවැනි යම් තැනැත්තෙකු එම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට ඉදිරියටත් සුදුසු නොවන බවට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා වෙත දැනුම්දිය යුතුය. ඒ අනුව එම පනතේ 7(2) උප වගන්තිය ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසු තැනැත්තෙකු ලෙස සළකා යම් මහජනාධාර යෝජනා ක්‍රමයක් යටතේ හෝ දරිද්‍රතාවය තුරන් කිරීම පිණිස අරමුණු කරගත් හෝ වෙනත් යම් කාර්යයන් සඳහා තත් කාලයෙහි බලාත්මකව පවතින යම් නීතිමය විධිවිධාන ප්‍රකාරව ඒ තැනැත්තාට කරනු ලබන සියලු ගෙවීම් හෝ ඔහු විසින් ලබාගන්නා සියලු ගෙවීම් හෝ ඔහු විසින් ලබා ගන්නා සියලු ප්‍රතිලාභ වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් විය යුතුය. මෙලෙස සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් ලබන පවුලක් තෝරා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් ලබන පවුල් තෝරා ගැනීම 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතට අනුකූල වීම.


සියලු සුබසාධක සහනාධාර ප්‍රතිලාභ ගෙවීම සඳහා අවශ්‍ය නෛතික සාධක ව්‍යුහය සැලැස්වීම සඳහා වූ 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත අනුව ක්‍රියා කළ යුතු අතර එහි 7(1) උපවගන්තිය ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ප්‍රකාශිත පුද්ගලයන් විසින් පමණක් යම් සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකට ඉල්ලුම් කළ යුතු විය. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2016 පෙබරවාරි 15 වැනිදා සිට ක්‍රියාත්මක වුවද සුබසාධක ප්‍රතිලාභ ගෙවීමට සුදුසු තැනැත්තන් හඳුනාගෙන නොතිබුණු බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවා ගත් කමිටුවකින් සමෘද්ධි සහනාධාරලාභීන් තෝරා ගෙන තිබුණි. වර්තමානයේ සුබ සාධක ප්‍රතිලාභ පනත ප්‍රකාරව නිකුත් කළ 2022 අංක 20 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් පරිදි 2023 වර්ෂයේ සිට අස්වැසුම නමින් අඩු ආදායම් පවුල් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණි.

(ආ) වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම හේතුවෙන් සමෘද්ධි සාමාජිකත්වය අහෝසි කිරීම

2022 දෙසැම්බර් 01 දින සිට 2023 මාර්තු 31දක්වා කාලපරිච්ඡේදය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 22 දෙනෙකු ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 12 දෙනෙකු ද වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම නිසා සමෘද්ධි සාමාජිකත්වය අහෝසි කර තිබුණි. මෙම පුද්ගලයන් දිගු කාලයක සිට සමෘද්ධි සහනාධාර ලබමින් සිට ඇතිබව නිරීක්ෂණය විය.

(ඇ) 2017 ජුනි 23 දිනැති අංක SDD/HO/FT/BIMS දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙහි නිර්ණායක පරිදි 2016-2017 වර්ෂවල සිදුකරන ලද අඩු ආදායම්ලාභී පවුල් හඳුනාගැනීමේ සමීක්ෂණයේ දී එතෙක් ප්‍රතිලාභීන් ලෙස සහනාධාර ලැබූ 1,372,694ගෙන් 922,715ක් පමණක් අඩු ආදායම්ලාභී පවුල් ලෙස හඳුනාගෙන තිබුණි. එමෙන්ම එහිදී නව සහනාධාර ඉල්ලුම්කරුවන් වූ 2,235,573න් අඩු ආදායම් පුද්ගලයින් ලෙස හඳුනා ගැනුනේ 450,959ක් පමණි.

(ඇ) විගණන නියැදියට අයත් වූ දිස්ත්‍රික්ක වල සමෘද්ධිලාභීන් දිස්ත්‍රික්කයන්හි වූ දුගීබව දර්ශකය අනුව විශ්ලේශණය කිරීමේ දී ඒ අතර සැළකිය යුතු විචලනයක් පහත පරිදි නිරීක්ෂණය විය.



**3.1.2 සමෘද්ධි ප්‍රජා මූල බැංකු විසින් සහනාධාර අදාළ සහනාධාරලාභීන්ට කාර්යක්ෂමව හා ඵලදායීව ලබාදීම.**

හදිසි ආධාර ව්‍යාපෘතිය මගින් සහනාධාරලාභීන් වෙත නිවැරදිව සහ නියමිත වේලාවට මුදල් ලබාදීමට සැලැස්වීම අපේක්ෂා කර තිබුණි. එසේ වුවද සහනාධාරලාභීන්ගේ ගිණුම්වලට මුදල් සැලසුම් කළ පරිදි බැර වී නොතිබුණි. ඒ සම්බන්ධ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට මුදල් බැරවීමේ ප්‍රමාදය දින 30ක් පමණ විය. මෙම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රතිලාභීන්ට අදාළ මාසය තුළම සහනාධාර ලැබී නොමැති වීමෙන් ප්‍රතිලාභීන්ට හා සමෘද්ධි බැංකුවල නිලධාරීන්ට විවිධ අපහසුතාවන්ට ලක්වීමට සිදු වූ බවට ඔවුන්ගෙන් ලද තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ආ) සමෘද්ධි ක්ෂේත්‍ර නිලධාරීන් විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු ප්‍රකාරව සහනාධාර මුදල් ලැබීමට සුදුසුකම් තිබුණද ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ග්‍රාම නිලධාරී වසම් 11ක සහනාධාර නොලබන පුද්ගලයන් 244ක් වූ අතර ඔවුනට මාසික සහනාධාරය ලෙස ගෙවිය යුතු මුලු මුදල රුපියල් 1,627,300 ක් වන බව නිරීක්ෂණය විය.

(ඇ) සමෘද්ධි ප්‍රජා මූල බැංකු වෙත අක්මුදල් නිදහස් කිරීම

අංක 08/2017 දරන ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රදේශීය ලේකම් විසින් සමෘද්ධි ප්‍රතිලාභී නාමලේඛනය පිටපත් 02කින් සකස් කර එහි එක් පිටපතක් සමෘද්ධි බැංකු වෙත සෑම මසකම පළමු සතිය තුල යැවිය යුතු අතර අනෙක් පිටපත දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යැවිය යුතු අතර ප්‍රතිලාභී ගිණුම් වෙත මුදල් බැර කළ යුත්තේ ප්‍රාදේශීය ලේකම් විසින් මාසිකව යාවත්කාලීන කරනු ලබන නාමලේඛනය පමණක් පදනම් කරගෙනය. එමෙන්ම ප්‍රතිලාභ ගෙවීම සඳහා අවශ්‍ය මුදල් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල විසින් සමෘද්ධි බැංකු මට්ටමින් ලබා දෙන මාසික උපරිම වාර්තා පදනම් කරගනිමින් ප්‍රධාන කාර්යාලය විසින් සමෘද්ධි බැංකුවේ නිල ජංගම ගිණුම වෙත ප්‍රේෂණය කරනු ලැබේ. එසේ වුවද ප්‍රධාන කාර්යාලය විසින් සමෘද්ධි බැංකුවේ නිල ජංගම ගිණුම වෙත ප්‍රේෂණය කරනු ලැබූ සහනාධාර මුදලට අදාළවන ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා සමෘද්ධි බැංකුව විසින් සහනාධාර ගෙවනු ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව නොසැසඳෙන බව ඉබ්බාගමුවල තණමල්විල, හම්බෙගමුව, කතරගම, ඉරුදයපුරම් නැගෙනහිර, කරවෙට්ටි හා ඉරුදයපුරම් නැගෙනහිර යන සමෘද්ධි බැංකුවල නිරීක්ෂණය විය.

### 3.1.3 සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් වෙත කාර්යක්ෂමව ලබාදීම සඳහා අවශ්‍ය මානව සම්පත් පැවතීම

සමෘද්ධි සහනාධාර නියමිත වේලාවට අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදීම සඳහා සමෘද්ධි බැංකුවල භෞතික මෙන්ම මානව සම්පත් නිසි පරිදි තිබිය යුතුය. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සමෘද්ධි සහනාධාර ලබා ගැනීමට සුදුසුකම් ලබන ප්‍රතිලාභීන් හඳුනාගැනීමට ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් සිටිය යුතු වේ. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමෘද්ධි බැංකුවල පවත්නා මානව සම්පත්

(i) බැංකු කාර්යමණ්ඩලය අනුමත කාර්යමණ්ඩලයට අනුකූලවීම

විගණන නියැදියට ඇතුළත් වූ සමෘද්ධි බැංකු 07හි මානව සම්පත්වල පුරප්පාඩු නිරීක්ෂණය විය. මෙහිදී සමෘද්ධි බැංකුව සඳහාම නොවන නිලධාරින් යොදවා තිබුණු අතර පුරප්පාඩු පවතින තනතුරුවල ඉටුකළ යුතු කාර්යයන් ඉටුකිරීම සඳහා බැංකුවේ අනෙක් කාර්යය මණ්ඩලය යෙදවීමට සිදු වී තිබුණි. එමෙන්ම කඳුලව බැංකුවේ පුරප්පාඩුව පවතින මුදල් අයකැමිගේ තනතුර ගිණුම් ලිපිකරු විසින් සිදුකරන බවත් නිරීක්ෂණය වූ අතර එමඟින් වැඩ බෙදීමක් සිදු නොවන බව හා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ දුර්වලතාවන් පවතින බව නිරීක්ෂණය විය.

(ii) ඉටු කළයුතු කාර්යභාරයට සාපේක්ෂව සමෘද්ධි බැංකුවල මානව සම්පත

සමෘද්ධි බැංකුවල එක් නිලධාරියකුට සිටින සමෘද්ධි ප්‍රතිලාභින් සංඛ්‍යාව 300ත් 700ත් අතර විය. එලෙස සමෘද්ධි ප්‍රතිලාභීන්ට අමතරව සහනාධාර ලබන වැඩිහිටි, වකුගඩු, ආබාධිත, ගැබිණි හා කිරි දෙන මව්වරු සැලකිය යුතු සංඛ්‍යාවක් සිටින අතර ගිණුම් වර්ග 5ක් යටතේ සහනාධාරලාභීන් නොවන වෙනත් බැංකු ගිණුම් විශාල සංඛ්‍යාවක් ද තිබුණි. එමෙන්ම පරිගණක පද්ධතියට අමතරව හස්ත ක්‍රමය භාවිතා කරමින් එක් එක් බැංකු ගිණුම්වලට අදාලව ලෙජර් ගිණුම් පවත්වා ගතයුතු වේ. මෙම තත්ත්වය බැංකුවේ අධික පෝලිම් හා තදබදයට හේතු වී තිබුණි. තවද මෙලෙස අවම කාර්යමණ්ඩලයක් යොදාගෙන සහනාධාර ගෙවීම හේතුවෙන් බැංකුව මඟින් සිදු කරනු ලබන අනෙකුත් රාජකාරි වන ණය ලබාදීම් හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම්වල ද ප්‍රමාදවීම් සිදුවන බව සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රකාශකර තිබුණි.



**2023 ජුනි 26 දින පළුගස් වැව සමෘද්ධි බැංකුවේ පැවති තදබදය**

(ආ) සමෘද්ධි කලාපවල ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් වීම.

සමෘද්ධි කලාපවලට අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් තම සාමාන්‍ය රාජකාරී ලෙස පහත කාර්යයන් සිදුකරනු ලැබේ.

- තැන්පතු ඒකරාශී කිරීම
- ණය ලබා දීම හා ණය අයකිරීම
- සමිති රැස්වීම් පැවැත්වීම
- ජීවනෝපාය ව්‍යාපෘති පසුවිපරම් කිරීම
- ශ්‍රමදාන හා අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක
- සමෘද්ධි සහනාධාර ලේඛන සකස්කිරීම
- සමෘද්ධි ප්‍රතිලාභීන් සංශෝධන කිරීම්(මාරුකිරීම්, ඉවත්කිරීම්)

(i) ආසියානු සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක සහනාධාර වැඩසටහන හේතුවෙන් සමෘද්ධි කලාපවල ක්ෂේත්‍ර නිලධාරීන් හට අමතර රාජකාරී ලෙස ප්‍රතිලාභී නාමලේඛන සකස් කිරීම, දැනුවත් කිරීම්, නිවෙස්වලට ගොස් තොරතුරු ලබාගැනීම සහ ගිණුම් නොමැති පුද්ගලයන්ට ගිණුම් ආරම්භ කර දීම වැනි කාර්යයන් ඉටු කිරීමට සිදුවී තිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ සමෘද්ධි කලාපවල අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

(ii) මෙලෙස ක්ෂේත්‍ර නිලධාරීන් ග්‍රාම නිලධාරී වසම් අතර අනුයුක්ත කිරීමේ දී සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ සැලකිල්ලට ගෙන නොමැති බවත් තණමල්විල හා කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල එක් ක්ෂේත්‍ර නිලධාරියකුට ඉතා විශාල සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් ආවරණය කිරීමට සිදු වී තිබෙන බවත් නිරීක්ෂණය විය. එබැවින් ප්‍රතිලාභීන් හඳුනා ගැනීම ඉතා අපහසු වන බව ක්ෂේත්‍ර නිලධාරීන් ඔවුන්ගෙන් ලබා ගන්නා ලද තොරතුරුවල සඳහන් කර තිබුණි.

(ඇ) සමෘද්ධි කළාපවල ක්ෂේත්‍ර නිලධාරීන් විසින් විගණනයට ලබා දුන් තොරතුරු අනුව ආසියානු සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ඔවුන්ට පහත ගැටළු පැන නැගී තිබුණි.

(i) කාලය කලමණාකරණය කල නොහැකිවීම

(ii) ලේඛන වල කෙටි නම් තිබීම

(iii) ලේඛන වල හැඳුනුම්පත් අංක නොතිබීම

(iv) ලේඛනවල නම් ඉවත් කිරීම් හා ඇතුලත් කිරීම් සඳහා අවශ්‍ය ලේඛන නොලැබීම

(v) සෙසු නිලධාරීන්ගෙන් සහයෝගය නොලැබීම

(vi) පරිගණක හා අන්තර්ජාල පහසුකම් අවමවීම

(vii) කෙටිකාලයක් තුල වාර්තා සකස්කිරීමට සිදුවීම

(viii) පුද්ගලයින් හඳුනාගැනීමට අපහසුවීම

(ix) වයෝවෘද්ධ ප්‍රතිලාභීන් වසමෙන් බැහැරව සිටීම

(x) පදිංචි ස්ථාන සොයා ගැනීමට නොහැකි වීම

(xi) ප්‍රතිලාභින් බැංකු ගිණුම් ආරම්භ කිරීමට ප්‍රමාදවීම

ඉහත දැක්වූ ගැටළු හේතුවෙන් සමෘද්ධි කළාපවල ක්ෂේත්‍ර නිලධාරීන්හට කාර්යක්ෂමව තම රාජකාරි ඉටු කිරීමට නොහැකිවී ඇති බව නිරීක්ෂණය විය.

### 3.1.4 සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් වෙත කාර්යක්ෂමව ලබාදීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් වල ප්‍රමාණවත්භාවය

සමෘද්ධි සහනාධාර නියමිත වේලාවට අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදීම සඳහා සමෘද්ධි බැංකුවල භෞතික සම්පත් නිසි පරිදි තිබිය යුතුය. භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි නොතිබීමෙන් රාජකාරියේ යෙදෙන නිලධාරීන් මෙන්ම ප්‍රතිලාභීන්ද අපහසුතාවයට පත්වේ. සමෘද්ධි බැංකු විසින් විගණනයට ලබා දුන් තොරතුරු අනුව කදුළව හා හම්බෙගමුව සමෘද්ධි බැංකු දෙක හැර නියැදියට අයත් වූ සමෘද්ධි බැංකුවල කාර්යාල පහසුකම් ප්‍රමාණවත් නොවුණු අතර පරිගණක, ලිපිද්‍රව්‍ය, ඉන්ධන සහ ප්‍රවාහන, අඛණ්ඩ අන්තර්ජාල හා විදුලි සැපයුම් වැනි පහසුකම්, ආරක්ෂක පහසුකම්, සනීපාරක්ෂක හා පානීය ජල පහසුකම් හා අසුන්ගැනීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම මෙන්ම නව සහනාධාර ප්‍රතිලාභීන් සඳහා නව බැංකු ගිණුම් ආරම්භ කිරීමේ දී පාස් පොත් හා පාස් පොතේ ගණුදෙණු මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය උපකරණ නොමැතිවීම නිරීක්ෂණය විය. විගණනය විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ද පහත පරිදි එම පහසුකම් ප්‍රමාණවත් නොවීම් තහවුරු විය.



කාර්යාල ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම
කතරගම සමෘද්ධි බැංකුව- 2023 මැයි 24 දින



ගොඩනැගිලි නඩත්තු නොකිරීම
ගල්ගමුව සමෘද්ධි බැංකුව- 2023 මැයි 16



කතරගම සමෘද්ධි බැංකුව-2023 මැයි 24

### 3.1.5 සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් වෙත කාර්යක්ෂමව ලබාදීම සඳහා අවශ්‍ය ගොනු හා ලේඛන නිසි පරිදි පවත්වා ගැනීම

ගිණුම් චක්‍රලේඛ 08/2017හි 08 වන උප වගන්තිය පරිදි පහත ලේඛන දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සමෘද්ධි බැංකු විසින් පවත්වා ගෙන යායුතුය.

i. සහනාධාර චක්‍රලේඛ ගොණුව
ii. සමෘද්ධි ප්‍රතිලාභී නාමලේඛනය
iii. මාසික උපරිම වාර්තා ගොණුව
iv. මාසික සංශෝධන විස්තර වාර්තාව
v. සහනාධාර සංශෝධන ගොණුව
vi. පොරොත්තු ලේඛනය
vii. පූජ්‍ය/වැඩිහිටි/ළමා/ආබාධිත යන ආයතනවල ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද නාම ලේඛනය
viii. මාසිකව සහනාධාර මුදල් බැර නොකරන ලද ගිණුම් පිළිබඳ ගොනුව

එසේ වුවද විගණනය විසින් සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී හා සමෘද්ධි බැංකු විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සමෘද්ධි බැංකු විසින් මෙම ගොනු හා ලේඛන නිසිපරිදි පවත්වා ගෙන නොයන බව නිරීක්ෂණය විය.

### 3.1.6 සමෘද්ධි ප්‍රතිලාභීන් ඉවත් කිරීම

ගිණුම් චක්‍රලේඛ 08/2017හි 1.5 උප වගන්තිය ප්‍රකාරව සහනාධාරලාභීන් පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් ඒ පිළිබඳව පරීක්ෂා කරබලා 1.6 උපවගන්තිය යටතේ සහනාධාරය අවලංගුකිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට හිමිවේ. මෙලෙස විරෝධතාවයක් එනතුරු නුසුදුසු සහනාධාරලාභීන් හඳුනා නොගැනෙන බව නිරීක්ෂණය විය.

### 3.1. 7 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක සහනාධාර වැඩසටහනෙහි ඵලදායීතාවය

ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන ආහාර සුරක්ෂිතතාවය හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2022 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා සමෘද්ධිලාභීන්ට (පොරොත්තු ලේඛනයද ඇතුළත්ව) සහනාධාර ලබාදීමේ ප්‍රධාන අරමුණ ආර්ථික අර්බුදයේ පීඩාවිදින දුගී ජනතාව සවිබල ගැන්වීමයි. සැලසුම් හා මෙහෙයුම් අංශයේ සමෘද්ධි චක්‍රලේඛ 2018/07 ප්‍රකාරව සවිබල ගැන්වූ පවුල් ප්‍රධාන වශයෙන් තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් හා පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් ලෙස කොටස් දෙකකට බෙදේ. මූලික වශයෙන් ආර්ථික සමාජීය හා මානසික වශයෙන් යම්තාක් දුරට සාර්ථකත්වයක් ලැබූ පවුල් තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් ලෙස සැලකෙන අතර පූර්ණ වශයෙන් සවිබල ගන්වන තෙක් රුපියල් 420 සහනාධාරයක් ඔවුන් වෙත ලබා දේ. මාසිකව ඉහළ ආදායමක් ලබමින් (උදා- සාමාජිකයන් 4 ක් සිටින පවුලක මාසික ආදායම රු 24000 හෝ ඊට වැඩි ආදායමක් උපයන) සමාජීය හා මානසික වශයෙන් ද තිරසරව බලගැන්වූ පවුල් පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් ලෙස සැලකේ.

### (අ) සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම

1995 වර්ෂයේ සිට 2022 සැප්තැම්බර් මාසය දක්වා සවිබල ගැන්වී තිබීම හේතුවෙන් සහනාධාර නොලබන නමුත් වෙනත් ප්‍රතිලාභ වෙනුවෙන් ගිණුම් පවතින පුද්ගලයන්ගේ විස්තර පරීක්ෂා කිරීමේ දී සවිබල ගැන්වීමේ පුද්ගලයන්ගේ ප්‍රතිශතය සියයට 01 හෝ එයට අඩු දිස්ත්‍රික්ක ලෙස කොළඹ, යාපනය, මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය හා පුත්තලම හඳුනා ගත හැකි වූ අතර 1995 ආරම්භ කල සමෘද්ධි ව්‍යාපාරය තුල වර්ෂ 28 තුල ලියාපදංචි ප්‍රතිලාභීන්ගෙන් සවිබල ගැන්වී ඇත්තේ ප්‍රතිලාභීන් සියයට 3.6ක් වීම තුලින් මෙම සමෘද්ධි සහනාධාර ව්‍යාපාරයේ ඵලදායකත්වය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

පුද්ගලයන් 62,943ක ප්‍රමාණයක් සහනාධාර නොලැබුවත් සමෘද්ධි ව්‍යාපාරය මගින් ලබාදෙන වෙනත් ප්‍රතිලාභ (සහන පොළී මත ණය ලබා දීම, දරුවන්ව පාසල්වලට ඇතුළත් කිරීම, ශිෂ්‍යාධාර ලබාදීම, සහන ගාස්තු මත ජලවිදුලි පහසුකම් ලබාදීම වැනි) හේතුවෙන් සමෘද්ධි සාමාජිකත්වයේ සිටින අතර භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ඔවුනට ද මාසිකව රුපියල් 420 ක මුදලක් ඔවුනගේ ගිණුම්වලට බැර වේ. එබැවින් සමෘද්ධි ප්‍රතිලාභීන් පූර්ණ වශයෙන් සවිබල ගැන්වුන ද ඔවුන් වෙනුවෙන් ද රජයට වැයබරක් දැරීමට සිදුවී තිබුණි.

(ආ) සමෘද්ධි බැංකුවල සහනාධාරලාභීන්ගේ බැංකු ගිණුම් පරික්ෂාවේදී ඇතැම් සහනාධාරලාභීන් විසින් සැලකිය යුතු කාලයක් තිස්සේ තම ගිණුමට බැර වූ සහනාධාර ලබා ගෙන නොමැති බවත් ඇතැම් සහනාධාරලාභීන් විසින් සැලකියයුතු කාලයක් ගත වීමෙන් පසු මාස කිහිපයක එකතු වූ සහනාධාර තම මූල්‍ය අවශ්‍යතාවය අනුව එකවර ගිණුමෙන් ලබා ගෙන ඇති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් ආර්ථිකමය වශයෙන් පීඩාවට පත් ජනතාවට කඩිනමින් මූල්‍ය සහනයක් ලබාදීම අපේක්ෂා කළද ඇතැම් සහනාධාරලාභීන් එම ප්‍රතිලාභය දීර්ඝ කාලයක් භාවිතයට නොගැනීම තුළ සත්‍ය වශයෙන්ම සහනාධාර අවශ්‍ය ප්‍රතිලාභීන් ද යන්න ප්‍රශ්ණගත වේ.

(ඇ) විගණන නියැදියට අයත් වූ සමෘද්ධි ප්‍රජාමූල බැංකු 27 න් පහත සඳහන් පරිදි බැංකු 13ක් විසින් විගණනයෙන් ඉල්ලා සිටි අදාළ බැංකුව පිළිබඳ සහ සමෘද්ධි ක්ෂේත්‍ර නිලධාරීන් පිළිබඳ තොරතුරු ලබා දී නොතිබුණි.

| | **ප්‍රා.ලේ.කොට්ඨාශය** | **සමෘද්ධි ප්‍රජාමූල බැංකුව** |
|---|---|---|
| 1. | අම්බලන්තොට | බෝලාන |
| 2. | ඉබ්බාගමුව | ගොකරැල්ල |
| 3. | ඉබ්බාගමුව | දියතුරේ |
| 4. | ගල්ගමුව | සියඹලන්ගමුව |
| 5. | ගල්ගමුව | මහගල්කඩවල |
| 6. | ගල්ගමුව | ගල්ගමුව |
| 7. | ගල්ගමුව | මහානන්නේරිය |
| 8. | ගල්ගමුව | පලුකන්දේව |
| 9. | නොච්චියාගම | නොච්චියාගම |
| 10. | නොච්චියාගම | දොඹවලගම |
| 11. | නොච්චියාගම | ලිඳවැව |
| 12. | මන්මුනේ උතුර | කල්ලඩි |
| 13. | මන්මුනේ උතුර | ඉරුතායපුරම් |

## 3.2 වැඩිහිටි පුද්ගලයන් සඳහා මූල්‍ය දීමනා ලබා දීම(ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව)

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් සඳහා රුපියල් 5,474,711,400 ක මුදලක් හා වයස අවුරුදු සියය සපිරූ වැඩිහිටියන් සඳහා රුපියල් 7,102,500ක මුදලක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

### 3.2.1 ආයතනික සූදානම

2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව වයස අවුරුදු 60 සම්පූර්ණවීම වැඩිහිටියෙකු ලෙස අර්ථකථනය කර ඇති අතර 2012 අයවැය යෝජනා යටතේ දීමනාලාභියෙකු සඳහා සුදුසුකම් ලෙස වයස අවුරුදු 70 සම්පූර්ණ වීම දක්වා ඇත.

ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා මූල්‍ය දීමනා ලබා දීමේදී අඩු ආදායම්ලාභී සහ අවධානමට ලක්ව ඇති වැඩිහිටියන් අදාළ ප්‍රතිලාභී කාණ්ඩය වශයෙන් තෝරාගෙන තිබේ. මෙම වැඩිහිටියන් සඳහා ගෙවීම් කිරීමේදී වයස අවුරුදු 70ට වැඩි සහ වයස අවුරුදු 100ට වැඩි (සියවස් පූර්ණ) ලෙස කාණ්ඩ දෙකක් යටතේ දීමනා ගෙවීම් කර තිබේ. එසේම වැඩිහිටි දීමනා ගෙවීමේදී එම ගෙවීම් නිත්‍ය සහ පොරොත්තු ලේඛනගත යන කාණ්ඩ දෙක යටතේද සිදුකර තිබේ. නිත්‍ය දීමනා ගෙවීමේදී එම නිත්‍ය දීමනාවට අමතරව වැඩිහිටියන් සඳහා අතිරේක දීමනාවක් (top-up) ද ලබාදී තිබේ. දීමනා ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට වැඩිහිටියන්ව වැඩිහිටි කමිටු හරහා දැනුවත් කර තිබුණි.

ශ්‍රී ලංකාව තුළ වැඩිහිටියන් සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන ආයතනය කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වැඩිහිටි මහලේකම් කාර්යාල වන අතර එයට අනුව ඉහත මාස සඳහා නිත්‍ය වැඩිහිටි මූල්‍යාධාර දීමනා ලබාදීම සඳහා සුදුසුකම් ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | නිත්‍ය දීමනාව | | අතිරේක දීමනාව | |
|---|---|---|---|---|
| **මාසය** | **වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් සංඛ්‍යාව** | **සියවස් පූර්ණ වැඩිහිටියන් සංඛ්‍යාව** | **වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් සංඛ්‍යාව** | **සියවස් පූර්ණ වැඩිහිටියන් සංඛ්‍යාව** |
| සැප්තැම්බර් | 416,178 | 466 | 235,968 | 243 |
| ඔක්තෝබර් | 416,564 | 467 | 232,936 | 265 |
| නොවැම්බර් | 416,564 | 467 | 232,936 | 259 |

### 3.2.2 වැඩිහිටියන් සඳහා ගෙවීම් කිරීම

### 3.2.2.1 වයස අවුරුදු 70 ට වඩා වැඩි වැඩිහිටි පුද්ගලයන් සඳහා දීමනා ගෙවීම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයන්ගේ දීමනා ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුගත කළ ප්‍රතිලාභීන් ප්‍රමාණය එක් එක් මාසය සඳහා 132,500ක ප්‍රමාණයක් බැගින් වුවද ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව 115,000 කට ආසන්න සංඛ්‍යාවක් වූයෙන් අදාල ඇස්තමේන්තු කිරීම් සියයට 13ක පමණ ඉහළ අගයක් ගන්නා ලද බව නිරීක්ෂණය විය.

(ආ) එසේම, ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පවතින ප්‍රධාන ආයතනය වන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ තොරතුරු ප්‍රකාරව සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා එක් එක් මාසය වෙනුවෙන් හඳුනාගත් පොරොත්තු ලේඛන ගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 131,978 ක් වුවද 2022 සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසයන් සඳහා පිළිවෙළින් 115,037, 115,018ක් හා 115,753 ක් වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත මුදල් බැර කර තිබුණි. ඒ අනුව හඳුනාගත් පොරොත්තු ලේඛන ගත ප්‍රතිලාභීන් සහ බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් අතරෙහි සියයට 13ක පමණ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) එසේම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2022 සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසයන් සඳහා ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාවත් සමෘද්ධි බැංකු විසින් සත්‍ය වශයෙන් මුදල් ගෙවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාවත් සසඳා බැලීමේදී , අතිරේක දීමනා (top-up) සඳහා බැංකු වෙත මුදල් බැර කර ඇති ප්‍රමාණය සියයට 11 සිට සියයට 13 ක පමණ ඉහළ අගයක් ගන්නා බවත් පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් වූ කළ එය සියයට 28 ක පමණ ඉහළ අගයක් ගන්නා බවත් නිරීක්ෂණය විය. (ඇමුණුම 01)

(ඈ) ඉහත තත්ත්වය හේතුවෙන් ගෙවීම් කිරීමට සමෘද්ධි බැංකු වෙත බැර කරන ලද මුදල්වලින් අතිරේක දීමනා සියයට 11-14 අතර ප්‍රමාණයක්ද පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභී දීමනා සියයට 28ක පමණ ප්‍රමාණයක්ද සමෘද්ධි බැංකු වෙත ඉතිරිව ඇති බවත් ඒ අනුව සත්‍ය වශයෙන් ගෙවිය යුතු ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගැනීමක් වී නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.(ඇමුණුම 02)

### 3.2.2.2 වයස අවුරුදු 100 ට වැඩි වැඩිහිටියන් සඳහා ගෙවීම් කිරීම්

(අ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සියවස් පූර්ණ වැඩිහිටි පුද්ගලයන්ගේ දීමනා ගෙවීම් කිරීම සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුගත ප්‍රතිලාභීන් ප්‍රමාණය හා ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් ප්‍රමාණය සසඳා බැලීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| | මාසය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැප්තැම්බර් | | | | ඔක්තෝම්බර් | | | | නොවැම්බර් | | | |
| දීමනාව | ඇස්තමේන්තු කල ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවීම් කිරීමට බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය % | ඇස්තමේන්තු කල ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවීම් කිරීමට බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය% | ඇස්තමේන්තු කල ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවීම් කිරීමට බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය % |
| නිත්‍ය | 478 | 520 | 42 | 8 | 478 | 517 | 39 | 8 | 478 | 577 | 99 | 20 |
| අතිරේක (top-up) | 289 | 165 | (124) | (42.9) | 289 | 262 | (27) | (9) | 289 | 262 | (27) | (9) |

*මූලාශ්‍රය-සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව(ඇස්තමේන්තුව/**All Island Summary Report**)*

ඉහත තොරතුරු ප්‍රකාරව, නිත්‍ය දීමනා ගෙවීම් කිරීම සඳහා ඇස්තමේන්තු කල ප්‍රතිලාභීන් සංඛ්‍යාවට වඩා සියයට 8 ත් සියයට 20ත් අතර ප්‍රමාණයක් වැඩියෙන් සහ අතිරේක දීමනා ගෙවීම් කිරීම සඳහා සියයට 09 ත් සියයට 42 ත් අතර ප්‍රමාණයක් අඩුවෙනුත් බැංකු වෙත මුදල් බැර කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් ලත් තොරතුරු ප්‍රකාරව වයස අවුරුදු 100ට වැඩි වැඩිහිටි දීමනාව ලැබූ සත්‍ය ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඒ සඳහා හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාවට වඩා සැලකිය යුතු අඩු අගයක් ගන්නා බව පහත පරිදි නිරීක්ෂණය විය.

| | මාසය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැප්තැම්බර් | | | | ඔක්තෝම්බර් | | | | නොවැම්බර් | | | |
| **දීමනාව** | වැඩිහිටි මහලේකම් කාර්යාලය අනුව ප්‍රතිලාභ ගෙවිය යුතු සංඛ්‍යාව | සමෘද්ධි සං. දෙපා. අනුව ප්‍රතිලාභ ගෙවා තිබූ සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය% | වැඩිහිටි මහලේකම් කාර්යාලය අනුව ප්‍රතිලාභ ගෙවිය යුතු සංඛ්‍යාව | සමෘද්ධි සං. දෙපා. අනුව ප්‍රතිලාභ ගෙවා තිබූ සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය % | වැඩිහිටි මහලේකම් කාර්යාලය අනුව ප්‍රතිලාභ ගෙවිය යුතු සංඛ්‍යාව | සමෘද්ධි සං. දෙපා. අනුව ප්‍රතිලාභ ගෙවා තිබූ සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය % |
| නිත්‍ය | 466 | 387 | (79) | (16.95) | 467 | 378 | (89) | (19.05) | 467 | 374 | (93) | (19.9) |
| අතිරේක | 243 | 177 | (66) | (27.16) | 265 | 194 | (71) | (26.79) | 259 | 192 | (67) | (25.8) |

*මූලාශ්‍රය-ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය(ඒ ඒ මාස සඳහා හඳුනාගත් ප්‍රතිලාභී ලේඛන)*
*- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව(**All Island Summary Report**)*

(ඇ) ඉහත තොරතුරු ප්‍රකාරව, 2022 සැප්තැම්බර් මස සත්‍ය වශයෙන් ගෙවීම් කල ප්‍රතිලාභීන් සංඛ්‍යාව 387 ක් වන බවත් මෙම සංඛ්‍යාව ඔක්තෝම්බර් මාසය වනවිට 378 ලෙස අඩුවී ඇති බවත් එහෙත් අතිරේක දීමනා ගෙවන ලද ප්‍රතිලාභීන් ප්‍රමාණය 177 සිට 194 ක් දක්වා වැඩි වී ඇති බවත් නිරීක්ෂණය විය. මෙසේ නිත්‍ය ප්‍රතිලාභීන් සංඛ්‍යාව අඩුවීමේදී අතිරේක දීමනා ගෙවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව වැඩි වී තිබීම අසාමාන්‍ය තත්ත්වයක් බවත් නිරීක්ෂණය කෙරේ.

(ඈ) එසේම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කරන ලද සමස්ථ දිවයින සඳහා වන සාරාංශ වාර්තාව ප්‍රකාරව මෙම වැඩිහිටියන් සඳහා ගෙවීම් කිරීමට සමෘද්ධි බැංකු වෙත බැර කරන ලද මුදල්වලින් පහත පරිදි ඉතිරි වීම් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

| මාසය | නිත්‍ය දීමනා ගෙවීම | | | | අතිරේක දීමනා ගෙවීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගෙවීම් කිරීම සඳහා සමෘ. බැංකු වෙත බැර කළ මුදල (රු.) | සමෘ. බැංකු විසින් ගෙවන ලද මුදල (රු.) | වෙනස (රු.) | වෙනසේ ප්‍රතිශතය % | ගෙවීම් කිරීම සඳහා සමෘ. බැංකු වෙත බැර කළ මුදල (රු.) | සමෘ. බැංකු විසින් ගෙවන ලද මුදල (රු.) | වෙනස (රු.) | වෙනසේ ප්‍රතිශතය % |
| සැප්තැම්බර් | 2600000 | 1935000 | (665000) | (25.57) | 412500 | 442500 | 30000 | 6.77 |
| ඔක්තෝබර් | 2585000 | 1890000 | (695000) | (26.88) | 655000 | 485000 | (170000) | (25.95) |
| නොවැම්බර් | 2885000 | 1870000 | (1015000) | (35.18) | 655000 | 480000 | (175000) | (26.71) |

මූලාශ්‍රය-සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව **(All Island Summary Report)**

### 3.2.3 නියැදිය සඳහා තෝරාගත් දිස්ත්‍රික්කවල වැඩිහිටියන් සඳහා කරන ලද ගෙවීම්

නියැදිය ලෙස තෝරාගත් දිස්ත්‍රික්කවලට ආදලව වැඩිහිටියන් සඳහා කරන ලද ගෙවීම් තොරතුරු පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | මාසය | සමෘද්ධි බැංකුව වෙත මුදල් ලැබීම | | ප්‍රතිලාභීන් වෙත මුදල් ගෙවීම | | නොගෙවන ලද මුදල (රු.) | නොගෙවූ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ලද මුදල (රු.) | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවන ලද මුදල (රු.) | | |
| | සැප්. | 24,132 | 99,127,000 | 21,389 | 81,977,200 | 17,149,800 | |
| අනුරාධපුර | ඔක්. | 24,132 | 99,142,000 | 21,461 | 82,609,700 | 16,532,300 | 17.28% |
| | නොවැ. | 24,800 | 101,894,500 | 21,708 | 83,682,100 | 18,212,400 | |
| **එකතුව** | | | **300,163,500** | | **248,369,000** | **51,894,500** | |
| | සැප්. | 16,300 | 63,212,800 | 15,421 | 57,721,500 | 5,491,300 | |
| හම්බන්තොට | ඔක්. | 16,693 | 64,428,700 | 15,563 | 58,310,200 | 6,118,500 | 9.92% |
| | නොවැ. | 16,657 | 64,412,600 | 15,583 | 58,298,000 | 6,114,600 | |
| **එකතුව** | | | **192,054,100** | | **174,329,700** | **17,727,400** | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සැප්. | 45,710 | 150,919,900 | 43,964 | 138,444,700 | 12,475,200 | |
| කුරුණෑගල | ඔක්. | 45,771 | 148,086,800 | 43,982 | 138,117,600 | 9,969,200 | 7.32% |
| | නොවැ. | 45,776 | 148,096,300 | 43,902 | 137,776,200 | 10,320,100 | |
| **එකතුව** | | | **447,103,000** | | **414,338,500** | **32,764,500** | |
| | සැප්. | 12,593 | 46,154,300 | 12,341 | 43,248,400 | 2,905,900 | |
| මොණරාගල | ඔක්. | 12,668 | 46,310,300 | 12,353 | 43,095,300 | 3,215,000 | 6.78% |
| | නොවැ. | 12,668 | 46,314,300 | 12,334 | 43,023,200 | 3,291,100 | |
| **එකතුව** | | | **133,778,900** | | **129,366,900** | **9,412,000** | |
| | සැප්. | 13,776 | 45,245,500 | 13,627 | 40,684,000 | 4,561,500 | |
| මඩකලපුව | ඔක්. | 13,776 | 41,599,500 | 13,618 | 40,572,900 | 1,026,600 | 5.19% |
| | නොවැ. | 13,776 | 41,599,500 | 13,606 | 40,510,500 | 1,089,000 | |
| **එකතුව** | | | **128,444,500** | | **121,767,400** | **6,677,100** | |

**(තොරතුරු ඒකකය - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)**

මේ අනුව ඉහත සෑම දිස්ත්‍රික්කයකම නොගෙවා ඉතිරි වී ඇති මුදල් ප්‍රමාණය සියයට 5ත් 18ත් අතර අගයක් ගන්නා බව නිරීක්ෂණය වූ අතර වැඩිහිටියන් මිය යාම, පදිංචිය වෙනස් වී තිබීම, ද්විකරණය වැනි තත්ත්වයන් මෙම ඉතිරි වීම් වලට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. මියයාම් පදිංචිය වෙනස් වීම වැනි තතත්ත්වයන් ස්භාවික තත්ත්වයන් වුවත් ද්විකරණය වීම් වැනි තත්තත්වයන් පූර්වයෙන් හඳුනා නොගැනීම හේතුවෙන් අතිරික්ත මුදල් ප්‍රමාණයක් මෙසේ සමෘද්ධි බැංකු වෙත ගලා යාමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

### 3.2.4.භෞතිකව පරීක්ෂා කරන ලද ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අදාලව කරන ලද ගෙවීම්

මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ

**(අ) ප්‍රතිලාභීන් ද්විකරණය වීම්**

(i) ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිහිටි අතිරේක දීමනා(top-up) ගෙවීම් සඳහා ලැබී තිබූ මුදලින් සමාලෝචිත කාලපරිච්ඡේදයේ සෑම මසක් අවසානයටම සියයට 10කට ආසන්න මුදලක් ඉතිරිව තිබූ අතර ප්‍රතිලාභීන් ද්විකරණය වී තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම පොරොත්තු ලේඛනය ප්‍රතිලාභීන් සඳහා ලැබී තිබූ මුදලින්ද සමාලෝචිත කාලපරිච්ඡේදයේ සෑම මසක් අවසානයටම සියයට 14ත් 18ත් අතර ප්‍රමාණයක් ඉතිරිව තිබූ අතර ඒම තත්ත්වයටද ප්‍රතිලාභීන් ද්විකරණය වී තිබීම හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. (ඇමුණුම 03)

(ii) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද අතිරේක දීමනා ගෙවීම් සඳහා ලැබී තිබූ මුදල්වලින් සියයට 06ත් 08ත් අතර ප්‍රමාණයක් ඉතිරිව තිබූ අතර මෙම තත්ත්වයටද ද්විකරණය වීම් හේතු වී තිබුණි.(ඇමුණුම 03)

(iii) පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩිහිටි අතිරේක දීමනා ගෙවීම සඳහා ලැබී තිබූ මුදලින් සෑම මාසයක් අවසානයටම සියයට 33කට ආසන්න මුදලක් ඉතිරිව තිබූ අතර ප්‍රතිලාභීන් ද්විකරණය වීම හේතු වී තිබුණි. (ඇමුණුම 03)

(iv) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවීමට ලැබී තිබූ මුදලින් සියයට 12කට ආසන්න ප්‍රමාණයක් සෑම මසක් අවසානයේම ඉතිරිව තිබූ අතර මෙම තත්ත්වයටද ප්‍රතිලාභීන් ද්විකරණය වීම් හේතු වී තිබුණි. (ඇමුණුම 03)

2022 වසර අවසාන වන විට සමෘද්ධි බැංකුව වෙත ඉතිරිව තිබූ මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන තිබුණද අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු නොකිරීම මෙසේ ද්විකරණයක් ඇතිවීමට හා සමෘද්ධි බැංකු වෙත වැඩිපුර ගලායෑමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. (ඇමුණුම 03)

**(ආ) බැංකු ගිණුම් නොමැති වීම**

නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්ගෙන් සියයට 16කට ආසන්න ප්‍රමාණයකට ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකිව තිබූ අතර බැංකු ගිණුමක් නොතිබීම ඒම තත්ත්වයට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. (ඇමුණුම 03)

### 3.2.5 ගෙවීම් කිරීමේ දී ඒකාකාරී ක්‍රමයක් අනුගමනය නොකිරීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය යටතේ දීමනා ලබා දීමේදී එතෙක් වැඩිහිටි දීමනා වැඩසටහනට ඇතුලත්ව සිටි වැඩිහිටියන් මෙන්ම පොරොත්තු ලේඛනගතව සිටි වැඩිහිටියන්ද සමෘද්ධි බැංකු ගිණුමක් ආරම්භ කල යුතුව තිබුණි. මෙම ක්‍රමය මගින් අපේක්ෂා කර තිබුණේ පවත්නා මුදල් මාරු කිරීමේ ක්‍රමවේදයන් (Existing Cash Transfer Mechanisms) නිරනුකූල (Streamline) කිරීම වේ.

ඒ අනුව වැඩිහිටියන් සඳහා දීමනා ලබා දීමේදී සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාලව වැඩිහිටි දීමනා සමෘද්ධි බැංකු හරහා ගෙවීමට කටයුතු කර තිබුණද 2022 දෙසැම්බර් හා 2023 ජනවාරි මාස සඳහා රජය ප්‍රතිපාදන මගින් ලබා දී තිබූ දීමනා නැවතත් පෙර පරිදිම තැපැල් කාර්යාල හරහා ලබා දීමට කටයුතු කර තිබූ බව අප විසින් භෞතික පරික්ෂණයන් සිදුකළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව කළ පරීක්ෂාවන්හිදී නිරීක්ෂණය විය.

මේ අනුව සමෘද්ධි බැංකු ගිණුම් ආරම්භ කර ගෙවීම තුලින් අපේක්ෂා කරන ලද පවත්නා මුදල් මාරු කිරීමේ ක්‍රමවේදයන් නිරනුකූල කිරීමේ (Streamline) අරමුණෙන් බැහැර වන බව නිරීක්ෂණය විය.

(ආ) මේ අනුව, ගෙවීම් කිරීමේදී ඒකාකාරී ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් දීමනාලාභී බොහෝ වැඩිහිටියන් අපහසුතාවයන්ට පත්වී ඇති බවත් එම නිසා දෙසැම්බර් හා ජනවාරි මාසයන්ට අදාලව ඇතැම් වැඩිහිටි පුද්ගලයන්ට තම දීමනා ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම මුදල් අධිභාර වී ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මාසය | | | |
|---|---|---|---|---|
| | දෙසැම්බර් | | ජනවාරි | |
| | දීමනා ලබා නොගත් ප්‍රතිලාභීන් ගණන | අධිභාර කරන ලද මුදල රු. | දීමනා ලබා නොගත් ප්‍රතිලාභීන් ගණන | අධිභාර කරන ලද මුදල රු. |
| නොච්චියාගම | 16 | 30,400 | 12 | 22,800 |
| ගල්ගමුව | 121 | 229,900 | 78 | 148,200 |
| තණමල්විල | 101 | 191,900 | 32 | 60,800 |
| කතරගම | 36 | 68,400 | 31 | 58,900 |
| පලුගස්වැව | 45 | 85,500 | 17 | 32,300 |
| මන්මුනායි - බටහිර | 30 | 57,000 | 10 | 19,000 |
| මන්මුනායි - උතුර | 22 | 41,800 | 35 | 66,500 |
| ඉබ්බාගමුව | 112 | 212,800 | 82 | 155,800 |

(ඇ) ව්‍යාපෘති පරිපාලන අත්පොත ප්‍රකාරව අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට දීමනා ගෙවීමේදී සමෘද්ධි බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමක් හරහා පමණක් අදාල ගෙවීම් කිරීමට තීරණය කර තිබුණි. ඒබැවින් ප්‍රතිලාභීන් ඔවුන් පදිංචි සමෘද්ධි බැංකු කලාපයට අයත් සමෘද්ධි බැංකුවේ ගිණුම් ආරම්භ කර තිබූ අතර දීමනා ලබා ගැනීමට බැංකු වෙත යැමේදී ප්‍රවාහන දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇති බවත් එය ඔවුන්ගේ වයස්ගත තත්ත්වය සමග පීඩාකාරී තත්ත්වයක්වී ඇති බවත් අප විසින් භෞතික පරීක්ෂාවන් සිදු කල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලබාගත් තොරතුරු ප්‍රකාරව පහත පරිදි නිරීක්ෂණය විය. විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තැපැල් කාර්යාල හරහා වැඩිහිටි දීමනා ගෙවීමේදී තැපැල් කාර්යාල ගණනාවක් හරහා කරන ලද දීමනා ගෙවීම් වැඩිහිටියන් පදිංචි ප්‍රදේශවලට ආසන්නව ස්ථානගත වී තිබීම හේතුවෙන් ඔවුන්ට පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව තිබූ මුත් සමෘද්ධි බැංකු හරහා ගෙවීමේදී තමන් පදිංචි ප්‍රදේශයේ සිට වැඩිදුරක්, වැඩි මුදලක් හා කාලයක් ගත කරමින් ගමන් කිරීමට සිදුවී තිබීම නිරීක්ෂණය කළ හැකි විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැඩිහිටි දීමනා ගෙවීම සඳහා උපයෝගී කරගත් තැපැල් කාර්යාල සංඛ්‍යාව | ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ දීමනා ගෙවීම සඳහා පවතින සමෘද්ධි බැංකු සංඛ්‍යාව |
|---|---|---|
| අම්බලන්තොට | 11 | 04 |
| කතරගම | 03 | 01 |
| තණමල්විල | 07 | 02 |
| ගල්ගමුව | 12 | 05 |
| නොච්චියාගම | 11 | 03 |
| පලුගස්වැව | 05 | 01 |
| ඉබ්බාගමුව | 18 | 05 |

### 3.2.6 නියමිත දිනයට ගෙවීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ආයතන අතර මුදල් මාරුකිරීම්**

සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝම්බර් 15 දිනැති හා අංක NSE/DEV/03/04 දරන චක්‍රලේඛය ප්‍රකාරව සෑම මසකම 15 වන දින වන විට වැඩිහිටි දීමනා ගෙවීම් කටයුතු ආරම්භ කළ යුතු වේ. මෙම දීමනා ගෙවීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවටත්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවටත් සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙතින් සමෘද්ධි බැංකුව වෙතත් මුදල් බැර කරන ලද දිනයන් පහත පරිදි වේ.

| මාසය | ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට මුදල් ලැබූ දිනය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට මුදල් ලැබූ දිනය | ප්‍රතිලාභී කාණ්ඩය | සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙතින් සමෘද්ධි බැංකු වෙත මුදල් ලැබූ දිනය(2022 වර්ෂය) හෝමාගම | ගල්ගමුව | කොඩ්ඩියාගම | කඹුමල්ටිල | කතරගම | පලුගස්වැව | කුලියාපිටිය | [illegible] | ගලගෙමුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සැප්. | 09/30 | 09/30 | 1 | 10/11 | 10/11<br>11/16 | 10/13<br>11/17 | 10/11<br>11/17 | 10/11<br>11/17 | 10/11<br>10/17 | 10/11 | 10/11 | 10/11<br>12/13 |
| | | | 2 | 10/17 | 10/17 | 10/17 | 10/17 | 10/17 | 10/17 | 10/17 | 10/17 | 10/17 |
| | | | 3 | 10/18 | 10/12<br>11/16 | 10/18 | 10/12 | 10/18 | - | 10/18 | 10/12 | 10/18<br>11/16 |
| ඔක්. | 09/30 | 10/17 | 1 | 11/18 | 11/17 | 11/18 | 11/18 | 11/18 | 11/17 | 11/18 | 11/18 | 11/17<br>12/13 |
| | | | 2 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/28 |
| | | | 3 | 11/23 | 11/22 | 11/23 | 11/23 | 11/23 | - | 11/23 | 11/23 | 11/22 |
| නො. | 11/01 | 11/14<br>12/05 | 1 | 12/16 | 12/15 | 12/16 | 12/16 | 12/16 | 12/15 | 12/16 | 12/16 | 12/15 |
| | | | 2 | 12/16 | 12/16 | 12/16 | 12/16 | 12/16 | 12/16 | 12/16 | 12/16 | 12/16 |
| | | | 3 | 12/16 | 12/15 | 12/16 | 12/16 | 12/16 | 12/29 | 12/16 | 12/16 | 12/15 |

1- නිත්‍ය 2-අතිරේක 3-පොරොත්තු

ඒ අනුව සමාලෝචිත කාලපරිච්ඡේදය තුල වැඩිහිටියන්ට අදාල දීමනාව ඒ ඒ මාසවල 15 දින වන විට ගෙවීමට හැකිවන පරිදි ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

**(ආ) ප්‍රතිලාභී ගිණුම් වෙත ප්‍රමාද වී බැර කිරීම්**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ මූල්‍ය දීමනා ලබා දීමට තීරණය කිරීමේදී අඩු ආදායම්ලාභී විපතට පත්වූ පුද්ගලයන් (සමෘද්ධි, වකුගඩු, ආබාධිත සහ වැඩිහිටි පුද්ගලයින්) සඳහා හදිසි සහනයක් ලෙස අදාළ දීමනාවන් ලබා දීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවත් සමෘද්ධි බැංකු වෙත ලද මුදල් ප්‍රතිලාභීන්ගේ ගිණුම් වෙත බැර කිරීමේදී ප්‍රමාදයන් සිදු වී ඇති බව ඇමුණුම 04 දක්වා ඇති පරිදි නිරීක්ෂණය විය.

(ii) ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මාරු කිරීම සඳහා ලද මුදල් අදාළ ගිණුම්වලට මාරු කිරීමෙන් පසු ප්‍රතිලාභී ගිණුම්වලට මාරු කිරීම සම්බන්ධව සටහන් තබා ඇත්තේ කෙසේදැයි පරීක්ෂා කිරීමේදී ඇතැම් බැංකු විසින් ලෙජර් ගිණුම්වල අදාළ ගණුදෙනුව පැහැදිලිව හඳුනාගත හැකි පරිදි සටහන් ඇතුළත් කර නොතිබීමද නිරීක්ෂණය කරන ලදී.

(iii) එසේම නොච්චියාගම සමෘද්ධි බැංකුව සම්බන්ධයෙන් වූ කළ, එය(නිත්‍ය, අතිරේක, පොරොත්තු) සියළුම වැඩිහිටි දීමනා ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් දීමනාව ගෙවීම සඳහා ලබා දුන් අරමුදල් ගිණුම(4062) හරහා ක්‍රියාත්මක කර ඇති බවත් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ලබා දෙන ලද මුදල් ගිණුම් තැබීම සම්බන්ධව ලබා දී ඇති චක්‍රලේඛ උපදෙස් පරිදි වැඩිහිටි දීමනා ගෙවීම සඳහා 4065 ලෙසින් ගිණුමක් විවෘත කර නොමැති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

### 3.2.7 ගිණුම් සටහන් කිරීමේ ක්‍රියාවලිය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙන ලද මූල්‍ය දීමනාවන් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි බැංකු කළමණාකරුවන් අමතමින් 2022 අගෝස්තු 29 දිනැති හා අංක 2022/11 දරන සමෘද්ධි බැංකු චක්‍රලේඛය හා 2022 දෙසැම්බර් 02 දිනැති අංක DSD/HO/05/MF/01 දරන චක්‍රලේඛය නිකුත් කර තිබූ නමුත් බැංකු විසින් අතිරේක දීමනා හා පොරොත්තු දීමනා ගිණුම් තැබීමේදී ඒකාකාරී ක්‍රමයක් අනුගමනය නොකරමින් 4062 (ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් දීමනාව ගෙවීම සඳහා ලබාදුන් අරමුදල් ගිණුම) හා 4065( වැඩිහිටි දීමනා ගිණුම ) ගිණුම් දෙක විවිධ ලෙස භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. ඒ ඒ බැංකු විසින් චක්‍රලේඛ අර්ථ ගන්වා ගන්වාගෙන ඇති ආකාරය හා චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි සන්නිවේදනය වී නොතිබීම මෙම තත්ත්වය උද්ගත වීමට හේතු වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) විසින් නිකුත් කරන ලද 2022 දෙසැම්බර් 02 දිනැති හා අංක DSD/HO/05/MF/01 චක්‍රලේඛය මඟින් ලෙජර් ගිණුම් අංක 4062, "ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් දීමනාව ගෙවීම සඳහා ලබාදුන් අරමුදල් ගිණුම" ලෙස සංශෝධනය කර පවත්වාගෙන යන ලෙස දැනුම් දී තිබුණ ද නෝනාගම, තණමල්විල, කතරගම, පුලියන්තිව්, පලුගස්වැව සහ ඉබ්බාගමුව යන බැංකු පෙර පරිදිම එය නව CERC - මූල්‍යකරණ වැඩසටහන යටතේ ලෝක බැංකුව විසින් ලබාදුන් අරමුදල් ගිණුම ලෙසම පවත්වාගෙන යෑමට කටයුතු කර ඇති බව.

### 3.2.8 ප්‍රතිලාභී තොරතුරු නොලැබීම

විගණන නියැදියට අයත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වැඩිහිටි දීමනා හිමි ප්‍රතිලාභීන්ගෙන් එම ප්‍රතිලාභ ලැබීම පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්ණාවලීන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ප්‍රතිලාභීන් වෙත ලැබීමට සැලැස්වීමට කටයුතු කළද ඉබ්බාගමුව, ගල්ගමුව හා පලුගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් අදාළ තොරතුරු ලැබුු නොතිබුණි.

### 3.3 ආබාධිත පුද්ගලයන් සඳහා මූල්‍ය දීමනා ලබා දීම

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වේ. 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත අනුව "ආබාධ සහිත තැනැත්තා" යනුවෙන් සහජයෙන්ම ඇති වූ හෝ එසේ නොවූ ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌනතාවයක් ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතයේ අවශ්‍යතාවන් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින්ම තමා සඳහාම ඉටුකර ගැනීමට නොහැකි යම් තැනැත්තෙකු අදහස් වේ. මෙය ආබාධ සහිත යන්නට වෛද්‍යමය හා සමාජ ආර්ථික වශයෙන් සාධාරණීකරනය වන්නා වූ පුළුල් විග්‍රහයකි. ඒ අනුව මෙම ආබාධ සහිත බව යන්න දෘෂ්‍ය, කථන, ශ්‍රව්‍ය, බුද්ධිමය සහ මානසික ආබාධ, අපස්මාරය හා වෙනත් හේතු නිසා ඇති වන ආබාධ ලෙස සමාජ විද්‍යාත්මකව වර්ගීකරණය කල හැක. මෙම ආබාධ සහිත තැනැත්තන්ගෙන් බොහෝ පිරිස් ස්වභාවයෙන්ම අනෙකුත් පිරිස්වල සහයෝගය ලැබිය යුතු තැනැත්තන් පිරිසක් වන අතර 2022 වසර මැද භාගයේ ශ්‍රී ලංකාව තුල ඇති වූ ආර්ථික සහ සාමාජයීය අර්බූදය අනෙකුත් පිරිස්වලට මෙන්ම මෙම පිරිසටද දැඩිව බලපෑම් කරන්නක් විය. මේ නිසා, මෙම ආබාධ සහිත තැනැත්තන්ට වඩා හොඳ ජීවන තත්ත්වයන් ඇති කිරීම උදෙසා ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම් යටතේ මූල්‍යාධාර ලබා දීමේදී ද අවධානය යොමු කොට තිබේ.

ආසියානු සංවර්ධන බැංකු සහනාධාර ලබා දීමේ දී මෙම ආබාධ සහිත තැනැත්තන් නිත්‍ය දීමනා ලබන්නන් සහ පොරොත්තු ලේඛන ගතව දීමනා ලබන්නන් ලෙස කොටස් දෙකක් යටතේ වර්ග කර ඇති අතර නිත්‍ය දීමනාව ලබන්නන්ට මෙම දීමනාවට අමතරව අතිරේක දීමනාවක්ද ලබා දී ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ තොරතුරු ප්‍රකාරව සැප්තැම්බර් මස වන විට ආබාධ සහිත තැනැත්තන් සඳහා වන නිත්‍ය දීමනාව සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 72,000 වේ. 2022 සැප්තැම්බර්, ඔක්තෝම්බර් හා නොවැම්බර් මාසයන් සඳහා මෙම පිරිස් වෙත ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම් යටතේ මූල්‍යාධාර

ලබා දීමේ දී සමෘද්ධි සංවර්ධන බැංකුවෙහි විවෘත කරන ලද ගිණුමක් හරහා සිදුකර ඇති අතර ගෙවා ඇති මුළු දීමනා ප්‍රමාණය 1,385,362,500 වේ. අදාළ දීමනා ගෙවීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.

### 3.3.1 දීමනා නියමිත දිනට ගෙවීම

(අ) ආබාධිත තැනැත්තන් සඳහා වන දීමනාව මාසික දීමනාවක් වන බැවින් සෑම මසකම 20 වන දිනට ප්‍රථම ගෙවීම් කල යුතු බව අංක 1/3/2015/NSPD හා 2015 අප්‍රේල් 27 දිනැති චක්‍රලේඛයේ සඳහන් කර ඇතත් එම ආකාරයට සිදු වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙහිදී භාණ්ඩාගාරයෙන් සමෘද්ධි බැංකු වෙත මුදල් ලැබීමේ සිට ප්‍රතිලාභීන්ගේ එක් එක් ගිණුම් සඳහා මුදල් බැර කිරීම දක්වා වන සෑම අදියරයන්හිදීම ප්‍රමාද වීම් සිදුව තිබුණි. ඒ අනුව 2022 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් යන මාස ත්‍රිත්වය සඳහා ආබාධිත දීමනා ගෙවීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් අදාල මුදල් නිදහස් කර දින සිට සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත මුදල් ලැබීම දක්වා වන කාල පරාසයන් පහත පරිදි වේ.

| මාසය | ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට මුදල් ලැබූ දිනය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට මුදල් ලැබූ දිනය | ප්‍රතිලාභී කාණ්ඩය | සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙතින් සමෘද්ධි බැංකු වෙත මුදල් ලැබූ දිනය(2022 වර්ෂය) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | [illegible] | ගල්ගමුව | නොච්චියාගම | [illegible] | කතරගම | පලුගස්වැව | [illegible] | [illegible] | ගලිගමුව |
| සැප්. | 09/30 | 09/30 | 1 | 10/19 | 10/17<br>11/16 | 11/16 | 10/17<br>11/16 | 10/13<br>11/17 | 11/16 | 10/17 | 11/17 | 10/17<br>11/16 |
| | | | 2 | 10/20 | | | | 10/17 | | | | |
| | | | 3 | 12/12 | | | | 10/17 | | | | |
| ඔක්. | 09/30 | 10/17 | 1 | 11/18<br>11/23 | 11/18<br>11/23 | 11/18<br>11/23 | 11/18<br>11/23 | 11/22 | 11/18 | 11/18<br>11/23 | 11/18<br>11/23 | 11/18<br>11/23 |
| | | | 2 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/18 | 11/28 | 11/28 | |
| | | | 3 | 12/02 | | | | 11/23 | | | | |
| නො. | 11/01 | 11/14<br>12/05 | 1 | 12/14 | | 12/14<br>12/16 | 12/14<br>12/16 | 12/15 | 12/15<br>12/27 | 12/14<br>12/16 | 12/14<br>12/16 | 12/14<br>12/16 |
| | | | 2 | 12/16 | 12/16 | 12/16 | | 12/16 | | | | |
| | | | 3 | 12/19 | | | | 12/16 | | | | |

**1 - නිත්‍ය** **2 - අතිරේක** **3 - පොරොත්තු**

(ආ) දීමනාලාභීන් සංශෝධනය කිරීමේ දී දීමනාවලින් ඉවත්වන අය, දීමනා ලබා ගැනීමට අලුතින් එකතුවන අය හා පදිංචි මාරු කරන ලද ප්‍රතිලාභීන්ගේ ඉවත් කිරීම් හා එකතු කිරීම් එසේ සංශෝධනය වන අවස්ථාවේදීම සමාජ සේවා නිලධාරී හා සංවර්ධන නිලධාරී (සමාජ සේවා) අධීක්ෂණය යටතේ සිදු කල යුතු බව SMS/NSPD/05/15/01 හා 2022 අගෝස්තු 30 දිනැති චක්‍රලේඛය මගින් දන්වා ඇත. එසේම 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තිය (ඊ) ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යාලේඛන පවත්වාගෙන යෑම පිළිබඳ වගකීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාවේ වගකීමක් ලෙස දක්වා ඇත. නමුත් මෙම දීමනා සමෘද්ධි බැංකු හරහා ගෙවීමට තීරණය වූ අවස්ථාවේ යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් යළිත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තොරතුරු ලබාගෙන අදාල සංඛ්‍යා ලේඛන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කර තිබුණි. නිවැරදිව යාවත්කාලීන වන දත්ත පද්ධතියක් නොමැති වීම ඵලදායී කාර්යයකට යෙදවිය හැකි කාලය එකම කරුණක් සම්බන්ධයෙන් නැවත නැවත යෙදවීමට සිදුවන අවස්ථාවක් බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**3.3.2. භෞතික පරීක්ෂාව**

භෞතික පරීක්ෂාවන් සිදු කළ අනුරාධපුර, කුරුණෑගල, හම්බන්තොට, මඩකලපුව හා මොණරාගල යන දිස්ත්‍රික්කවල ප්‍රතිලාභී දීමනා ගෙවීම් හා අදාළ දත්ත පද්ධති නඩත්තු කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භෞතික පරීක්ෂාව සිදුකළ අනුරාධපුර, කුරුණෑගල, හම්බන්තොට, මඩකලපුව හා මොණරාගල යන දිස්ත්‍රික්කයන්ගේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 හරහා තෝරා ගත් නියැදියකට බෙදා දුන් ප්‍රශ්ණාවලිය තුලින් ලබා ගත් ප්‍රතිඵල අනුව ප්‍රතිලාභීන් සියයට50 කට අධික ප්‍රමාණයක් ආබාධිත දීමනාව ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙන බව දක්වා තිබුණි. ඒ අතර පහත සඳහන් ගැටළු පිළිබඳව විශේෂයෙන්ම සඳහන් කර තිබුණි.

- (i) ප්‍රතිලාභියාට අදාළ වන සමෘද්ධි බැංකුවේ සිට නිවසට ඇති දුර ප්‍රමාණය වැඩි වීම
- (ii) ප්‍රතිලාභීන් රැසක් එකම බැංකුවක් වෙතින් ප්‍රතිලාභ ලබා ගැනීමට යාමේ දී තදබදයක් ඇති වීම
- (iii) වැඩි කාලයක් බැංකු පෝලිම්තුල නිකරුනේ කාලය ගෙවීමට සිදු වීම
- (iv) දීමනා ගෙවන නිශ්චිත දිනයක් නොමැති වීමෙන් දවස් කීපයක් ඒ වෙනුවෙන් ගත වීම

(ආ) ආබාධිත හා පොරොත්තු ආබාධිතලාභීන් වෙනුවෙන් මුහුණ පෑමට සිදුව තිබූ ඉහත අපහසුතා වැලැක්වීම සඳහා 2022 අගෝස්තු 29 දින සමෘද්ධි බැංකු චක්‍රලේඛ 2022/11 මගින් සමෘද්ධි බැංකු වෙත පැමිණීමට අපහසුතා ඇති අයවලුන් සඳහා ඔවුන් වෙත ගොස් මුදල් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබා දී ඇත. නමුත් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණයවූ කරුණු අනුව ප්‍රතිලාභීන් වැඩි ප්‍රමාණයක් දීමනා ලබාගැනීමට යාමේදී අපහසුතාවයන්ට ලක්වී තිබුණි.

(ඇ) මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනායි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2022 ඔක්තෝබර් මාසයේ පොරොත්තු ආබාධිත දීමනා ලබා දීමට අදාල වන දත්ත පද්ධතිය පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත පරිදි විය.

(i) ප්‍රතිලාභීන් 44 දෙනෙකුගේ දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ග්‍රාම නිලධාරී වසම, නම, ස්ත්‍රී පුරුෂ භාවය, සමෘද්ධි බැංකුවේ නම, ගිණුම් අංකය නිවැරදිව සඳහන් වුවද ඔවුන්ගේ ලිපිනය ලෙස දන්වා ඇති තොරතුරු අසම්පූර්ණ බව.

(ii) ප්‍රතිලාභීන් 13 දෙනෙකුගේ උපන් දිනය සහ ජාතික හැඳුනුම්පත් අංකයක් හෝ වෙනත් හඳුනාගැනීමේ අංකයක් සඳහන් නොවීම.

(iii) ප්‍රතිලාභීන් පස්දෙනෙකුගේ ආබාධිත තත්ත්වයන් කුමක්ද යන්න පැහැදිලිව සඳහන් නොකිරීම.

ඒ අනුව මෙම දත්ත පද්ධතියේ සඳහන් ප්‍රතිලාභීන්ගෙන් සියයට 36 ක පමණ තොරතුරු විගණිත දිනය වන විට අසම්පූර්ණව පැවතුණි.

| දීමනා වර්ගය | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | උපන් දිනය | NIC | ආබාධය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| ආබාධිත නිත්‍ය දීමනාව අතිරේක දීමනාව | 46 | - | 09 | - | 11 |
| පොරොත්තු ආබාධිත දීමනාව | 44 | 13 | 13 | 05 | 44 |

(ඇ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ආබාධිත පුද්ගලයන් 132,000 සඳහා ප්‍රතිලාභ සමෘද්ධි බැංකු 1090 මගින් ගෙවීමේදි සමෘද්ධි බැංකු ශාඛා 66ක ප්‍රතිලාභි ගිණුම් පවත්වාගෙන යාම සඳහා පරිගණක ගත දත්ත පද්ධතියක් නොමැතිව හස්ත ක්‍රමය (manual) මගින් කිරීම නිසා ගණුදෙණුකරුවන් හා බැංකු නිලධාරීන් දැඩි අපහසුතාවලට පත් වී තිබෙන අයුරු භෞතික පරික්ෂාවට ලක්වුනු පරිගණක ගත දත්ත පද්ධතියක් නොමැති තණමල්විල සමෘද්ධි බැංකුවේදි නිරීක්ෂණය විය.

## 3.4 වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය දීමනා ලබා දීම

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීමේ දැක්ම පෙරදැරිව කටයුතු කරන ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වකුගඩු රෝගීන් වෙනුවෙන්ද ජාතික මෙහෙවර ඉටු කරනු ලබයි. වකුගඩු රෝගීන්ගේ සුබ සාධනය සලසා ඔවුන් සමාජයේ ඔසවා තැබීමේ සත්කාර්යයට දායක වෙමින්අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා මාසිකව ජීවනාධාරය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. සමාජ සේවා අමාත්‍යංශ චක්‍රලේක 1/2015 අනුව 2015 ජනවාරි 01 දින සිට වකුගඩු රෝගයට දැඩි ලෙස ගොදුරු වී ඇති රෝගීන් සඳහා මාසිකව රුපියල් 3000 ක ජීවනාධාර ගෙවීම ආරම්භ කර ඇත. එම චක්‍රලේකයට අනුව මසකට පවුලේ ආදායම රුපියල් 3000 ට අඩු රුධිරය පිරිපහදු කරන කාලික වකුගඩු රෝගීන් සඳහා ජීවනාධාරය හිමි වූ අතර 2019 අගෝස්තු 01 දින සිට පවුලේ මාසික ආදායම් සීමාව රුපියල් 6000ක් ලෙසට 2019/NSPD/01(සං)iii අමාත්‍යංශ චක්‍රලේඛය මගින් සංශෝධනය කර තිබුණි. එමෙන්ම 2017 ජුනි 01 දින සිට මසකට රු.3000 ක් වූ ජීවනාධාරය මසකට රුපියල් 5000 දක්වා වැඩි කිරීම අමාත්‍යංශ චක්‍රලේක 2017/ NSPD/01(සං) මගින් සිදු කර ඇත. 2022 සැප්තැම්බර් මස වන විට ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වකුගඩු දීමනාලාභීන් ලෙස රෝගීන් 39,150ක් හඳුනා ගෙන තිබුණි.

2022 වසරේ මැද භාගයේ ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වූ සමාජ, ආර්ථික අර්බුදයේ බලපෑම මත පීඩාවට ලක් වූ ජනතාවට සහන සැලසීමේ අරමුණින් ක්‍රියාත්මක වූ ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම් යටතේ මූල්‍යාධාර ලබා දීමේ දී වකුගඩු රෝගීන් සඳහා ද අවධානය යොමු විය. ඒ අනුව 2022 අගෝස්තු මාසය දක්වා ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා ලබා දුන් වකුගඩු දීමනාව 2022 සැප්තැම්බර් මස සිට නිත්‍ය ප්‍රතිලාභීන්ට මෙන්ම පොරොත්තු ලේඛනගත වකුගඩු රෝගීන්ට ද සමෘද්ධි බැංකු හරහා ලබා දීමට කටයුතු කර ඇත. අදාළ දීමනා ගෙවීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.

### 3.4.1 දීමනා නියමිත දිනට ගෙවීම

(අ) මෙහිදී ආබාධිත තැනැත්තන් සඳහා වන මහ ලේකම් කාර්යාලය විසින් සංඛ්‍යා දත්ත සමෘද්ධි දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර පසුව සමෘද්ධි බැංකු වෙත මුදල් ලබා දී මාසිකව දීමනාව ගෙවීම සිදු කර ඇත. නමුත් විධිමත් දත්ත පවත්වා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් මෙම ගෙවීම් සිදු කිරීම සඳහා නැවත ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙතින් තොරතුරු කැඳවීම සිදු කර තිබුණි. නිවැරදි තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලියේ තිබූ අඩුපාඩු නිසා මෙම ගෙවීම් කටයුතු නියමිත කාලපරිච්ඡේදයට අදාළව සිදු කිරීමේ ගැටළු පැවති බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) 1/2015 චක්‍රලේඛයේ සඳහන් පරිදි මෙම දීමනාව ගෙවීම සෑම මසකම 10 දින හෝ එම දිනය නිවාඩු දිනයක් නම් ඊළඟ පළමු වැඩ කරන දිනයේදී ගෙවීම් කළ යුතු බව දක්වා තිබුණත් ප්‍රතිලාභීන්ට මුදල් ලැබී තිබුණේ ප්‍රමාද විය. මෙහිදී භාණ්ඩාගාරයෙන් සමෘද්ධි බැංකු වෙත මුදල් ලැබීමේ සිට ප්‍රතිලාභීන්ගේ එක් එක් ගිණුම් සඳහා මුදල් බැර කිරීම දක්වා වන සෑම අදියරයන්හීදීම ප්‍රමාද වීම් සිදුව තිබුණි. ඒ අනුව 2022 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් යන මාස ත්‍රිත්වය සඳහා ආබාධිත දීමනා ගෙවීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් අදාල මුදල් නිදහස් කර දින සිට සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත මුදල් ලැබීම දක්වා වන කාල පරාසයන් පහත පරිදි වන අතර භෞතිකව පරීක්ෂා කළ අනුරාධපුර, හම්බන්තොට, මොණරාගල, මඩකලපුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ගෙවීම් සිදු කළ දිනයන් පහත පරිදි විය.

| මාසය | ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට මුදල් ලැබූ දිනය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට මුදල් ලැබූ දිනය | ප්‍රතිලාභී කාණ්ඩය | සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙතින් සමෘද්ධි බැංකු වෙත මුදල් ලැබූ දිනය(2022 වර්ෂය) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | නෝනාගම | ගල්ගමුව | නොච්චියාගම | තණමල්විල | කතරගම | පලුගස්වැව | පුලියන්තිව් | පුදූමණ්ඩපත්තඩි | ඉබ්බාගමුව |
| සැප්. | 09/30 | 09/30 | 1 | 10/13 | 10/17<br>11/16 | 11/16 | 11/16 | 10/12<br>11/17 | 11/16 | 10/12 | 10/15 | 10/17 |
| | | | 2 | 10/20 | | | | 10/17 | | 10/20 | 10/17 | |
| | | | 3 | 10/23 | | | | 10/17 | | 10/20 | | |
| ඔක්. | 09/30 | 10/17 | 1 | 11/22 | 11/21 | 11/22 | 11/21 | 11/18 | 11/21 | 11/19 | 11/22 | 11/21 |
| | | | 2 | 11/28 | 11/28 | 11/28 | 11/28 | 11/28 | | 11/30 | 11/28 | 11/22<br>11/28 |
| | | | 3 | 11/23 | 11/22 | | | 11/23 | | | | |
| නො. | 11/01 | 11/14<br>12/05 | 1 | 12/19 | 12/15 | 12/15 | 12/18 | 12/14 | 12/14<br>12/27 | 12/15 | 12/15 | 12/15 |
| | | | 2 | 12/16 | 12/16 | 12/16 | 12/16 | 12/16 | | | 12/16 | 12/16 |
| | | | 3 | 12/16 | 12/16 | 12/28 | | 12/16 | | | 12/16 | 12/16 |

1- නිත්‍ය 2 - අතිරේක දීමනාව 3 - පොරොත්තු

### 3.4.2. භෞතික පරීක්ෂාව

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ ලබා දුන් ප්‍රතිලාභ පිළිබඳව තෝරා ගත් දිස්ත්‍රික්ක 05 තුල පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) වකුගඩු දීමනා ගෙවීම සමෘද්ධි බැංකුවේ පවතින ගිණුමක් හරහා සිදු කළ යුතු බව ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි දක්වා ඇති අතර, එතෙක් සමෘද්ධි බැංකු ගිණුමක් නොතිබූ ප්‍රතිලාභීන්ට නව ගිණුමක් සමෘද්ධි බැංකු තුල ආරම්භ කිරීමට සිදු වී තිබුණි. සිදු කළ භෞතික පරීක්ෂාවන් හා බෙදා දුන් ප්‍රශ්නාවලීන්ට ලද පිළිතුරු ප්‍රකාරව බැංකු ගිණුම් ආරම්භ කිරීමේ දී හා මූල්‍යාධාර ලබා ගැනීමේ දී ප්‍රවාහන දුෂ්කරතා, පෝලිම්තුල දිගු වේලාවක් රැඳී සිටීමට සිදුවීම වැනි ගැටළු රැසකට මුහුණ දී තිබුණ බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනායි උතුර ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ වකුගඩු දීමනා ප්‍රතිලාභීන්ගේ දත්ත පද්ධතියේ ප්‍රතිලාභීන්ගේ ලිපිනයන් හැර අනෙකුත් තොරතුරු සම්පූර්ණ කර තිබුණි. දත්ත පද්ධතිය පරිශීලනය කරන බාහිර පාර්ශවයකට එහි සඳහන් ලිපිනයන්ගෙන් නිවැරදිවම ප්‍රතිලාභියා වෙත ළඟා වීමට දුෂ්කර බව විගණනයට පැහැදිලි විය. එමෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වකුගඩු දීමනා ප්‍රතිලාභීන්ගේ දත්ත පද්ධතියේ ද ජාතික හැඳුනුම්පත් අංකය හා ගිණුම් අංක විගණිත දිනය වන විට සම්පූර්ණ කර නොතිබුණි.

### 3.5 ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා මූල්‍ය දීමනා ලබාදීම

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබෙන මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ කාර්යභාර්යයන් අතරට මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ලෙස කටයුතු කිරීම හා ඊට අදාළ පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස් කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම, රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමා විය සංවර්ධනය කරන වැඩසටහන් සම්බන්ධීකරණය, පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම හා මුල් ළමා විය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය ඇතුලත් වේ.

මෙතෙක් මෙම ආයතනය යටතේ ක්‍රියාත්මක වූ ගර්භණී හෝ කිරි දෙන මව්වරුන් සඳහා වන ආහාර වව්චර්පත් ලබා දීමේ වැඩසටහනේ වව්චර්පත් ලබා දීම වෙනුවට ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ ගර්භණී හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ අවශ්‍යතා නංවාලීමේ අරමුණින් ගර්භයට මාස 03ක් සම්පූර්ණ වූ ගර්භණී මවක වීම හෝ මාස 01 සිට මාස 04ත් අතර දරුවකු සිටින කිරි දෙන මවකට රුපියල් 2500/= බැගින් මාස 4කට රුපියල් 10000ක දීමනාවක් ලබා දී තිබුණි.

මෙම වැඩසටහන යටතේ මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ කාර්යය ලෙස ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තොරතුරු රැස් කිරීම, එම තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් සකස් කිරීම, සම්බන්ධීකරණය කිරීම හා අවසානයට සකස් කළ ප්‍රතිලාභීන්ගේ ලේඛන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබා දීම දැක්විය හැක

හදිසි මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම සඳහා අපේක්ෂිත ප්‍රතිලාභීන් තෝරා ගැනීම, වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

### 3.5.1 අපේක්ෂිත ප්‍රතිලාභීන් තෝරා ගැනීම

#### 3.5.1.1 අවුරුදු 2 ට අඩු පෝෂණ ඌනතා සහිත දරුවන් සඳහා ආධාර ලබා දීම

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව දක්වා තිබූ අවුරුදු 2 ට අඩු පෝෂණ ඌනතා සහිත දරුවන් සඳහා ආධාර ලබා දීම සඳහා සැලසුම් සකස් කර නොතිබුණි.

#### 3.5.1.2 සුදුසුකම්ලත් ගර්භණී හා කිරි දෙන මව්වරුන් තෝරා ගැනීම

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තු අංක NP/ADB/1/2022/MOWCS හා 2022 සැප්තැම්බර් 27 දිනැති ලිපිය ප්‍රකාරව මෙම ප්‍රතිලාභ ගෙවීම සමෘද්ධි බැංකු ගිණුමක් හරහා කල යුතු බවත් ප්‍රතිලාභ ඍජුවම එම බැංකු ගිණුමට බැර කල යුතු බවත් දක්වා තිබුණි. එසේම කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශ ලේකම් නිකුත් කළ 2022 ඔක්තෝම්බර් 14 දිනැති චක්‍රලේඛ අංක 6/2022 අනුව ගර්භණී හා කිරිදෙන මවුවරුන්ගේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක තීරණය කොට අවසන් ප්‍රතිලාභීන් තෝරා එවීම සඳහා උපදෙස් ලබාදී තිබුණි.

ඒ අනුව දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රතිලාභී ලේඛන පිළිබඳ තොරතුරු අදාල දිස්ත්‍රික් මුල් ළමාවිය සංවර්ධන නිලධාරී හරහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත යොමු කර තිබුණි. ඒ අනුව තෝරා ගත් දිස්ත්‍රික්ක වල

සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවලදී අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ලබාගත් තොරතුරු පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් ගණන | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත යොමු කළ දිනය | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ට යොමු කළ දිනය |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 7850 | පලුගස්වැව | 155 | - | 2023.01.31 |
| | | නොච්චියාගම | 475 | 2023.01.13 | 2023.01.31 |
| මොණරාගල | 5290 | තණමල්විල | 344 | 2023.01.02 | 2023.01.31 |
| | | කතරගම | 167 | 2023.01.09 | 2023.01.31 |
| හම්බන්තොට | 6225 | අම්බලන්තොට | 743 | 2022.12.30 | 2023.01.31 |
| කුරුණෑගල | 10742 | ගල්ගමුව | 424 | 2022.12.06 | 2023.01.31 |
| | | ඉබ්බාගමුව | 192 | 2023.01.02 | 2023.01.31 |
| මඩකලපුව | 9363 | මන්මුනේ - උතුර | 1052 | 2023.01.17 | 2023.01.31 |
| | | මන්මුනේ - බටහිර | 660 | - | 2023.01.31 |

2023 ජනවාරි 31 දින මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් දිස්ත්‍රික් 25 සඳහා ප්‍රතිලාභීන් 156,449ක ප්‍රතිලාභී ලේඛනය, මුදල් ගෙවීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කාන්තා හා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ඔක්තෝබර් 14 දිනැති චක්‍රලේඛ අංක 6/2022 යටතේ ප්‍රතිලාභීන් තේරීම සඳහා නිර්ණායක තීරණය කල පසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුල ක්‍රියාත්මක මාතෘ සායන වල ලියාපදිංචි ගර්භණී මව්වරුන් හා කිරිදෙන මව්වරුන් අතුරින්, අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා මාස 03කට අධික කාලයක් ගත වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ අරමුණ අනුව ප්‍රතිලාභීන්ට කාලීනව මුදල් ලබා දීම ප්‍රමාද විමට හේතු වී තිබූ බව නිරික්ෂණය කෙරේ.

(ආ) මෙම හදිසි ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා සමෘද්ධි බැංකු ගිණුමක් අත්‍යවශ්‍ය බව තීරණය කිරීම නිසා බැංකු ගිණුම් විවෘත කිරීමට කාලය ගත වීම මෙන්ම ගිණුම් විවෘත කිරීමට සමෘද්ධි බැංකු වලට යාමට සිදු විමෙන් ගර්භණී තත්වයේ පසුවන අයදුම්කරුවන් අපහසුතාවයන්ට පත් වි තිබූ බව නිරික්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ට පැවරෙන අතර තෝරාගත් දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ 2022 අගෝස්තු 31 දිනට යාවත්කාලීන වූ ගර්භණී මව්වරුන්ගේ තොරතුරු පැවතියද එම යාවත්කාලීන වූ ගර්භණී මව්වරුන්ගේ තොරතුරු අනුව ප්‍රතිලාභින් තෝරා ගැනීම සිදු නොකර අළුතින් නිකුත් කළ චක්‍රලේඛ උපදෙස් අනුව අයදුම්පත් නිකුත් කර නැවත ප්‍රතිලාභීන් තෝරා ගැනීමෙන් ප්‍රතිලාභ ගෙවීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම ,ප්‍රතිලාභින් තෝරා ගැනීම සඳහා ලබා දුන් නිර්ණායක හා චක්‍රලේඛ උපදෙස් වරින් වර වෙනස් වීම හා තේරුම් ගැනීම ගැටළු සහගත වීම හේතුවෙන් නිලධාරීන් අපහසුතාවයට පත්වීම හා ප්‍රතිලාභී ලේඛන අවසානයට පත් කිරීම (finalize) ප්‍රමාද වී හේතුවෙන් මෙම හදිසි ආධාර කාලීනව අයදුම්කරුවන්ට ලැබීම දුර්වල මට්ටමක පැවති බව නිරික්ෂණය විය.

(ඈ) කාන්තා හා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශ ලේකම් නිකුත් කළ 2022 ඔක්තෝම්බර් 14 දිනැති චක්‍රලේඛ අංක 6/2022 අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්බන්ධ චක්‍රලේඛ උපදෙස් වල දැක්වෙන ගර්භණී කාලයට අයත් ලෙස මාස 03ට අඩු ගර්භණී මව්වරුන් සැලකිය නොහැකි බව නිරීක්ෂණය විය. ඒ අනුව මාස 03ට අඩු ගර්භණී මව්වරුන් සඳහා මෙම කාලයට අදාලව ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබී නොතිබුණි.

(ඉ) වැඩසටහන ආරම්භයේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු ලබා ගැනීමේ දී GND ID සඳහන් කිරීම අවශ්‍ය නොවූවද පසුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව එම අවශ්‍යතාව ඉදිරිපත් කිරීම හේතුවෙන් GND ID ඇතුලත් කිරීම සඳහා අමාත්‍යංශයේ සෑම අංශයකින්ම නිලධාරීන් යොදවමින් දින 10ක් වැනි කාලයක් පූර්ණ කාලීනව කටයුතු කිරීමට සිදු වී තිබුණි. මෙම වැඩසටහන සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වශයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මගින් සිදු වූ අතර වැඩසටහනට අවශ්‍ය තොරතුරු සම්බන්ධව විධිමත් දැනුවත් වීමක් සිදු නොවීම හේතුවෙන් මෙවැනි තත්වයන් වැඩසටහන කාර්යක්ෂමව සිදු කිරීමට බාධාකාරී වී තිබුණි.

(ඊ) හදිසි මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුනා නොගැනීම, නිර්ණායක මුල් අවස්ථාවේදීම නිවැරදිව හඳුනා නොගැනීම, විටින් විට ඉදිරිපත් කරන නිර්ණායක ඔස්සේ ප්‍රතිලාභීන් තේරීම සඳහා කාලය ගත වීම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුල යාවත්කාලීන වූ ගර්භණී මව්වරුන් පිළිබඳ දත්ත හා ලේඛන පැවතියද එම තොරතුරු භාවිතා නොකිරීම තුල සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් තෝරා ගැනීම ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.5.2 ප්‍රතිලාභීන් සඳහා මුදල් ගෙවීම සැලසුම් කිරීම

(අ) මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ දැක්වෙන තොරතුරු අනුව 2023 ජනවාරි 31 දින වන විට ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් ගර්භණී හා කිරිදෙන මව්වරුන් 156,449ක් තෝරා ගෙන තිබුණු අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කල ඇවර කිරීම් වාර්තාව අනුව සත්‍ය වශයෙන් අයදුම්කරුවන් 153,320 ක් වෙනුවෙන් රුපියල් 1,533,200,000 ක් ගෙවා තිබුණි.

(ආ) විගණනයේ දී තෝරා ගත් දිස්ත්‍රික්ක අනුව ප්‍රතිලාභ සැලසුම් කිරීම හා ප්‍රතිලාභ ගෙවීමේදී හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ඉල්ලුම් කළ ප්‍රතිලාභීන්ට වඩා ප්‍රතිලාභීන් 5 ක් වෙනුවෙන් මුදල් ගෙවා තිබුණු අතර අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිලාභීන් 418 ක් සඳහා මුදල් ප්‍රමාණවත් වී නොතිබුණි.

(ඇ) අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාලව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට ලද ප්‍රතිලාභ අපේක්ෂිත අයදුම්කරුවන් 7850 සඳහා 2023 මැයි 08 දින වන විටත් ප්‍රමාණවත් පරිදි මුදල් නොලැබී ඇති බවත් පහත දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාලව ප්‍රතිලාභ ඉල්ලුම් කල ප්‍රතිලාභීන් 2157කින් 201ක් සඳහා 2023 මැයි 18 දින වන විටත් මුදල් ලැබී නොමැති බවත් නිරීක්ෂණය වුණි. ඒ අනුව විගණිත දිනය වන විටත් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ හදිසි මුදල් ප්‍රතිලාභ නොලැබූ ගර්භණී හා කිරිදෙන මව්වරුන් 201ක් සිටින බව නිරීක්ෂණය වුණි.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2022 දෙසැ.31 වන විට මුල් ළමාවිය සං. පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත යොමු කළ ප්‍රතිලාභීන් ගණන | ප්‍රතිපාදන ලැබී ඇති ප්‍රතිලාභීන් ගණන | සමෘද්ධි බැංකුව | 2023මැයි18 දිනට තවදුරටත් ප්‍රතිපාදන අවශ්‍ය ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| රඹෑව | 403 | 401 | කල්ලන්චි - 2 | 02 |
| මනුප | 579 | 552 | ඇලයාපත්තුව - 4<br>කටුකැලියාව - 22<br>සාලියපුර - 1 | 27 |
| තලාව | 346 | 329 | | 17 |
| හොරොව්පතාන | 494 | 339 | හොරොව්පතාන - 90<br>මොරකැව - 65 | 155 |
| **එකතුව** | **2157** | **1951** | | **201** |

(ඇ) 2023 පෙබරවාරි 17 දිනැතිව මඩකලපුව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ නිකුත් කල අංක DSD/MF/COM/2023/01 ලිපිය අනුව සමෘද්ධි බැංකු මට්ටමින් ප්‍රතිලාභ ගෙවීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට යොමු කර ඇති ප්‍රතිලාභින් සංඛ්‍යාව පුදුමණ්ඩපත්තඩි සමෘද්ධි බැංකුව සඳහා ප්‍රතිලාභීන් 351ක් ලෙස දක්වා තිබුණ ද 2023 මාර්තු 13 වන දින පුදුමණ්ඩපත්තඩි බැංකු ජංගම ගිණුම වෙත ප්‍රතිලාභීන් 365ක් සඳහා මුදල් බැර කර තිබුණි. ඒ අනුව අයදුම්කරුවන් ඉක්මවා සමෘද්ධි බැංකු වෙත මුදල් ප්‍රේෂණය කර තිබු බව නිරීක්ෂණය වුණි.

(ඉ) කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 05ට අදාලව ගර්භණී හා කිරිදෙන මව්වරුන් 167ක් සඳහා අවසන් කල ප්‍රතිලාභ ලේඛන 2023 ජනවාරි 09 වන දින දිස්ත්‍රික් මුල් ළමාවිය සංවර්ධන නිලධාරී වෙත හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට යවා තිබුණු අතර 2023 පෙබරවාරි 14 දිනැති සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් නිකුත් කල DSD/HO/05/MF/15/SYSTEM/01 ලිපිය අනුව ප්‍රතිලාභ අපේක්ෂිත අයදුම්කරුවන් සංඛ්‍යාව 179ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් සම්බන්ධ සංඛ්‍යාත්මක තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ඊ) මොණරාගල දිස්ත්‍රික්කය සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ දැක්වෙන තොරතුරු අනුව අයදුම්කරුවන් 5290 ක් දක්වා තිබුණද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිලාභීන් 5055 ක් වෙනුවෙන් රු.50,550,000 ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 යටතේ ක්‍රියාත්මක සමෘද්ධි බැංකු වලට ප්‍රේෂණය කර තිබුණි. 2023 ජුලි 26 වන විට සත්‍ය වශයෙන් ගර්භණී හා කිරිදෙන මව්වරුන් 4912 ක් සඳහා ප්‍රතිලාභ ගෙවා තිබුණු අතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 6 කට අදාල සමෘද්ධි බැංකු තුළ පහත වගුවේ දැක්වෙන පරිදි රුපියල් 950,000 ක් ශේෂ ලෙස පැවතුණි. ප්‍රතිලාභීන් ඉක්මවා සමෘද්ධි බැංකුවලට මුදල් යැවීම හේතුවෙන් ප්‍රතිලාභීන් 95 ක් සඳහා ගෙවිය හැකිව තිබූ මුදල් අනවශ්‍ය ලෙස බැංකු තුළ රඳවා ගෙන තිබෙන බව නිරීක්ෂණය කෙරේ.

| ප්‍රාදේශි ලේකම් කොට්ඨාශය | බැංකුවට මුදල් ලද | | බැංකුව විසින් ගිණුම් ගත කළ | | ඉතිරි මුදල රු. |
|---|---|---|---|---|---|
| | ප්‍රතිලාභීන් ගණන | මුදල රු. | ප්‍රතිලාභීන් ගණන | මුදල රු. | |
| සියඹලාණ්ඩුව | 662 | 6,620,000 | 593 | 5,930,000 | 690,000 |
| මොණරාගල | 564 | 5,640,000 | 549 | 5,490,000 | 150,000 |
| බඩල්කුඹුර | 464 | 4,640,000 | 462 | 4,620,000 | 20,000 |
| බිබිල | 442 | 4,420,000 | 439 | 4,390,000 | 30,000 |
| මඩුල්ල | 278 | 2,780,000 | 274 | 2,740,000 | 40,000 |
| මැදගම | 397 | 3,970,000 | 395 | 3,950,000 | 20,000 |
| | | | | | 950,000 |

### 3.5.3 ADB ණය ගිණුම හරහා මුදල් ලැබීම හා ප්‍රතිලාභීන්ට ගෙවීම් කිරීම

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත සිදු කරනු ලබන ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ ගර්භණී හා කිරිදෙන මව්වරුන් ඇතුළු සමස්ත ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීම සඳහා ADB ණය ගිණුමෙන් මුළු එකතුව රුපියල් 62,311,650,742 ක් මුදල් ලැබී තිබුණි. එම මුදල්වලින් 2022 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු ගිණුමේ (02nd Generation Imprest A/C) ඉතිරිව පැවති රුපියල් 925,207,590 සහ 2023 පෙබරවාරි 23 දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් ලද රුපියල් 639,222,410 මුදල් ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා ප්‍රතිලාභ ගෙවීමට භාවිතා කර තිබුණි.

#### 3.5.3.1 ප්‍රතිලාභීන් සඳහා මුදල් ගෙවීම

(අ) 2022 දෙසැම්බර් 31 දින වන විට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු ගිණුමේ ඉතිරිව පැවති රුපියල් 925,207,590 මුදල සහ 2023 පෙබරවාරි 23 දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් ලද රුපියල් 639,222,410 මුදල් වලින් 2023 මාර්තු 13 දින සමෘද්ධි බැංකු 1090 ක් වෙත රුපියල් 1,559,270,000 ක් ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව ගර්භණී හා කිරිදෙන මව්වරුන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා සමෘද්ධි බැංකු ජංගම ගිණුම් වෙත මුදල් බැර කිරීම සඳහා මාස තුනකට ආසන්න කාලයක් ගත වී තිබුණි.

(ආ)(i) 2023 ජූලි 28 දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ඇවර කිරීමේ වාර්තාව අනුව ප්‍රතිලාභීන් 153,320 ක් සඳහා රුපියල් 1,533,200,000 ක් ප්‍රතිලාභ ගෙවූ බව දක්වා තිබුණි. ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ගර්භණී හා කිරි දෙන මව්වරුන් සිටිය ද අවශ්‍යතාවය නොසලකා සමෘද්ධි බැංකු වලට මුදල් බැර කිරීම, අයදුම්කරුවන්ට ගිණුම් නොමැති වීම, නිලධාරීන් කාලීනව අයදුම්පත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගර්භණී හා කිරි දෙන මව්වරුන්ට හිමි විය යුතු රුපියල් 26,070,000 ක් (1,559,270,000-1,533,200,000) මුදල් ඔවුන්ට හිමි වී නොතිබුණි.

(ii) විගණනයේ දී තෝරා ගත් දිස්ත්‍රික්ක වන අනුරාධපුර, මොණරාගල, හම්බන්තොට, කුරුණෑගල හා මඩකලපුව දිස්ත්‍රික්ක වල ප්‍රතිලාභීන් 39,057ක් සඳහා ප්‍රතිලාභ ගෙවීමට සමෘද්ධි බැංකු සඳහා මුදල් බැර කර තිබුණ ද සත්‍ය වශයෙන්ම ප්‍රතිලාභීන් 38,582 ක් සඳහා ගෙවීම් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ජාතික ක්‍රම සම්පාදන දෙපාර්මේන්තුවේ 2023 ජනවාරි 30 පැවති විශේෂ රැස්වීමේදී කාන්තා හා ළමා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් තීරණය අනුව 2022 ඔක්තෝම්බර් 14 දිනැති කාන්තා හා ළමා කටයුතු චක්‍රලේඛ අංක 6/2022 ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සලකා බැලූ නිර්ණායක නොසලකා හදිසි ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම සඳහා ලියාපදිංචි වූ සියළුම ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා රුපියල් 2,500 බැගින් මාස 04ක් සඳහා රුපියල් 10,000 මුදල් ගෙවීමට තීරණය කර තිබුණි. 2023 මාර්තු 20 දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක DSD/HO/SW/14/SS/05/01/04/2022(11) අනුව ප්‍රතිලාභීන් සඳහා එකවර රුපියල් 10,000 බැගින් කඩිනමින් මුදල් ගෙවීම සඳහා උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා නිර්ණායක තීරණය කල පසු ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීම සඳහා නියෝග ලබා දීමට මාස 05කට අධික කාලයක් ගත වීම හේතුවෙන් ප්‍රතිලාභ කාලීනව අදාල ප්‍රතිලාභීන්ට ලැබී නොතිබුණ බව නිරීක්ෂණය විය.

**3.5.3.2 නියැදි පරීක්ෂාවේදි තෝරා ගත් දිස්ත්‍රික්ක වල ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීමේ තත්ත්වය**

(අ) චක්‍රලේඛ උපදෙස් දිස්ත්‍රික් මට්ටමේ සිට බිම් මට්ටමට සන්නිවේදනය වීමේදී පැවති ගැටළු හේතුවෙන් සමෘද්ධි බැංකු හරහා ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීමේදී එකවර නොගෙවා වාරික වශයෙන් රුපියල් 10,000 ගෙවා තිබුණු අවස්ථා නිරීක්ෂණ විය.

උදා :- නොච්චියාගම සමෘද්ධි බැංකුව.

2023 මාර්තු 13 දින නොච්චියාගම සමෘද්ධි බැංකු ජංගම ගිණුමට ප්‍රතිලාභීන් 115ක් සඳහා රුපියල් 1,150,000 ක මුදල් බැර වී තිබුණද, 2023 මාර්තු 23 එනම් දින 10 කට පසු රුපියල් 1,012,500 ක් ප්‍රතිලාභීන් 98 -105 අතර ප්‍රමාණයක් සඳහා රුපියල් 2,500 වාරික වශයෙන් ගෙවා තිබුණි. 2023 මාර්තු 20 දිනැති හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අංක DSD/HO/SW/14/SS/05/01/04/2022(ii) ලිපිය අනුව මසකට රුපියල් 2,500 බැගින් රුපියල් 10,000 ක මුදල එකවර ගෙවීම සඳහා විධිවිධාන නිකුත් කිරීම මත 2023 අප්‍රේල් 22 දින ඉතිරි රුපියල් 137,500 ගිණුම් හිමියන්ගේ ගිණුම් වලට බැර කර තිබුණි. ඒ අනුව බැංකුවට මුදල් බැර වූ දින සිට ගිණුම් හිමියන්ගේ ගිණුම් වලට මුදල් බැර කිරීමට මාස 1 ½ ක් ගත වීම තුළ ප්‍රතිලාභින්ට ප්‍රතිලාභ ලබා දීම ප්‍රමාද වි තිබුණි.

(ආ) ගර්භණී හා කිරිදෙන මවුවරුන්ට ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් සමෘද්ධි බැංකු නියැදි පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය වුණි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි බැංකුව | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සමෘද්ධි බැංකු ලේඛන ඉදිරිපත් කල දිනය | බැර වූ මුදල රු. | සමෘද්ධි කාලසටහනට අදාල මුදල් බැංකුවට එවූ දිනය | ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා දීමනා රැස්කිරීමේ ගිණුමට මුදල් බැර වූ දිනය (4067) | ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර වූ දිනයන් හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| හම්බන්තොට | අම්බලන්තොට | නෝනාගම | 156 | 2022.12.20 | 1,560,000 | 2023.03.13 | - | 2023.03.31-**148**<br>2023.04.12-**01**<br>2023.04.19-**01** |
| අනුරාධපුර | පලුගස්වැව | පලුගස්වැව | 155 | 2023.02.16 | ,540,000 | 2023.03.13 | 2023.03.24 | 2023.03.25-**155** |
| | නොච්චියාගම | නොච්චියාගම | 115 | 2023.01.16 | 1,150,000 | 2023.03.13 | | 2023.03.28<br>2023.04.22 |
| මොණරාගල | තණමල්විල | තණමල්විල | 157 | 2023.01.02 | 1,570,000 | 2023.03.13 | - | 2023.03.24 |
| | කතරගම | කතරගම | 167 | 2023.03 | 1,670,000 | 2023.03.13 | - | 2023.03.22 **-167** |
| කුරුණෑගල | ගල්ගමුව | ගල්ගමුව | 103 | 2023.03.27 | 1,030,000 | 2023.03.13 | 2023.03.27 | 2023.04.09 **-101**<br>2023.04.18 **-01**<br>2023.04.28-**01** |
| | ඉබ්බාගමුව | ඉබ්බාගමුව | 192 | - | 1,920,000 | 2023.03.13 | 2023.03.21 | 2023.03.30-**192** |
| මඩකලපුව | මන්මුනේ - උතුර | පුලියන්තිවු | 177 | | 1,770,000 | 2023.03.13 | 2023.03.15 | 2023.03.21-**177** |
| | මන්මුනේ බටහිර | පුදුමණ්ඩපත්තඩි | 356 | තො.නැත | 3,650,000 | 2023.03.13 | 2023.03.17 | 2023.03.28-**356** |

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සෘජු ප්‍රේෂණ හරහා 2023 මාර්තු 13 දින ඉහත සමෘද්ධි බැංකු ජංගම ගිණුම්වලට මුදල් බැරකර තිබුණු අතර අදාල ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර කිරීම සඳහා දින 9 සිට මාස 1 ½ දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. සමෘද්ධි බැංකු වලට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා මුදල් ලැබුණු පසු බැංකු ගිණුම් තුල මෙම ණය ආධාර මුදල් දින ගණන් රඳවාගෙන තබා ගැනීම මගින් ප්‍රතිලාභීන්ට ක්ෂණිකව ලබා දීමට අපේක්ෂිත මූල්‍ය ආධාර නියමිත වේලාවට ප්‍රතිලාභීන්ට ලබා දීම තවදුරටත් ප්‍රමාද වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) මන්මුනේ - බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් යොමු කල සුදුසුකම් ලත් අයදුම්කරුවන් 356 ක් සඳහා ප්‍රතිලාභ ගෙවීම සඳහා සමෘද්ධි බැංකු ජංගම ගිණුමට බැර වූ රුපියල් 3,650,000 මුදලින් 2023 ජුනි 13 දින රුපියල් 90,000ක මුදලක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය ඉක්මවා ලැබුණු ආධාර මුදල් මාස 03 ක දිගු කාලයක් සමෘද්ධි බැංකු ගිණුම තුළ රඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

### 3.5.4 ප්‍රතිලාභීන් විසින් තම අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිලාභ භාවිතා කිරීම

ගිණුම් හිමියන්ගේ ලෙජර් ගිණුම් නියැදි පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) නෝනාගම සමෘද්ධි බැංකුව තුළ ගිණුම් පවත්වාගෙන යනු ලබන ගිණුම් හිමියන්ගේ අවශ්‍යතා වෙනුවෙන් 2023 මැයි 02 දිනට ගිණුම්වලින් මුදල් ඉවත් කර ගැනීම පිළිබඳ තොරතුරු සමෘද්ධි බැංකුව තුල භාවිතා කරනු ලබන පරිඝණක මෘදුකාංග පද්ධතිය හරහා පරීක්ෂා කිරිමට අපහසු බව දැන්වූ බැවින් ප්‍රතිලාභීන්ට මුදල් බැර වූ පසු කොපමණ කාලයක් ගිණුම්වල මුදල් ශේෂ ලෙස පැවතියද යන්න නිරීක්ෂණය කල නොහැකි වුණි.

(ආ) තණමල්විල සමෘද්ධි බැංකුව තුළ ගර්භණී හා කිරිදෙන මව්වරුන්ගේ පුද්ගලික ගිණුම් නියැදි පරික්ෂාවේදී බැංකුව හරහා ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් 157දෙනා අතුරින් ගිණුම් 8 ක් නියැදි පරීක්ෂාවේදී අදාල ගිණුම් හිමියන් විසින් දින 05ත් මාස 01ත් අතර කාලය තුල ගිණුම්වලින් මුදල් ලබාගෙන තිබුණි. 2023 මාර්තු 22 දින රුපියල් 10,000 බැගින් ගිණුම් හිමියන්ගේ ගිණුම්වලට මුදල් බැර වී තිබුණද 2023 අප්‍රේල් 30 දිනය වන විටත් ගිණුම් හිමියන් 03 දෙනෙකු විසින් ගිණුමෙන් අදාල මුදල් ඉවත් කරගෙන නොතිබුණි. විගණිත දිනය වන 2023 මැයි 23 දිනට ලෙජර් ගිණුම් යාවත්කාලීන නොකර තිබීම හේතුවෙන් එදිනට ගිණුම්වලින් මුදල් ඉවත් කර ගෙන තිබුණි ද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය. විස්තර පහත පරිදි වේ.

| | **ගිණුම් අංකය** | **ගිණුමට රු. 10,000 බැරවූ දිනය** | **2023.04.30 දිනට ගිණුමේ ශේෂය රු.** |
|---|---|---|---|
| (i) | 17/26444 | 2023.03.22 | 10,605 |
| (ii) | 17/26503 | 2023.03.24 | 40,905 |
| (iii). | 19/26505 | 2023.03.24 | 10,605 |

(ඇ) පලුගස් වැව සමෘද්ධි බැංකුව ප්‍රතිලාභීන් සඳහා මුදල් බැර කල පසු එනම්, තැන්පත් කල දින සිට මාස 02කට ආසන්න කාලයක් ගිණුමේ මුදල් ශේෂව පැවති අතර ගිණුම් හිමියන් මුදල් ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය වුණි. ප්‍රතිලාභීන් 154ක් අතුරින් විගණිත දින වන 2023 ජූනි 26 දින වනවිට ප්‍රතිලාභීන් 23ක් අදාල මුදල් ගිණුම්වලින් ඉවත්කරගෙන නොතිබුණු අතර වැඩසටහන යටතේ අපේක්ෂා කල හදිසි මූල්‍ය සහනාධාරයේ ප්‍රතිලාභ, අදාල ප්‍රතිලාභීන් විසින් ලබාගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

### 3.5.5 සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ප්‍රතිලාභ මුදල් නොලැබීම

#### 3.5.5.1. ප්‍රතිලාභ හිමි නොවූ ගර්භණී හා කිරිදෙන මව්වරුන්ගේ සමස්ත තත්ත්වය

(අ) මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙන් ලද තොරතුරු අනුව දිවයින තුල ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23කට අදාලව ප්‍රතිලාභ සඳහා අයදුම් කළ ගර්භණී හා කිරිදෙන මව්වරුන් 392 ක් සඳහා ප්‍රතිලාභ ගෙවීම සඳහා රුපියල් 3,920,000 ක මුදල් ප්‍රමාණවත්ව ලැබී නොතිබුණි.(ඇමුණුම05) මෙම ගෙවීම් කිරිමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට යොමු කර තිබුණද 2023 ජුනි 30 දින වන විටත් මෙම ගෙවීම් සඳහා මුදල් නොලැබීම හේතුවෙන් ඉහත ප්‍රතිලාභ අයදුම් කළ ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා මුදල් ප්‍රතිලාභ හිමි වි නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 35කට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ සඳහා අයදුම් කළ ගර්භණී හා කිරිදෙන මව්වරුන් 299 ක් සඳහා නිලධාරින්ගේ අතපසුවීම් හා සමෘද්ධි බැංකු වෙනස් වීම හේතුවෙන් නියමිත දිනට ඉදිරිපත් නොවී තිබුණි. (ඇමුණුම 06) ඒ අනුව එම අයදුම්කරුවන් සඳහාද මුදල් ප්‍රතිලාභ හිමි වී නොතිබුණි. චක්‍රලේඛ උපදෙස් අනුව ගර්භණී මව්වරුන් පදිංචි ග්‍රාම නිලධාරි වසම අනුව අදාල සමෘද්ධි බැංකුව තෝරා ගැනීම සඳහා උපදෙස් ලබා දිම හා නියමිත දිනට අදාළ ආයතන වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරිම හේතුවෙන් මෙම අයදුම්කරුවන් සඳහා මුදල් ප්‍රතිලාභ හිමි වී නොතිබුණි.

(ඇ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කල තොරතුරු අනුව දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක සමෘද්ධි බැංකු 1090 ක් සඳහා රුපියල් 1,559,270,000 ක් බැර කර තිබුණු බවත් ඇවර කිරිමේ වාර්තාව අනුව ගර්භණී හා කිරිදෙන මව්වරු 153,320 ක් සඳහා පමණක් රුපියල් 1,553,200,000 ක් මුදල් ගෙවා තිබුණු බවත් නිරික්ෂණය විය. ඉහත 2 (අ)(ආ) හි සඳහන් ගර්භණී හා කිරිදෙන මව්වරුන් 691 ක් සඳහා ප්‍රතිලාභ අහිමි වීම සම්බන්ධයෙන් සළකා බැලීමේදී ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා කාලිනව ප්‍රතිලාභ ලබා දීමට ප්‍රශස්ත ක්‍රමවේදයක් යොදා ගැනිම ප්‍රමාණවත් අයුරින් සිදු වී නොතිබුණු බව නිරික්ෂණය විය.

(ඈ) මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙන් ලද තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දිනය වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 7 කට අදාලව ප්‍රතිලාභ ඉල්ලුම් නොකළ හෝ නියමිත කාල සීමාවෙන් පසු යොමු කරන ලද නව අයදුම්කරුවන් ගණන 109 ක් විය.(ඇමුණුම 07)

### 3.5.5.2 විගණනය විසින් භෞතිකව පරික්ෂා කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල තත්ත්වය.

(අ) නෝනාගම සමෘද්ධි බැංකු නියැදි පරීක්ෂාව අනුව ප්‍රතිලාභී ලේඛනවල නම සඳහන් ප්‍රතිලාභීන් 06ක් සඳහා බැංකු ගිණුම් නොපැවතීම හා වසමේ පදිංචි නොමැති වීම හේතුවෙන් 2023 මැයි 05 දින වන විටත් ප්‍රතිලාභ හිමි වී නොතිබුණි. ඒ අනුව ගර්භනී මාතාවන් සඳහා වන රුපියල් 60,000 මුදල් නොගෙවූ ශේෂ ලෙස පැවතුණි.

(ආ) අවසාන තත්වයට පත් කල (finalize) ප්‍රතිලාභී නාම ලේඛන එවූ පසු අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මගින් නව ප්‍රතිලාභියෙකු සඳහා ගෙවීම් කිරීම සඳහා නෝනාගම සමෘද්ධි බැංකුව වෙත යොමු කර තිබුණද අමතර ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිපාදන සමෘද්ධි දෙපාර්තමේන්තුවෙන් නොලැබීම මත එම ප්‍රතිලාභියා සඳහා ප්‍රතිලාභ හිමි වී නොතිබුණි. එම ප්‍රතිලාභී මුදල් සමෘද්ධි දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර තිබුණද 2023 මැයි 02 දින වන විටත් එම ප්‍රතිලාභියා සඳහා මුදල් ලැබී නොතිබුණි.

(ඇ) ඉබ්බාගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රතිලාභීන් අතුරින් විගණිත දින වන 2023 ජුනි 28 දිනය වන විට ලියාපදිංචි ප්‍රතිලාභීන් 04 දෙනෙක් සඳහා මුදල් ගෙවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| සුදුසුකම්ලත් අයදුම්කරුගේ නම | ජා.හැ. අංකය | ග්‍රාම නිලධාරී වසම | සමෘද්ධි බැංකුව |
|---|---|---|---|
| i) R.M.H.M. රත්නායක | 935922801V | 437, ගොඩරත්මලේ | කඳුලව |
| ii) J.M.P.H. උඩුගම | | 492, අරගම | ගොකරැල්ල |
| iii) P.G.C.H. ගුණරත්න | 946090808 V | රාගෙදර | දියතුරේ |
| iv) M.A. රම්සියා බේගම් | 198168904077 | ඉපලව | ගොකරැල්ල |

(i) R.M.H.M.රත්නායක යන මව මෙම මුදල් ලබා ගැනීම සඳහා කඳුලව හා මැල්සිරිපුර සමෘද්ධි බැංකු දෙක තුළම ගිණුම් 02 ක් විවෘත කලද විගණිත දින වන 2023 ජුනි 28 වන විටත් ප්‍රතිලාභ නොලැබී තිබුණි. මව්වරුන්ගේ නාම ලේඛන අදාල සමෘද්ධි බැංකු වෙත යැවීමේදී සමෘද්ධි බැංකු බල ප්‍රදේශයට අදාල නොවන ප්‍රතිලාභීන් යොමු කිරීම තුළ අතිරේක ගෙවීම් කිරීම සඳහා බැංකු තුළ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් නියමිත වේලාවට සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිලාභ හිමිවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) J.M.P.H. උඩුගම යන මව 2022 නොවැම්බර් 04 දින අයදුම්පත අදාල නිලධාරීන්ට භාර දුන් පසු අදාල අයදුම්පත ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා විධිමත්ව යොමු නොවීම තුළ විගණිත දින වන 2023 ජූනි 28 වන විටත් ප්‍රතිලාභ නොලැබී තිබුණි.

### 3.5.6 ප්‍රතිලාභීන් සඳහා මුදල් සහනාධාර ලැබුණු බව තහවුරු කිරීම

(අ) මෙම මූල්‍යාධාර වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීමේ වගකීම සහ බලය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී තිබුණද විගණිත දින වන පහත ක්ෂේත්‍ර පරීක්ෂණ දිනයන් වන විටත් පහත දැක්වෙන ප්‍රාදේශීය කොට්ඨාසයන්ට අදාලව ප්‍රතිලාභීන් සඳහා සමෘද්ධි බැංකු හරහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රගතිය දැක්වෙන තොරතුරු ප්‍රාදේශීය ලේකම් පවත්වාගෙන ගොස් නොතිබුණි.

| | |
|---|---|
| අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.05.02 |
| ගල්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.05.16 |
| නොච්චියාගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.05.17 |
| තණමල්විල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.05.23 |
| කතරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.05.24 |
| මන්මුනේ - උතුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.06.27 |
| මන්මුනේ - බටහිර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.06.27 |
| ඉබ්බාගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2023.06.28 |

(ආ) 2023 දෙසැම්බර් 09 දිනැති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අංක DSD/HO/05/MF/15/SW-3 හා 2023 පෙබරවාරි 23 දිනැති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අංක DSD/SCBBU/21/2022/03/XVII ලිපි වල දැක්වෙන පරිදි ගිණුම් හිමියන්ගේ තොරතුරු ලියාපදිංචි කිරීමේදී ගිණුම් හිමියන්ගේ දූරකථන අංක ඇතුළත් කිරීමට බැංකු තුළ පවත්නා මෘදුකාංග පද්ධතිය තුළ පහසුකම් සංවර්ධනය කර ඇති බව දක්වා තිබුණද ප්‍රශ්නාවලි හරහා තොරතුරු ලබාගත් ප්‍රතිලාභීන් සඳහා මෙම මූල්‍යාධාර වැඩසටහන යටතේ ලද දීමනා ඔවුන්ගේ ගිණුම්වලට බැර කල බවට SMS කෙටි පණිවුඩ හරහා දැනුම් දී නොතිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිලාභ ලැබුණු බවට සන්නිවේදනය වීම අපේක්ෂිත අයුරින් සිදු නොවූ බව නිරීක්ෂණය වුණි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ලබා දුන් ප්‍රශ්නාවලි ගණන | පිළිතුරු ළද ප්‍රශ්නාවලි ගණන | පිළිතුරු ලද ප්‍රශ්නාවලි අතුරින් SMS පණිවුඩ නොලද ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| අනුරාධපුර | පලුගස්වැව | 30 | - | |
| | නොච්චියාගම | 100 | 100 | |
| මොණරාගල | තණමල්විල | 65 | 64 | |
| | කතරගම | 35 | 35 | |
| හම්බන්තොට | අම්බලන්තොට | 80 | 51 | 156 |
| කුරුණෑගල | ගල්ගමුව | 80 | 23 | |
| | ඉබ්බාගමුව | 125 | - | |
| මඩකලපුව | මන්මුනේ - උතුර | 190 | 190 | |
| | මන්මුනේ - බටහිර | 100 | - | |

## 3.6 වී ගොවීන් සඳහා මූල්‍ය දීමනා ලබා දීම

### 3.6.1 හැඳින්වීම

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ක්‍රියාත්මක ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාල විධිවිධාන සැලසීම, කෘෂිකාර්මික හා කාලීන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වෙනත් ආයතන වෙත අවශ්‍ය වන්නා වූ ආයතනික, නෛතික සහායක හා කළමණාකරණ සේවාවන් සැලසීම ඇතුළු අරමුණු ඉටුකරගැනීම සඳහා ස්ථාපිත කර තිබුණි. ගොවිජන සේවා මධ්‍යස්ථාන 565 ක් ක්‍රියාත්මක වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ගොවි සංවිධාන 16,909 ක් 2022 දෙසැම්බර් 31 දිනය වන විට ලියාපදිංචි වී තිබුණි.

**දුප්පත් සහ අවධානමට භාජනය විය හැකි පුද්ගලයන්ගේ ජීවන තත්වය නගා සිටුවීම**

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත ක්‍රියාත්මක ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය මගින් වී ගොවීන් සඳහා විශේෂ අවධානයක් යොමු කර මුල්‍යාධාර ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ණය මුදලක් ලෙස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හරහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි.

**ගොවීන් සඳහා සහායවීම**

කෘෂිකාර්මික නිෂ්පාදනවල පිරිවැය ඉහළයාමට සහන ලබාදීම සහ 2022/2023 මහ කන්නයේ ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 20,000 වන පරිදි එක් ගොවියෙකුට උපරිමය හෙක්ටයාර 2 ක් සඳහා බිම් සකස්කිරීමට පෙර සහ පැළ සිටුවීමෙන් පසුව වාරික දෙකක දී මූල්‍යාධාරයක් සපයන බව ව්‍යාපෘතියට අදාල පරිපාලන අත්පොතෙහි සඳහන් කර තිබුණි. මෙම මූල්‍යාධාරය ගොවීන් 600,000 කට ආසන්න ප්‍රමාණයකට සෘජුවම ඔවුන්ගේ බැංකු ගිණුම්වලට තැන්පත් කරනු ලබන අතර ඒ සඳහා ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ග්‍රාමීය සංවර්ධන බැංකුව යන බැංකුව වල ගිණුම ආරම්භ කර තිබිය යුතුය. ව්‍යාපෘතිය යටතේ මූල්‍යාධාර ලබාගැනීම සඳහා 2022/2023 මහ කන්නයේ වී වගා කළ ගොවීන් සිටින ගොවිජන සේවා මධ්‍යස්ථාන 556 ක ගොවීන් තොරතුරු ලබා දී තිබුණි.

### 3.6.2 ගොවීන් හා නිලධාරීන් දැනුවත් කිරීම හා ගෙවීම් ක්‍රමවේදය

#### 3.6.2.1 සහනාධාර ගෙවීම් ක්‍රමය පිළිබඳ සම්බන්ධිත පාර්ශවයන් දැනුවත් කිරීම සහ ගෙවීම් ක්‍රමවේදය

ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු පිළිබඳව නිකුත් කර ඇති පරිපාලන අත්පොතෙහි (IX) (E) අනුව ව්‍යාපෘතියට සම්බන්ධ සියළු පාර්ශවයන් දැනුවත් කිරීමට, ව්‍යාපෘතියට සම්බන්ධ පාර්ශවයන්ට ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම සඳහා උපරිම ලෙස දායකවීමට අවස්ථාව සලසාදීමට හා විවිධ සංනිවේදන මාර්ගයන් ඔස්සේ මූල්‍යාධාර ලබාගැනීමට සුදුසු පුද්ගලයන්ට තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි සන්නිවේදන උපාය මාර්ග පැවතිය යුතු බව සඳහන් කර තිබුණි.ඒ අනුව ගොවීන් ඇතුලු සම්බන්ධිත පාර්ශව දැනුවත් කිරීම සඳහා 2022 අගොස්තු සිට සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළ රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, වෙබ්අඩවි සහ දැන්වීම් පුවරු භාවිතාකළ යුතු බවත් සඳහන් කර තිබුණි.

මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘතිය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම**

මෙම ව්‍යාපෘතිය පිළිබඳව ගොවීන් ඇතුළු සම්බන්ධිත පාර්ශයන් දැනුවත් කිරීම සඳහා ව්‍යාපෘති අත්පොතෙහි සඳහන් ජනතාව අතර වඩාත් ජනප්‍රිය සංනිවේදන ක්‍රම භාවිතා කර නොතිබුණි.ගොවිජන ප්‍රාදේශිය නිලධාරී විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවි සංවිධාන කාර්යාල සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) නිලධාරී කාර්යාලවල දැන්වීම් පළ කිරීම සිදුකර තිබුණි. එසේ වුවද ඇතැම් ගොවිජන සේවා මධ්‍යස්ථානවල නිලධාරීන් සහ 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන් මුදල්

සහනාධාර ලබාදීම පිළිබඳව දැනුවත් කිරීමට අපේක්ෂා කළ කාලසීමාවෙන් පසුව ඔක්තෝම්බර් සිට ජනවාරි දක්වා කාලසීමාව තුළ දැනුවත් වී තිබූ බව නිරීක්ෂණය විය.

**(ආ) නිලධාරීන් දැනුවත් කිරීම**

(i) ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම ආරම්භක අවස්ථාවේ සිට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සමග ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සාකච්ඡා පවත්වා තිබුණ ද අපේක්ෂිත කාල සීමාව තුළ ගොවීන්ට මුදල් සහනාධාර ලබාදීමේ දී වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ii) 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන්ගෙන් තොරතුරු ලබාගැනීම සඳහා ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරීන් දැනුවත් කිරීම දුරකථන මාර්ගයෙන් සහ Whatsapp මගින් 2022 නොවැම්බර් සිදුකර තිබුණි. මෙම දැනුවත් කිරීමේදී ව්‍යාපෘතිය යටතේ සහනාධාර ගෙවිය යුතු කාල සීමාව, ගොවීන්ගේ යාවත්කාලීන බැංකු ගිණුම් යොදාගැනීමේ වැදගත්කම, ගොවි මහතාගේ නම සහ බැංකු ගිණුම් අංකය සැසඳිය යුතු බව පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් වීමක් සිදු වී නොමැති බව ඇතැම් ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරීන් සමග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව සිදුකළ සාකච්ඡාවල දී නිරීක්ෂණය විය. 2023 මාර්තු මස විගණන කටයුතු සිදුකරන අවස්ථාව වන විට මෙම Whatsapp පණිවිඩ නිලධාරීන් සතුව නොතිබූ බැවින් ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබාගැනීමට නොහැකිවුණි.

**(ඇ) ගොවීන්ගේ දත්ත Geogoviya දත්ත පද්ධතියට ඇතුලත් කිරීම සහ ගෙවීම් කිරීම**

2022/2023 මහ කන්නයේ දී වී වගා කළ ගොවීන් පිළිබඳ දත්ත රැස්කිරීම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරනු ලබන කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) නිලධාරීන් මගින් සිදුකර තිබූ අතර ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරී අධීක්ෂණය යටතේ ව්‍යාපෘති කාර්යාලයේ පරිඝණකගත දත්ත පද්ධතියට තොරතුරු ලබාදීම සිදුකරයි. වී වගාකළ ගොවිජන සේවා මධ්‍යස්ථාන 556 ක් පවතින බැවින් එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා ඉතා කෙටි කාලයක් ලබා දී තිබුණි.දත්ත ඇතුළත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොලැබීම හේතුවෙන් ඇතැම් ගොවීන්ගේ දත්ත ලබා දී තිබූ කාල සීමාව තුළ ඇතුලත් කිරීමට නොහැකි වී තිබුණි.

ව්‍යාපෘති කාර්යාලය මගින් දත්ත පරීක්ෂා කර ප්‍රතිලාභ ලබාගැනීමට සුදුසුකම්ල ලබන ගොවීන්ට සහනාධාර ගෙවීම ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ග්‍රාමීය සංවර්ධන බැංකුව යන බැංකු 04 මගින් 2022 දෙසැම්බර් 30 දින සිට 2023 මැයි 25 දක්වා කාල සීමාව තුල සිදු කර තිබුණි. මෙම ගෙවීම් පිළිබඳ සැසඳුම් කටයුතු 2023 ජූලි 31 දක්වා සිදුකළ බව සඳහන් කර තිබුණි.

**(ඇ)** 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 55 වන වන වගන්තිය අනුව ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ විධිවිධානවලට අනුව සෑම ගොවිජන සංවර්ධන සභාවක් විසින්ම ස්වකීය බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම් මැනීමට සැලැස්විය යුතුය. එසේ වුවද ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මන වන අවස්ථාව වන විට ද කුඹුරු ඉඩම් මැනීම් කටයුතු අවසන් වී නොතිබූ බැවින් ගොවීන් විසින් ඉඩම් ප්‍රමාණය පිළිබඳව ලබාදුන් තොරතුරු මත පදනම්ව සහනාධාර ලබාදීමට සිදු කර තිබූ බව නිරීක්ෂණය විය.

### 3.6.2.2.සහනාධාර ගෙවීම සඳහා ස්ථිර ක්‍රමවේදයක් සැකසීමේ අවශ්‍යතාව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විවිධ අවස්ථාවන්හි දී දේශිය අරමුදල් සහ විදේශිය ණය මුදල් භාවිතා කරමින් විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් යටතේ ගොවීන් දිරිමත් කිරීම සඳහා සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති සහ සහනාධාර වැඩසටහන් වල ප්‍රතිලාභ අපේක්ෂිත කාල සීමාව තුල දී ගොවීන් වෙත ලබාදීම සඳහා නිශ්චිත දිගුකාලීනව භාවිතා කළ හැකි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. **පොහොර වෙනුවට මුදල් ලබාදීම, කාබනික පොහොර සඳහා මුදල් ලබාදීම, ඉන්ධන සහනාධාර ලබාදීම, ආසියානු බැංකු ණය ආධාර යටතේ වී ගොවීන්ට මුදල් ආධාර ලබාදීම සහ පොහොර ලබාගැනීම සඳහා වවුචර් ලබා දී නැවත එම වවුචර් දෙපාර්තමේන්තුව විසින්ම ලබාගෙන පොහොර ලබාදීම** ආදිය 2016 සිට 2023 දක්වා කාල සීමාව ක්‍රියාත්මක සහනාධාර වැඩ සටහන් කිහිපයකි. විවිධ සහනාධාර වැඩසටහන් සඳහා නිශ්චිත ක්‍රමවේදයක් භාවිතා නොකිරීම නිසා අදාල **දත්ත** වැඩසටහනින් වැඩසටහනට ගොවීන්ගෙන් ලබාගැනීමට සිදුවීම, ප්‍රතිලාභ අපේක්ෂිත කාල සීමාව තුල ලබාදීමට නොහැකි වීම, නිලධාරීන් සහ ගොවීන් අපහසුතාවයන්ට පත්වීම ආදිය සිදු වී තිබෙන බව නිරීක්ෂණය විය.

### 3.6.2.3 ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදීම සහ සහනාධාර ගෙවීමේ ක්‍රමවේදය

ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදෙන මුදල් තැන්පත් කිරීම සඳහා නව බැංකු ගිණුමක් ආරම්භ කරන ලෙස 2022 නොවැම්බර් 22 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දී මාසයක කාල පමාවකින් පසුව 2022 දෙසැම්බර් 21 දින ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ ගිණුම් අංක 7038648 යටතේ කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ව්‍යාපෘති ගිණුම ආරම්භ කර තිබුණි. 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන්ට මුදල් සහනාධාර ලබාදීම සඳහා 2022 දෙසැම්බර් 23 දින සිට 2023 ජනවාරි 05 දක්වා කාල සීමාව තුළ රු බිලියන 08 ක මුදලක් අදාල ගිණුමට බැරකර තිබුණි.

මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියට අදාල මාර්ගෝපදේශය අනුව හදිසි ආධාර ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය මගින් **2022/23 මහ කන්නය** තුල වගා කටයුතු සිදුකරන වී ගොවීන්ට හෙක්ටයාරයකට රු.20,000 වන පරිදි **බිම් සකස්කිරීමට පෙර සහ වගාව ස්ථාපිත කළ පසු** වාරික දෙකකින් සහනාධාර ලබාදෙන බව සඳහන් කර තිබුණි. 2022 සැප්තැම්බර් සිට 2023 මාර්තු දක්වා අදාල වගා කන්නය ක්‍රියාත්මක වී තිබුණු අතර බිම් සකස්කිරීම හා වගාව ස්ථාපිත කිරීම 2022 සැප්තැම්බර් සහ නොවැම්බර් අතර කාල පරාසය තුළ සිදුවී තිබූ බව කුරුණෑගල, අනුරාධපුරය, හම්බන්තොට, මොණරාගල සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල නියැදි ලෙස තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් ලබාගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

මේ අනුව බිම් සකස්කිරීමේ හා වී වැපිරීමේ කටයුතු සිදුකරන අවස්ථාව වන විට අදාල බැංකු ගිණුම ආරම්භ කිරීම හෝ ව්‍යාපෘතියට අදාල මුදල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලැබී නොමැති බැවින් අපේක්ෂිත පරිදි කාලීනව සහනාධාර මුදල් ලබාදීමට නොහැකි වී තිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකුව විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති මාර්ගොපදේශ අනුව උපරිම ඵලදාවක් සහිත කලාපවල වී වගාකළ ගොවීන් 600,000 කට පමණ සහනාධාර ලබාදීමට අපේක්ෂා කර තිබුණ ද 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන් 1,176,633 දෙනෙකු 2023 ජුලි 31 දක්වා රුපියල් 8,127,363,700 ක සහනාධාර සඳහා ඉල්ලුම්කර තිබුණි.ඒ අනුව අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා ගොවීන් 576,633 ක් එනම් සියයට 96 ක් ව්‍යාපෘතිය යටතේ සහනාධාර සඳහා අයදුම් කර තිබුණි.

### 3.6.3 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම

#### 3.6.3.1 සහනාධාර ගෙවීම් පිළිබඳ කාලීනව ප්‍රගති සමාලෝචනය සහ සමස්ථ දිවයිනේ ප්‍රගතිය

මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ

(අ) 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන්ට මූල්‍යාධාර ලබාදීම සඳහා ගොවීන් දැනුවත් කළ අවස්ථාවේ සිට 2023 ජූලි 31 දක්වා කාල සීමාව තුල ගොවීන් 1,176,633 දෙනෙකු සහනාධාර ලබාගැනීම සඳහා තොරතුරු ලබා දී තිබු අතර මෙම ගොවීන්ගෙන් ගොවීන් 1,039,961 ක් සඳහා රුපියල් 7,424,062,928 ක මුදලක් ගොවීන් වෙත ගෙවු බවත් අදාල මුදල ලේඛණ මගින් නිරවුල් කල බවත් 2023 සැප්තැම්බර් 14 දින ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් විගණනය වෙත වාර්තා කර තිබුණි.

(ආ) ගොවීන්ට මුදල් සහනාධාර ගෙවීම පිළිබඳව ව්‍යාපෘති කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව 2022 දෙසැම්බර් මස 30 දින සිට 2023 මාර්තු 31 දිනය දක්වා මාස 3 ක කාල සීමාව තුළ ගොවීන් 959,689 ක් සඳහා රුපියල් 6,960,116,936 ක මුදල් සහනාධාර ගෙවා තිබුණි.එම ගොවීන් ප්‍රමාණය සහනාධාර ලබාගැනීම සඳහා අයදුම්කළ සමස්ථ ගොවීන්ගේ ප්‍රතිශතයක් ලෙස සියයට 81 ක් බව නිරීක්ෂණය විය. විස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

| මාසය | ගොවීන් සංඛ්‍යාව | ගෙවූ මුදල |
|---|---:|---:|
| 2022 දෙසැම්බර් | 9,449 | 127,072,000 |
| 2023 ජනවාරි | 801,690 | 5,872,538,000 |
| 2023 පෙබරවාරි | 8,981 | 74,515,775 |
| 2023 මාර්තු | 139,569 | 885,991,161 |
| එකතුව | 959,689 | 6,960,116,936 |

#### 3.6.3.2 බැංකු ගිණුම් අක්‍රියවීම නිසා ගෙවීම් ප්‍රතික්ෂේපවීම

(අ) ජියෝගොවියා (Geo Goviya) දත්ත පද්ධතිය අනුව දිස්ත්‍රික්ක 25 තුළ හෙක්ටයාර 150,980 ක් වගාකර තිබූ ගොවීන් 209,493 කගේ බැංකු ගිණුම් අක්‍රියවීම ඇතුලු විවිධ හේතු මත ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. ගොවීන්ගේ බැංකු ගිණුම් යාවත්කාලීන කිරීමෙන් පසුව 2023 ජූලි 31 දින වන විට එම ගොවීන්ට රුපියල් 1,509,573,271 ක් සහනාධාර ලෙස ගෙවීම් කර තිබූ අතර එම ගොවීන්ගෙන් සියයට 72ක් එනම් ගොවීන් 141,563 ක් දිස්ත්‍රික්ක 06 කින් වාර්තාවන අතර ප්‍රතික්ෂේප වූ ගෙවීම් වටිනාකම රුපියල් 1,090,238,553 ක් බව නිරීක්ෂණය විය.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගොවීන් සංඛ්‍යාව | ඉඩම් ප්‍රමාණය | වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| 1. | කුරුණෑගල | 63,988 | 28,374 | 283,745,365 |
| 2. | අම්පාර | 21,602 | 23,544 | 235,440,593 |
| 3. | පොළොන්නරුව | 19,725 | 21,188 | 211,860,500 |
| 4. | ත්‍රිකුණාමලය | 13,278 | 14,421 | 144,056,000 |
| 5. | මඩකළපුව | 12,929 | 17,565 | 175,626,000 |
| 6. | මාතර | 10,041 | 3,951 | 39,510,095 |
| | **එකතුව** | **141,563** | **109,043** | **1,090,238,553** |

(ආ) 2023 අගොස්තු 11 දින ව්‍යාපෘති කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව සහනාධාර මුදල් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ Slip 98 ක ඇතුලත් කර තිබූ දිස්ත්‍රික්ක 25 හි ගොවීන් 31,008කට අයත් බැංකු ගිණුම් අක්‍රියව පැවතීම හේතුවෙන් රුපියල් 181,109,892 ක සහනාධාර මුදල් ගෙවීම් කිරීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය. විස්තරාත්මක තොරතුරු ඇමුණුම් 08 හි දැක්වේ.

- හෙක්ටයාර භාගය හෝ ඊට අඩුවෙන් වී වගාකළ ගෙවීම් ගොවීන් 18,546 ක් සඳහා බැංකු ගිණුම් අක්‍රියව පැවතීම හේතුවෙන් ගෙවීමට නොහැකි වූ මුළු සහනාධාරවල වටිනාකම රුපියල් 49,786,351 ක් බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.
- සහනාධාර ගෙවීම සඳහා භාවිතා කළ බැංකු 4 හි ගෙවීම් ප්‍රතික්ෂේපවීම සලකා බැලීමේ දී මහජන බැංකුවේ ගිණුම් ආරම්භ කළ ගොවීන්ගේ ගිණුම් වැඩිම ප්‍රමාණයක් අක්‍රියව පැවති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

### 3.6.4. වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීමේ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගතිය

දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන් සඳහා සහනාධාර වැඩ සටහන ක්‍රියාත්මක කර තිබුණි. විගණනයේදී සහනාධාර ගෙවීම පිළිබඳ පරීක්ෂාව සඳහා නියැදියක් ලෙස මඩකලපුව, මොණරාගල, අනුරාධපුරය, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් වැඩිම ගොවීන් ප්‍රමාණයක් වී වගාකළ සහ අඩු ගොවීන් ප්‍රමාණයක් වී වගාකළ ගොවිජන සේවා සේවා මධ්‍යස්ථානවලින් අවම වශයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන 3 ක් නියෝජනය වන පරිදි සහනාධාර ගෙවීම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා තොරතුරු කැඳවීම හෝ භෞතික පරීක්ෂාවන් සිදු කරන ලදි.

### 3.6.4.1 අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම

මෙම දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 128,649ක වී වගාකළ ගොවීන් 156,240 ක් සහනාධාර සඳහා අයදුම් කර තිබුණි. ව්‍යාපෘති කාර්යාලයේ දත්ත පද්ධතිය මගින් ලබාගත් තොරතුරු අනුව 2023 ජූලි 31 දිනට හෙක්ටයාර 124,744 ක් වී වගාකළ ගොවීන් 151,526 ක් සඳහා සහනාධාර ලෙස රුපියල් 1,247,343,350 ක මුදලක් ගෙවා තිබුණ ද මෙම ගොවීන්ගෙන් බැංකු ගිණුම් අක්‍රිවීම සහ ගිණුම් අංක නිවැරදි නොවීම හේතුවෙන් ගොවීන් 2,476 ක් සඳහා රුපියල් 17,876,000 ක සහනාධාර ගෙවීම් ප්‍රතික්ෂප වී තිබූ බව නිරීක්ෂණය විය. ගොවීන් ලබාදුන් තොරතුරු අඩුපාඩු සහිතව ඉදිරිපත් කිරීම මත අනෙකුත් ගොවීන් සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී බව නිරීක්ෂණය විය.

**(අ) නොච්චියාගම ගොවිජන සේවා මධ්‍යස්ථානය**

නොච්චියාගම ගොවිජන සේවා මධ්‍යස්ථානය යටතේ කෘ.ප.නි.ස.නිලධාරී වසම් 25 ක 2022/23 මහ කන්නයේ වී වගාකල ගොවීන්ට සහනාධාර ලබාදීමට අවශ්‍ය දත්ත ලබා ගන්නා ලෙස 2022 දෙසැම්බර් 19 දින සති සාකච්ඡාවේ දී කෘ.ප.නි.ස. නිලධාරීන් දැනුවත් කර තිබුණි. 2022/23 මහ කන්නයේ වගා කටයුතු ආරම්භ කිරීම 2022 ඔක්තෝම්බර් මස සිදුකර තිබුණු අතර අස්වනු නෙලීමේ කටයුතු 2023 මාර්තු 15 පමණ වන විට අවසන් කර තිබුණි.ගොවීන්ගෙන් ලබාගත් දත්ත තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම 2022 දෙසැම්බර් 22 දින ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා සති දෙකක පමණ කාලයක් ලබා දී තිබණි. මෙම ව්‍යාපෘතිය මගින් බිම් සැකසීමේ හා පැළ සිටුවීමේ කාර්යයන්ට අදාල කාල සීමාව තුල ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂා කර තිබුණ ද එම කාල සීමාව තුළ කිසිදු ගොවියෙකු සඳහා ප්‍රතිලාභ ලබාදීමට නොහැකි වී තිබුණි.

(i) කෘ.ප.නි.ස. නිලධාරීන් මගින් ලබාගත් තොරතුරු අනුව ගොවීන් 5,800 ක් මුදල් ආධාර ලබාගැනීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත තොරතුරු ලබා දී තිබුණ ද ගොවිජන සේවා මධ්‍යස්ථානයට අදාල ගොවීන්ට සහනාධාර ගෙවීම පිළිබඳව 2023 මැයි 16 දින ව්‍යාපෘති කාර්යාලය මගින් ලබාගත් තොරතුරු අනුව සහ එම මධ්‍යස්ථානයේ සිදුකළ භෞතික පරීක්ෂාවන් අනුව ගොවීන් 5,134 ක් සඳහා රුපියල් 47,255,000 ක සහනාධාර මුදල් ගෙවා තිබුණ ද ගොවීන් 666 ක් සඳහා සහනාධාර මුදල් ලැබී නොතිබුණි.

(ii) 2023 අගෝස්තු 16 දින ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරී මගින් ලබාගත් තොරතුරු අනුව ගොවීන් 30 දෙනෙකු සඳහා මුදල් ලැබී නොතිබූ අතර එහි වටිනාකම රුපියල් 249,000 ක් බව නිරීක්ෂණය විය.

**(ආ) පලුගස්වැව ගොවිජන සේවා මධ්‍යස්ථානය**

අනුරාධපුර දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව සහනාධාර අයදුම් කළ ගොවීන් 3011කගෙන් ගොවීන් 2,962 ක් සඳහා රුපියල් 18,365,000 ක මුදලක් 2023 මැයි 31 දිනය වන විට ගෙවා තිබුණු අතර තවදුරටත් ගොවීන් 49 දෙනෙකු සඳහා රුපියල් 290,000 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි.

**(ඇ)** ගලෙන්බිඳුණු වැව, කැබිතිගොල්ලෑව සහ නෑගම්පහ යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල සහනාධාර ගෙවීම පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා අදාල මධ්‍යස්ථානවල ගොවිජන සේවා නිලධාරීන් වෙත 2023 ජුනි 02 දිනැති ලිපි මගින් ප්‍රශ්නාවලි යොමු කළද 2023 දෙසැම්බර් 20 දින දක්වා ඒ පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි.එසේ වුවද අනුරාධපුර දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් ලබාදුන් තොරතුරු අනුව මෙම ගොවිජන සංවර්ධන සේවා මධ්‍යස්ථාන 3 හි ගොවීන් 16,674 ක් සඳහා රුපියල් 142,279,000 ක මුදලක් ගෙවූ බවත් ගොවීන් 306 ක් සඳහා රුපියල් 2,687,000 ක් ගෙවිය යුතුව පවතින බවත් සඳහන්කර තිබුණි.

**3.6.4.2 කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ සමස්ථ කාල සීමාව තුළ මෙම දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 77,797 ක වී වගාකළ ගොවීන් 175,861 ක් සහනාධාර ලබාගැනීම සඳහා අයදුම් කර තිබුණද දත්ත පද්ධතිය මගින් ලබාගත් තොරතුරු අනුව 2023 ජූලි 31 දිනට ගොවීන් 174,829 ක් සඳහා සහනාධාර ලෙස රුපියල් 773,381,185ක මුදලක් ගෙවූ බව සඳහන් කර තිබුණද බැංකු ගිණුම් අංක නිවැරදි නොවීම සහ ගිණුම් අක්‍රියවීම මත ගොවීන් 5,754 කට රුපියල් 23,243,000 ක සහනාධාර මුදල් ගෙවීම් ප්‍රතික්ෂේප වී තිබූ බව නිරීක්ෂණය විය. ගොවීන් ලබාදුන් තොරතුරු අඩුපාඩු සහිතව ඉදිරිපත්කිරීම මත අනෙකුත් ගොවීන් සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

බිම් සකස්කිරීමට පෙර සහ වගාව ස්ථාපිත කළ පසු ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ගෙවීමට අපේක්ෂා කර තිබුණ ද 2022 දෙසැම්බර් 31 දිනය වන විට වී වගාකළ ගොවීන් 168,086 ක් මුදල් සහනාධාර ඉල්ලුම් කර තිබුණ ද එම දිනය වන විට කිසිදු ගොවියෙකු සඳහා මුදල් ගෙවීමට නොහැකි වී තිබුණි. මහ කන්නය ආරම්භ වී මැද භාගය වන විටත් ගොවීන් වෙත

අදාළ ආධාර මුදල් ලබාදීමට නොහැකිවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් ගොවීන්ට මුදල් යෙදවීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියැදියක් ලෙස තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල සහනාධාර ගෙවීම් පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ඉබ්බාගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානය**

(i) මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සහනාධාර ගෙවීම පිළිබඳව 2022 දෙසැම්බර් දක්වා කෘ.ප.නි.ස නිලධාරීන් විසින් ගොවීන් දැනුවත් කර තිබුණි. කෘ.ප.නි.ස. වසම් 37 ක ගොවීන් 6,591 ක ගේ දත්ත මුදල් සහනාධාර ලබාගැනීම සඳහා දත්ත පද්ධතියට ඇතුලත් කර තිබුණි. එම සමස්ත ගොවීන්ගෙන් හෙක්ටයාර 52.44 ක් වගාකළ ගොවීන් 175 දෙනෙකුගේ බැංකු ගිණුම් අක්‍රියවීම, දත්ත ඇතුලත් කිරීමේ දී විවිධ අඩුපාඩු සිදු වී තිබීම හේතුවෙන් 2023 ජුනි 28 දිනය වන විටද රුපියල් 524,400 ක සහනාධාර මුදල් ගෙවා නොතිබූ බව ව්‍යාපෘති කාර්යාලයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබා දී තිබූ තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ii) සහනාධාර සඳහා අයදුම් කල ගොවීන්ගෙන් කොපමණ ගොවීන් සංඛ්‍යාවකට සහනාධාර ලබාදී තිබේද යන්න ප්‍රාදේශිය ගොවිජන නිලධාරී සතුව තොරතුරු නොතිබුණු අතර සහනාධාර මුදල් ලැබීම පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එහෙත් මුදල් සහනාධාර නොලැබුණු ඇතැම් ගොවීන් ප්‍රාදේශිය ගොවිජන නිලධාරී සහ කෘ.ප.නි.ස නිලධාරීන් වෙත පැමිණිලි කිරීම සිදුකර තිබුණි.



කෘ.ප.නි.ස. නිලධාරීන්, ගොවීන් සහ විගණන නිලධාරීන්ගේ හමුව 2023 ජුනි 28 දින ඉබ්බාගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී

(ආ) ගල්ගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානය

(i) මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශවල බිම් සකස් කිරීම සහ වගා කටයුතු ආරම්භ කිරීම 2022 ඔක්තෝම්බර් මස සිදුකර තිබුණි. ගොවීන් වගාකළ බිම් ප්‍රමාණයන් පිළිබඳ දත්ත ලබාදීම 2022 ඔක්තෝම්බර් 31 දින ආරම්භ කර තිබුණු අතර දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීම 2023 මාර්තු 01 දින දක්වා සිදුකර තිබුණි. සහනාධාර ලබාගැනීම සඳහා ගොවීන් 5,339 ක් තොරතුරු ලබාදී තිබුණද 2023 මාර්තු 31 දක්වා මූල්‍ය දීමනා ගෙවා අවසන් කළ ගොවීන් සංඛ්‍යාව 5,007 ක් වීම හේතුවෙන් තවදුරටත් ගොවීන් 332ක් සඳහා රුපියල් 1,932,500ක සහනාධාර ගෙවා නොතිබූ බව නිරීක්ෂණය විය.

(ii) ව්‍යාපෘති කාර්යාලය විසින් මුදල් නොලැබුණු ගොවීන්ගෙන් ගොවීන් 184 කට ගෙවිය යුතු රුපියල් 1,173,000 ක් ගෙවීම ප්‍රතික්ෂේප කර එම ගොවීන්ගේ තොරතුරුවල අවශ්‍ය සංශෝධන සිදුකරන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබා දී තිබුණ ද ගොවීන් 166කගේ බැංකු ගිණුම් යාවත්කාලීන කිරීම ඇතුලු සංශෝධනයන් සිදුකර ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කර තිබුණ ද 2023 මැයි 16 විගණිත දිනය වන විට ද ගෙවීම් කටයුතු සිදුකර නොතිබුණි. ගොවීන් 18 දෙනෙකු යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් නොකිරීම මත නැවත ගෙවීම් කිරීමට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) දුම්මලසූරිය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් වසම්වල ගොවීන් සඳහා සහනාධාර ගෙවීම

දුම්මලසූරිය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් කෘ.ප.නි.ස. නිලධාරී වසම් 20ක වී වගාකළ ගොවීන් 944 කට අදාල දත්ත ව්‍යාපෘති කාර්යාලයට ලබා දී තිබුණි. මෙම ගොවීන්ගෙන් කෘ.ප.නි.ස වසම් 17 ක් නියෝජනය වන පරිදි ලබාගත් තොරතුරු අනුව හෙක්ටයාර 510.5 ක් වගාකළ ගොවීන් 650 ක ගෙන් ගොවීන් 13 දෙනෙක් සඳහා රුපියල් 56,500 ක සහනාධාර මුදල් 2023 මැයි 31 දිනය වන විට ද ගෙවීම් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) රඹේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සහනාධාර ගෙවීම පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රාදේශිය ගොවිජන සේවා නිලධාරී වෙත 2023 ජුනි 02 දිනැති ලිපි මගින් ප්‍රශ්ණාවලි යොමු කළද 2023 දෙසැම්බර් 20 දින දක්වා ඒ පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි. එසේ වුවද කුරුණෑගල නියොජ්‍ය ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් 2023 මැයි 31 දිනට සහනාධාර ගෙවීම්වල ප්‍රගතිය පිළිබඳව ලබාදුන් තොරතුරු අනුව ගොවීන් 11,090 කට රුපියල් 62,166,350 ක මුදලක් සහනාධාර ලෙස ගෙවා තිබූ අතර ගොවීන් 03 සඳහා සහනාධාර ගෙවිය යුතු බව සඳහන් කර තිබුණි.

### 3.6.4.3 මොණරාගල දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම

ව්‍යාපෘති කාර්යාලය මගින් ලබාගත් තොරතුරු අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ වී වගාකළ ගොවීන් 61,998 ක් මුදල් සහනාධාර සඳහා අයදුම් කර තිබුණි. 2023 ජූලි 31 දිනට හෙක්ටයාර 27,447 ක වී වගාකළ ගොවීන් 35,365 ක් සඳහා සහනාධාර ලෙස රුපියල් 274,477,830 ක මුදලක් ගෙවූ බව සඳහන් කර තිබුණද බැංකු ගිණුම් අංක නිවැරදි නොවීම සහ ගිණුම් අක්‍රියවීම මත 2023 ජූලි 31 දිනය වන විට ගොවීන් 1,056 කට රුපියල් 7,676,900 ක සහනාධාර මුදල් ගෙවීම් ප්‍රතික්ෂේප වී තිබුණි. සහනාධාර ගෙවීම සඳහා ගොවීන් ලබාදුන් තොරතුරු අඩුපාඩු සහිතව ඉදිරිපත්කිරීම මත අනෙකුත් ගොවීන් සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) තණමල්විල ගොවිජන සේවා මධ්‍යස්ථානය**

මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ගොවීන් වී වගා කටයුතු 2022 ඔක්තොම්බර් 10 දින ආරම්භ කර තිබූ අතර අස්වනු නෙලීමේ කටයුතු 2023 ජනවාරි 30 වන විට අවසන් කර තිබුණි. මුදල් සහනාධාර ලබාදීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් කෘ.ප.නි.ස නිලධාරි වසම් 08 ක හෙක්ටයාර 1012.47ක් වගාකළ ගොවීන් 1,834 ක ගේ දත්ත තොරතුරු පද්ධතියට ඇතුලත් කර තිබුණි. භෞතික පරීක්ෂණයන් සිදුකළ 2023 මැයි 23 දිනය වන විට සහනාධාර අයදුම්කළ ගොවීන්ගෙන් හෙක්ටයාර 707.5 ක් වගා කළ ගොවීන් 824 ක් සඳහා රුපියල් 7,075,000 ක මුදලක් ගෙවා තිබුණු අතර මුදල් නොගෙවන ලද ගොවීන් 1010 පිළිබඳ පසු විපරම් කිරීමක් සිදු කර නොමැති අතර මුදල් නොලැබුණු බවට පැමිණිලි කළ ගොවීන් 10 දෙනෙකුගේ පැමිණිලි පමණක් ලේඛණයක සටහන් කර තිබුණි.

**(ආ) කතරගම ගොවිජන සේවා මධ්‍යස්ථානය**

මෙම මධ්‍යස්ථානයට අයත් ගොවීන් වගා කටයුතු 2022 නොවැම්බර් 20 දින ආරම්භ කර තිබූ අතර අස්වනු නෙලීමේ කටයුතු 2023 අප්‍රේල් 01 වන විට අවසන් කර තිබුණි.ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි ලබාදුන් තොරතුරු අනුව සහනාධාර ලබාගැනීම සඳහා ගොවීන් 1,409 ක ගේ දත්ත තොරතුරු පද්ධතියට ඇතුලත් කර තිබුණි. භෞතික පරීක්ෂණයන් සිදුකළ 2023 මැයි 23 දිනය වන විට සහනාධාර අයදුම්කළ ගොවීන්ගෙන් හෙක්ටයාර 676 ක් වගා කළ ගොවීන් 734 ක් සඳහා රුපියල් 6,760,000 ක මුදලක් ගෙවා තිබුණු අතර මුදල් නොගෙවන ලද ගොවීන් පිළිබඳ පසු විපරම් කිරීමක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද ව්‍යාපෘති කාර්යාලය මගින් මුදල් ගෙවීම ප්‍රතික්ෂේප වූ ගොවීන් 46 දෙනෙකුගේ බැංකු ගිණුම්

විස්තර යාවත්කාලීන කර ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් 2023 මැයි 12 දින ව්‍යාපෘති කාර්යාලයට යැවූවද ඔවුන්ට ගෙවීම් කිරීම පිළිබඳව ගොවිජන සේවා මධ්‍යස්ථානය දැනුවත් වී නොතිබුණි.

(ඇ) ඇතිමලේ, සියඹලාණ්ඩුව සහ හිඟුරුකඩුව යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල සහනාධාර ගෙවීම පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රාදේශිය ගොවිජන සේවා නිලධාරීන්ට 2023 ජුනි 02 දිනැති ලිපි මගින් ප්‍රශ්ණාවලි යොමු කළද 2023 දෙසැම්බර් 20 දින දක්වා ඒ පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි. එසේ වුවද මෙම ගොවිජන සේවා මධ්‍යස්ථාන 3 හි සහනාධාර ගෙවීම පිළිබඳව මොණරාගල ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් 2023 නොවැම්බර් 14 දින විගණනය වෙත ලබා දී තිබූ තොරතුරු අනුව අදියර දෙකක් යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 3 හි සහනාධාර ගෙවූ ගොවීන් සංඛ්‍යාව පිළිවෙළින් 6843 ක්, 5453 ක් සහ 297 ක් බව නිරීක්ෂණය වන අතර සහනාධාර අයදුම්කළ ගොවීන් සංඛ්‍යාව සහ ගෙවීම් ප්‍රතික්ෂේප වූ ගොවීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි. ඔවුන් සඳහා ගෙවා තිබූ මුළු සහනාධාර වටිනාකම රුපියල් 110,897,800 ක් බව නිරීක්ෂණය විය.

### 3.6.4.4 හම්බන්තොට දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 37,669 ක් වගාකළ ගොවීන් 50,666 ක් සහනාධාර ලබාගැනීම සඳහා අයදුම් කර තිබුණි. දත්ත පද්ධතිය මගින් ලබාගත් තොරතුරු අනුව 2023 ජූලි 31 දිනට හෙක්ටයාර 36,713ක් වී වගාකළ ගොවීන් 49,439ක් සඳහා සහනාධාර ලෙස රුපියල් 367,132,664ක මුදලක් ගෙවූ බව සඳහන් කර තිබුණද බැංකු ගිණුම් අංක නිවැරදි නොවීම සහ ගිණුම් අක්‍රියවීම මත 2023 ජූලි 31 දිනය වන විට ගොවීන් 825 කට රුපියල් 5,417,425 ක මුදල් ගෙවීම් ප්‍රතික්ෂේප වී තිබුණි. ගොවීන් ලබාදුන් තොරතුරු අඩුපාඩු සහිතව ඉදිරිපත් කිරීම මත අනෙකුත් ගොවීන් සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී බව නිරීක්ෂණය විය.

නියැදියක් ලෙස තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) අම්බලන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානය**

මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශවල වී වගා කටයුතු සඳහා බිම් සකස් කිරීමේ කටයුතු 2022 ඔක්තොම්බර් 10 සිට නොවැම්බර් 25 දක්වා කාල පරාසය තුළ සිදු කර තිබුණු අතර අස්වනු නෙලීමේ කටයුතු 2023 මැයි මාසය දක්වා

සිදුකර තිබුණි. වගා කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීම නොවැම්බර්, දෙසැම්බර් මාසවල දී අදියර දෙකක් යටතේ සිදුකර කෘ.ප.නි.ස නිලධාරි වසම් 25 ක ගොවීන් 2,935 ක ගේ දත්ත පද්ධතියට ඇතුලත් කර තිබුණද ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත කාල සීමාව තුළ දී ගොවීන්ට සහනාධාර ලබාදීමට නොහැකි වී තිබුණි.

(i) අම්බලන්තොට ගොවිජන සංවර්ධන නිලධාරී මගින් ලබාගත් තොරතුරු අනුව 2023 මාර්තු 31 දිනය වන විට ගොවීන් 2,190 කට පමණක් මුදල් සහනාධාර ගෙවා තිබුණ ද ගොවීන් 745 දෙනෙකු සඳහා මුදල් ලබා දී නොතිබුණි. මෙම ගොවීන්ගෙන් හෙක්ටයාර 46.2 ක් වගාකළ ගොවීන් 68 ක් සඳහා ගෙවිය යුතු රුපියල් 462,000 ක මුදල් බැංකු ගිණුම් අක්‍රියවීම හේතුවෙන් බැංකු විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කළ බව ව්‍යාපෘති කාර්යාලය මගින් දැනුම් දීමෙන් පසු බැංකු ගිණුම් යාවත්කාලීන කර නැවත තොරතුරු ලබාදී තිබුණද 2023 මැයි 02 විගණිත දිනය වන විටද මූල්‍ය දීමනා ගෙවා නොතිබුණි.

(ii) මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ගොවීන්ගෙන් සහනාධාර මුදල් නොලැබුණු ගොවීන් නියෝජනය වන පරිදි කෘ.ප.නි.ස. වසම් 23 ක් පිළිබඳ කෘ.ප.නි.ස. නිලධාරීන්ගෙන් ලබාගත් තොරතුරු අනුව හෙක්ටයාර 2,212.3 ක් වගාකළ ගොවීන් 2,525 ක් මුදල් සහනාධාර ලබාගැනීම සඳහා තොරතුරු ලබා දී තිබුණි. මෙම ගොවීන්ට මූල්‍ය දීමනා ගෙවීම පිළිබඳ තොරතුරු කෘ.ප.නි.ස. නිලධාරීන් සතුව නොමැති බව සඳහන් කර තිබුණි. නිලධාරීන් 03 ක් පමණක් මූල්‍යාධාර නොලැබීම පිළිබඳ තොරතුරු වාර්තා කර තිබුණු අතර එම තොරතුරු අනුව හෙක්ටයාර 5.1 ක් වගාකළ ගොවීන් 07 දෙනෙකු සඳහා මූල්‍ය දීමනාව ලෙස රුපියල් 51,000 ක මුදලක් නොලැබුණු බව සඳහන් කර තිබුණි.

**(ආ) බෙරලිහෙළ ගොවිජන සේවා මධ්‍යස්ථානය**

මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශවල වී වගා කටයුතු සඳහා බිම් සකස්කිරීම 2022 ඔක්තොම්බර් 10 සිට නොවැම්බර් 25 දක්වා කාල පරාසය තුළ සිදු කර තිබුණු අතර අස්වනු නෙලීමේ කටයුතු 2023 මැයි මාසය දක්වා සිදුකර තිබුණි. මෙම කන්නයට අදාලව ගොවීන්ට මුදල් ආධාර ලබාදීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් කෘ.ප.නි.ස නිලධාරි වසම් 07 ක ගොවීන් 688 ක ගේ දත්ත තොරතුරු පද්ධතියට ඇතුලත් කර තිබුණ ද මෙම ගොවීන්ගෙන් 666 දෙනෙකු සඳහා 2023 මැයි 31 දිනය වන විට මූල්‍ය සහනාධාර ලැබී තිබුණද ගොවීන් 12 දෙනෙකු සඳහා තවදුරටත් සහනාධාර මුදල් ලැබිය යුතුව තිබුණි.

(ඇ) ලූනම සහ අඟුණකොළපැලැස්ස යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල සහනාධාර ගෙවීම පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරීන්ට 2023 ජුනි 02 දිනැති ලිපි මගින් ප්‍රශ්ණාවලි යොමු කළද 2023 දෙසැම්බර් 20 දින දක්වා ඒ පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි. හම්බන්තොට දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් මගින් 2023 මැයි 31 දක්වා සහනාධාර ගෙවීම් ප්‍රගතිය ගොවිජන සේවා මට්ටමින් ඉදිරිපත් කරන ලෙස සිදුකළ ලිඛිත දැනුම්දීමට අදාලව වෙන් වෙන්ව තොරතුරු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොපවතින බව සඳහන් කර තිබුණි.

### 3.6.4.5 මඩකලපුව දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම

මෙම දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 59,109 ක් වගාකළ ගොවීන් 49,376 ක් සහනාධාර ලබාගැනීම සඳහා අයදුම් කර තිබුණි. දත්ත පද්ධතිය මගින් ලබාගත් තොරතුරු අනුව 2023 ජූලි 31 දිනට හෙක්ටයාර 53,130 ක වී වගාකළ ගොවීන් 41,668ක් සඳහා සහනාධාර ලෙස රුපියල් 531,296,790 ක මුදලක් ගෙවූ බව සඳහන් කර තිබුණද බැංකු ගිණුම් අංක නිවැරදි නොවීම සහ ගිණුම් අක්‍රියවීම මත 2023 ජූලි 31 දිනය වන විට ගොවීන් 1,007 කට රුපියල් 12,519,000 ක සහනාධාර මුදල් ගෙවීම් ප්‍රතික්ෂේප වී තිබූ බව නිරීක්ෂණය විය.

මඩකළපුව දිස්ත්‍රික්කයේ සමස්ථ වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම් පිළිබඳ ව්‍යාපෘති කාර්යාලයෙන් ලබාගත් තොරතුරු සහ 2023 සැප්තැම්බර් 13 මඩකලපුව දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියොජ්‍ය කොමසාරිස් මගින් ලබාගත් තොරතුරු අතර ගොවීන් 463 ක් සඳහා රුපියල් 5,763,250 ක ගෙවීම් පිළිබඳ වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| තොරතුරු මූලාශ්‍රය | සහනාධාර ගෙවූ ගොවීන් සංඛ්‍යාව | වගාකළ භූමි ප්‍රමාණය(හෙක්ටයාර) | ගෙවූ සහනාධාර වටිනාකම |
|---|---|---|---|
| ව්‍යාපෘති කාර්යාලය | 41,668 | 53,129 | 531,296,790 |
| දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් | 41,205 | 52,714 | 525,533,540 |
| **වෙනස** | **463** | **415** | **5,763,250** |

සහනාධාර මුදල් නොලැබීම පිළිබඳ පැමිණිලි 16 ක් දිස්ත්‍රික් කාර්යාලයට ලැබී තිබුණු අතර විගණනයේ දී භෞතික පරීක්ෂාවට ලක් කරන ලද මණ්ඩපත්තඩි හා කල්ලඩි ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) මණ්ඩපත්තඩි ගොවිජන සේවා මධ්‍යස්ථානය**

මණ්ඩපත්තඩි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වී ගොවීන් 5,080 ක් මුදල් සහනාධාර ලබාගැනීම සඳහා අයදුම් කර තිබුණි.මෙම ගොවීන්ගෙන් ගොවීන් 5,034 ක් සඳහා රුපියල් 70,699,000 ක මුදලක් ගෙවා තිබුණු බව 2023 ජුනි 27 දින ගොවිජන මධ්‍යස්ථානයෙන් ලබාගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය. ඒ අනුව සහනාධාර සඳහා අයදුම්කළ හෙක්ටයාර 67.4 ක් වගාකළ ගොවීන් 46 දෙනෙකු සඳහා ගෙවිය යුතු රුපියල් 674,000 ක සහනාධාර මුදල් ගෙවා නොතිබුණි.

මෙම ගොවීන් සඳහා මුදල් ගෙවීම ප්‍රතික්ෂේපවීම සඳහා පහත සඳහන් හේතු බලපා තිබූ බව නිරීක්ෂණය විය

- බැංකු ගිණුම් අක්‍රියව පැවතීම
- බැංකු ගිණුම් අංක වැරදි ලෙස ඇතුලත් දත්ත පද්ධතියට ඇතුලත් කිරීම.

**(ආ) කල්ලඩි ගොවිජන සේවා මධ්‍යස්ථානය**

කල්ලඩි ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් කෘ.ප.නි.ස වසම් 8 ක වී වගා කළ ගොවීන්ට මුදල් සහනාධාර ගෙවීම පිළිබඳව 2022 දෙසැම්බර් 24 දැනුවත් කර අවශ්‍ය දත්ත ලබාගැනීම 2023 දෙසැම්බර් 27 වන විට අවසන් කර තිබුණි. ගොවීන් 310 ක් සහනාධාර සඳහා අයදුම් කර ගොවීන් 280 ක් සඳහා සහනාධාර ලබා දී තිබුණ ද 2023 මැයි 31 දිනය වන විට මුදල් සහනාධාර නොලැබුණු ගොවීන් සංඛ්‍යාව 30 දෙනෙකු බව නිරීක්ෂණය විය.




ගොවීන් සමඟ විගණන නිලධාරී සාකච්ඡාව
2023 ජුනි 27 කල්ලඩි ගොවිජන සේවා මධ්‍යස්ථානය

(ඇ) වාකරෙයි සහ එරාවූර් යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල සහනාධාර ගෙවීම පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රාදේශිය ගොවිජන සේවා නිලධාරීන්ට 2023 ජුනි 02 දිනැති ලිපි මගින් ප්‍රශ්ණාවලි යොමු කළද 2023 දෙසැම්බර් 20 දින දක්වා ඒ පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි. එසේ වුවද මඩකලපුව නියෝජ්‍ය ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් 2023 සැප්තැම්බර් 12 දින ඉදිරිපත් කළ තොරතුරු අනුව වාකරෙයි සහ එරාවූර් යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගොවීන් 6,413 කට රුපියල් 74,113,700 ක මුදලක් අදියර දෙකකින් ගෙවා තිබුණු අතර සහනාධාර සඳහා අයදුම් කළ ගොවීන් සංඛ්‍යාව සහ ප්‍රතික්ෂේපිත ගොවීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි.

**3.6.4.6 2022/23 මහ කන්නයේ වී ගොවීන් සඳහා මුදල් සහනාධාර ගෙවීම සඳහා දිස්ත්‍රික් ගොවිජන සේවා කොමසාරිස් කාර්යාලවල දායකත්වය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ගොවිජන කොමසාරිස් වෙත ලැබෙන පැමිණිලි ප්‍රාදේශිය නිලධාරීන් වෙත යොමු කිරීම, ව්‍යාපෘතිය පිළිබඳව ගොවිජන ප්‍රාදේශිය නිලධාරී සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදු කර තිබුණි. එහෙත් සහනාධාර ගෙවීම සඳහා දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීම, වෙනස් කිරීම ඇතුළු කටයුතු සඳහා දිස්ත්‍රික් ගොවිජන කොමසාරිස් වෙත ලබා දී නොතිබුණි. අනුරාධපුරය, කුරුණෑගල සහ මඩකලපුව යන දිස්ත්‍රික් ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් පිළිවෙළින් පැමිණිලි 35ක්,30ක් සහ 16ක් ලැබී තිබුණු අතර අනෙකුත් දිස්ත්‍රික් කාර්යාලවල පැමිණිලි සුළු ප්‍රමාණයක් ලැබුණු බවත් ලිඛිත පැමිණිලි ඉතා අඩුවෙන් ලැබුණු බැවින් ඒ පිළිබඳව වාර්තා කර නොතිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය යටතේ මුදල් සහනාධාර නියමිත කාල සීමාව තුල දී ගොවීන්ට ලබාදීම සඳහා බාධාවන් ලෙස ගොවීන් විසින් ලබාදුන් තොරතුරු නිවැරදිම ඒවා බව තහවුරු කර ගැනීමට නොහැකි වීම, ලබා දී තිබූ කෙටි කාල සීමාව තුළ ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් සියලු ගොවීන්ගේ දත්ත වලට ඇතුලත් කිරීම, ඇතුලත් කළ දත්තවල නිවැරදිභාවය පරීක්ෂා කිරීම සහ වැරදි ලෙස ඇතුලත් වී ඇති දත්ත නිවැරදි කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් කාලයක් නොලැබීම, පුහුණු කාර්යමණ්ඩලයක් නොමැති වීම සංනිවේදන දූර්වලතා පැවතීම. ගොවීන් විසින් බැංකු ගිණුම්වල තොරතුරු නිවැරදිව ලබානොදීම ආදී ගැටලු පැවති බව දිස්ත්‍රික් කොමසාරිස් විසින් ලබා දී තිබූ තොරතුරු අනුව සහ විගණනයේ දී භෞතික පරීක්ෂා කිරීම්වල දී නිරීක්ෂණය විය.

(ඇ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී සම්බන්ධිත නිලධාරීන්ට උපදෙස් ලබාදීම සඳහා නිකුත්කර තිබූ චක්‍රලේඛ ප්‍රමාණය ඉතා අවම වන අතර මේ පිළිබඳව සිදුකළ විමසීම්වල දී හම්බන්තොට දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලයෙන් අංක රහිත එක් ලිපියක් නිකුත් කර තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එහි අනුමත කිරීමේ උපදෙස් ලබා දී තිබුණි. මීට අමතරව ගොවිජන සංවර්ධන නිලධාරීන් වෙත විද්‍යුත් තැපැල සහ Whatsapp මගින් උපදෙස් ලබාදීම සිදුකළ බවට කරුණු ඉදිරිපත් කර තිබුණි.

(ඈ) සහනාධාර මුදල් ඉල්ලුම් කළද ඒවා නොලැබුණු ගොවීන්ගෙන් ලැබෙන පැමිණිලි වාර්තා කිරීම සඳහා ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර ලැබුණු පැමිණිලි දුරකථනය මගින් ප්‍රධාන කාර්යාලය දැනුවත් කළ බව සඳහන් කළද ඒ සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව දිස්ත්‍රික් කොමසාරිස්වරයා දැනුවත් වී නොතිබුණි.

### 3.6.5 ප්‍රතිලාභී කළමණාකරණ දත්ත පද්ධතියක් පිහිටවීමේ අවශ්‍යතාවය

**3.6.5.1** 2002 අංක 24 දරන සුබසාධන ප්‍රතිලාභ පනතේ 27 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද 2022 ඔක්තෝබර් 20 දින 2302/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 01 දරන සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් නියෝගය පරිදි සුබසාධන ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතියක් ඉලෙක්ට්‍රොනිකව සහ අන්‍යාකාරයෙන් පිහිටුවා පවත්වාගෙන යා යුතුය. සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සුබසාධන ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයක් පිහිටවනු ලැබිය යුතු අතර එම සුබසාධන ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු ඒකකය විසින් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික පනත යටතේ සාදනු ලබන නියෝග ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික ලේඛණ සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ආකාරයෙන් සුහසාධන ප්‍රතිලාභින් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතුය.

පවතින දත්ත පද්ධතිය පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික පනත යටතේ සාදනු ලබන නියෝග ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික ලේඛණ සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ආකාරයෙන් සුහසාධන ප්‍රතිලාභින් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතු වුවද දිගු කාලයක සිට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පොහොර, ඉන්ධන, මුදල් ඇතුළු විවිධ සහනාධාර වී ඇතුලු විවිධ බෝග සහනාධාර ලබා දී තිබුණ ද වැඩ සටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා පරිඝණක දත්ත පද්ධතියක් නොතිබුණි. 2022 වර්ෂයේ දී

ආරම්භක සහ සංවර්ධන පිරිවැය රුපියල් 16,000 දරමින් GeoGoviya පරිඝණක දත්ත පද්ධතිය ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා 2023 මාර්තු 31 දක්වා දරා තිබූ සමස්ථ පිරිවැය රුපියල් 166,000 බව නිරීක්ෂණය විය. මෙමගින් වර්ෂයේ ක්‍රියාත්මක වූ සහනාධාර වැඩ සටහන් සඳහා දත්ත රැස්කිරීම පහසු වී තිබුණ ද පරිඝණක දත්ත පද්ධතිය සහනාධාර ගෙවීම් කටයුතු සඳහා කාර්යක්ෂමව යොදාගැනීම අවශ්‍යතාවයට ගැලපෙන Web Server නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) දිවයින පුරා පිහිටා තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන 556 ක ප්‍රාදේශිය නිලධාරීන් එම කාර්යාලවල අදාල විෂය පිළිබඳව කටයුතු කරන නිලධාරීන්, දිස්ත්‍රික් භාර සහකාර කොමසාරිස්වරුන් සහ ව්‍යාපෘතියට අදාල ගැටළු යොමුකරන අනෙකුත් නිලධාරීන්ට ව්‍යාපෘති කාරයාලය සමග තොරතුරු හුවමාරු කර ගැනීමට ස්ථාවර දුරකතන අංක 03 ක් හඳුන්වා දී තිබුණද ඇමතුම් ලබාගන්නා පුද්ගලයන් විසින් ලබාදෙන ඇමතුම ලබාගෙන අදාල නිලධාරින්ට යොමුකිරීමට හෝ දුරකථන ක්‍රියාකරුවෙකු හෝ ව්‍යාපෘති කාර්යාලයට අනුයුක්තව සේවයේ යොදවා නොතිබුණි. මේ හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානවල සිට වී වගාකළ ගොවීන් පිළිබඳ දත්ත ඇතුලත් කරනු ලබන නිලධාරීන්ට වෙන්කර දී ඇති සීමිත කාල සීමාවල අවශ්‍ය උපදෙස් ලබාගෙන අවශ්‍ය සංශෝධනයන් කිරීමට අවශ්‍ය උපදෙස් නියමිත කාල සීමාව තුළ ලබාගැනීමට නොහැකි වීමෙන් කාලීනව Google sheet වලට දත්ත ඇතුලත් කිරීම සහ සංශෝධනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) එක් නිලධාරියෙකු සඳහා පවරා තිබූ ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රමාණය විශාල සංඛ්‍යාවක් වීමත් දත්තවල පවතින අඩුපාඩු නිවැරදි කිරීමට ඉතා කෙටි කාලයක් ලබාදීමත් අදාල නිවැරදි කිරීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදීමත් නිසා ගොවීන්ගේ දත්ත නිවැරදි කිරීම අවස්ථා කිහිපයක දී සිදුකිරීම නිසා ගොවීන් වෙත සහනාධාර ලබාදීම ප්‍රමාදවීමට බලපා තිබුණි.

| තනතුර | 2022/12/31 දිනට තත්‍ය සංඛ්‍යාව | ඉටුකළ යුතු කාර්යය | වගකීම පවරා ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|
| සහකාර කොමසාරිස් | 01 | | දිවයින තුළ සියළු දිස්ත්‍රික්ක |
| ප්‍රාදේශිය නිලධාරී | 01 | | දිවයින තුළ සියළු දිස්ත්‍රික්ක |
| සංවර්ධන නිලධාරි | 05 | Google Sheet දත්ත යාවත්කාලීන කිරීම, දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම, පවරා | ගොවිජන සේවා මධ්‍යස්ථාන 386 |
| මධ්‍යස්ථාන | 01 | | ගොවිජන සේවා |

| | | | |
|---|---|---|---|
| කළමණාකරණ සහකාර කෘෂිකර්ම පර්. හා නිෂ්. සහකාර | 04 | ඇති දිස්ත්‍රික්වල ගැටලු නිරාකරණය කිරීම. බැංකු මගින් ප්‍රතික්ෂේපිත ගොවීන් පිළිබඳ කටයුතු කිරීම. | මධ්‍යස්ථාන 43<br>ගොවිජන සේවා මධ්‍යස්ථාන 127 |

(ඇ) වී ගොවින් මිලියනය ඉක්මවා සිටින තත්වයක් තුළ වඩා කාර්යක්ෂම සේවාවක් කාලීනව ලබාදීම සඳහා දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් ප්‍රමාණාත්ව තිබිය යුතු වුවද ව්‍යාපෘති කාර්යාලය සතුව පහත සඳහන් භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවන බවත් නිරීක්ෂණය විය.

| අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | 2023/5/31 දිනට පැවති ප්‍රමාණය | හිඟව පවතින ප්‍රමාණය 2023/05/31 |
|---|---|---|---|
| Desktop Computers | 15 | 5 | 10 |
| Laptop Computers | 06 | 04 | 02 |
| Multimedia Projector | 01 | 0 | 01 |
| Digital Screen | 01 | 0 | 01 |

**3.6.5.2 ගොවීන්ට සහනාධාර ලබාදීම සඳහා භාවිතා කරනු ලබන දත්ත පද්ධතියේ වර්තමාන තත්ත්වය හා වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය**

සීමිත භෞතික සම්පත් ප්‍රමාණයක් පැවතීම, ප්‍රමාණවත් පුහුණුවීම් නොමැතිවීම සහ තාක්ෂණික දෝෂයන් පැවතීම හේතුවෙන් සහනාධාර ව්‍යාපෘතිය පුරාවට විවිධ බාධක සහ ප්‍රායෝගික ගැටලුවලට මුහුණදෙමින් සීමිත පරිඝණක ප්‍රමාණයක් භාවිතා කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී තිබෙන අතර ඉහළ කාර්යසාධනයක් සහිත UPS සහිත පරිගණක, අවශ්‍යතාවයට ගැලපෙන වෙබ් සේවාදායකය(Web Server), වායුසමනය කරන ලද පරිසරය, ඩිජිටල් තිර වැනි භෞතික පහසුකම් මෙන්ම තොරතුරු කළමනාකරණ ඒකකයේ සේවය කරන නිලධාරීන් සඳහන් අවශ්‍යකරන පුහුණුවීම් ලබාදීම ගොවීන්ට සහනාධාර ලබාදීම ඇතුළු සේවාවන් වඩා කාර්යක්ෂම සැපයීමට අත්‍යවශ්‍යව පවතින බව නිරීක්ෂණය විය.

### 3.6.6 ස්ත්‍රී පුරුෂ සමානත්වය මත පදනම්ව ගොවි සහනාධාර ගෙවීම

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සමාජ අන්තර්කරන ක්‍රියාකාරී සැලැස්මේ වගු අංක 17 හි නිමවුම් අංක 2.1.1 අනුව වැඩසටහන සඳහා තෝරාගනු ලබන ගොවීන් 600,000 කින් අවම වශයෙන් සියයට 45 ක් එනම් 270,000 ක් කාන්තාවන් විය යුතු බව සඳහන් කර තිබුණි.

මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වී ගොවීන් සඳහා මුදල් ගෙවීමේ දී අවම වශයෙන් සියයට 45 ක් කාන්තාවන් විය යුතු බව සඳහන් කර තිබුණ ද දත්ත පද්ධතිය තුළ දත්ත ඇතුලත් කරනු ලබන Google Sheet එකෙහි ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ දත්ත ඇතුලත් කිරීම සඳහා දත්ත ක්ෂේත්‍රයක් (Data field) නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භයේ දී ඒ පිලිබඳ අවධානය යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතිය යටතේ ගොවීන් 600,000 කට ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂා කර තිබුණ ද ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ගොවීන් මිලියනයකට වැඩි ප්‍රමාණයක් අයදුම් කර තිබුණි. දත්ත පද්ධතිය අනුව ප්‍රතිලාභ ලබාගත් ගොවීන් 1,051,807 කගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතයෙන් විගණන කටයුතු සඳහා විශ්ලේෂණය කර ලබාදුන් තොරතුරු අනුව ගොවීන් 357,564 ක් එනම් සියයට 34 ක් කාන්තාවන් බව නිරීක්ෂණය විය. ඒ අනුව වගාකටයුතුවල යෙදුණු හා තොරතුරු ඉදිරිපත් කළ ගොවීන්ගෙන් කාන්තා ප්‍රතිශතය සියයට 11 කින් පමණ අඩු බව නිරීක්ෂණය විය.

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී සියයට 45 ක් කාන්තා ගොවීන් විය යුතු බවට වන නිර්ණායකය සපුරා තිබු එකම දිස්ත්‍රික්කය මඩකලපුව වන අතර එහි වී වගා කටයුතුවල නිරත කාන්තා නියෝජනය සියයට 52.7 ක් බව නිරීක්ෂණය විය. දමිළ ජනතාව වැඩි වශයෙන් ජීවත් වන දිස්ත්‍රික්ක තුළ කාන්තා ගොවින්ගේ ප්‍රතිශතය ඉහළ අගයක් ගැනීමට ඔවුන්ගේ සංස්කෘතියෙහි පවතින කාන්තාවන් සඳහා කුඹුරු ඉඩම් ලබා දීමේ විශේෂ ලක්ෂණය හේතු වී ඇති බව ගොවින් සමග සිදුකළ සාකච්ඡාවල දී නිරීක්ෂණය විය.





මණ්ඩපත්තඩි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී පැවති ගොවි හමුව

2023 ජුනි 27

### 3.6.7 2019 සිට 2023 දක්වා මහ කන්නවල වී අස්වැන්න සහ වී ගොවීන්ට මුදල් ආධාර ලබාදීම, වී අස්වැන්න කෙරෙහි සමස්ථ බලපෑම

(අ) ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ සහාය ඇතිව ප්‍රධාන වගා කන්න දෙක වන යල හා මහ කන්නවල වී අස්වැන්න ඇස්තමේන්තු කරනු ලබයි. 2019 සිට 2022 දක්වා මහ කන්න වල වගාබිම් ප්‍රමාණය හා කපාගත් බිම් ප්‍රමාණය මත දිස්ත්‍රික්ක 25 හි අස්වැන්න පහත පරිදි ඇස්තමේන්තු කර තිබුණි.

| වර්ෂය | වගා කන්නය | වගාබිම් ප්‍රමාණය (හෙක්ටයාර) | මුළු අස්වැන්න (මෙ.ටො) |
|---|---|---|---|
| 2019 | 2019/20 මහ | 663,041 | 3,196,752 |
| 2020 | 2020/21 මහ | 681,521 | 3,061,394 |
| 2021 | 2021/22 මහ | 685,164 | 1,931,230 |

මෙම දත්ත අනුව 2019 සිට 2021 දක්වා කාල සීමාව තුළ වගාකළ මහ කන්න 3 හි වගාබිම් ප්‍රමාණය පිළිවෙළින් හෙක්ටයාර 663,041 සිට 685,164 දක්වා සියයට 3.3 ක් දක්වා වැඩි වී තිබුණද වී අස්වැන්න මෙට්‍රික්ටොන් 3,196,752 සිට 1,931,230 දක්වා සියයට 39 කින් අඩු වී තිබුණි.

(ආ) මුදල් සහනාධාර ලබාදුන් 2022/23 මහ කන්නයට අදාලව වගාකළ බිම් ප්‍රමාණය සහ අස්වනු නෙලාගත් බිම් ප්‍රමාණය පිළිබඳ දිස්ත්‍රික්ක 25 ට අදාල සම්පූර්ණ දත්ත ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවට ලැබී නොතිබූ බැවින් 2023 අගොස්තු 23 දිනය වන විටද සමස්ථ අස්වැන්න ඇස්තමේන්තු කර නොතිබුණි. එසේ වුවද තොරතුරු ලැබී තිබූ දිස්ත්‍රික්ක 9 හි වගාබිම් ප්‍රමාණය 2021/22 මහ කන්නයට සාපේක්ෂව සියයට 9 කින් වර්ධනය වී තිබූ බව නිරීක්ෂණය විය.

| දිස්ත්‍රික්කය | 2021/22වගාබිම් ප්‍රමාණය (හෙක්.) | 2022/23වගාබිම් ප්‍රමාණය (හෙක්.) | බිම් ප්‍රමාණයේ වැඩිවීම(හෙක්.) |
|---|---|---|---|
| කොළඹ | 3,830 | 4,189 | 359 |
| මාතර | 13,685 | 14,383 | 698 |
| යාපනය | 11,127 | 11,407 | 280 |
| වව්නියාව | 18,859 | 23,503 | 4,644 |
| මූලතිව් | 19,990 | 25,652 | 5,662 |
| කිළිනොච්චිය | 27,403 | 27,883 | 480 |
| මඩකළපුව | 66,520 | 71,477 | 4,957 |
| ත්‍රිකුණාමලය | 39,650 | 48,765 | 9,115 |
| අනුරාධපුරය | 116,969 | 119,864 | 2,895 |
| **එකතුව** | **318,033** | **347,123** | **29090** |

(ඇ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ Geogoviya දත්ත පද්ධතිය අනුව 2022/23 මහ කන්නයේ වී වගාකර තිබූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 760,498 ක් වන අතර එය ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් 2021/22 මහ කන්නයේ වී වගාකළ බිම් ප්‍රමාණය පිළිබඳ වාර්තා කර තිබූ හෙක්ටයාර 685,164 බිම් ප්‍රමාණයට සාපේක්ෂව සියයට 11 කින් වර්ධනය වීම කෙරෙහි වී වගාව සඳහා මුදල් සහනාධාර ලබා දීම සහ වගා කටයුතු සඳහා බල පෑ අනෙකුත් හිතකර සාධක බල පා තිබෙන බව නිරීක්ෂණය වේ.

### 3.6.8 සහනාධාර ගෙවීම පිළිබඳව පවතින පොදු අඩුපාඩු

#### (අ) ගොවිදිරිය ගිණුම් මගින් සහනාධාර ගෙවීම

2018 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවීන්ට සහනාධාර ගෙවීමේ දී භාවිතා කිරීම සඳහා මහජන බැංකුව සමග ඇතිකරගත් එකඟතාවයක් අනුව රුපියල් 500 ක ආරම්භක තැන්පතුවක් යොදාගෙන බැංකු ගිණුම් ආරම්භ කරන ලෙස ගොවීන්ට දැනුම් දී තිබුණි. එසේම මෙම ගිණුම් අවලංගු කිරීමකින් තොරව දීර්ඝකාලීනව පවත්වාගෙන යාමට බැංකුව සමග එකඟ වී තිබුණි. මෙම සහනාධාර වැඩ

සටහනේ දි ගොවීන්ගේ බැංකු ගිණුම් විස්තර ලබාදීමේ දී ගොවි දිරිය ගිණුම් අංකය ලබාදෙන ලෙස ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෘ.ප.නි.ස. නිලධාරීන්ව දැනුවත් කිරීමෙන් අනතුරුව එම නිලධාරීන් විසින් එම ගිණුම් විස්තර ලබාදෙන ලෙස ගොවීන්ව දැනුවත් කර තිබුණි.

ඒ අනුව ගොවීන් විසින් ගොවිදිරිය බැංකු ගිණුම් විස්තර ලබා දී තිබුණි. 2018 වර්ෂයෙන් පසුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවීන්ට මුදල් සහනාධාර ලබානොදීම සහ ගොවීන් විසින් මෙම ගිණුම ගණුදෙණු සඳහා භාවිතා නොකිරීම හේතුවෙන් ගිණුම් අක්‍රියව පැවතීමෙන් ගොවීන් විශාල ප්‍රමාණයක සහනාධාර අදාල බැංකු ගිණුම්වලට බැර වී නොතිබුණි.

**(ආ) සහනාධාර මුදල් අයදුම් කළ ගොවීන්ගෙන් මුදල් ලැබීම පිළිබඳ තහවුරු කරගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.**

වී ගොවීන්ට මුදල් සහනාධාර ගෙවීම සඳහා වී වගාකළ ගොවීන් පිළිබඳව දත්ත ඇතුලත් කිරීමේ වගකීම ගොවිජන සේවා මධ්‍යස්ථානය භාර ප්‍රාදේශිය නිලධාරී වෙත පැවරී තිබුණද සහනාධාර ලබාගැනීම සඳහා දත්ත ඇතුලත් කළ ගොවීන්ගෙන් කොපමණ ගොවීන් ප්‍රමාණයකට මුදල් සහනාධාර ලැබුණේ ද පරීක්ෂා කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. දත්ත පද්ධතියට ඇතුලත් කරනු ලබන දත්ත සැකසීම සිදු කරනු ලබන ව්‍යාපෘති කාර්යාලය මගින් ගෙවීම ප්‍රතික්ෂේප වූ ගොවීන්ගේ නාම ලේඛණය පමණක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබාදීම සිදුවේ. ඒ අනුව මුදල් සහනාධාර ලබාගත් ගොවීන් සංඛ්‍යාව පිලිබඳ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රාදේශිය නිලධාරී හෝ කෘ.ප.නි.ස. නිලධාරීන් දැනුවත් වී නොමැති බව එම නිලධාරීන් සමග සිදුකළ සාකච්ඡාවේදී නිරීක්ෂණය විය.

**(ඇ) බැංකු ගිණුමට මුදල් බැර කිරීමට පෙර ගෙවීම් කළ බවට ගොවියාගේ ජංගම දූරකතනයට කෙටි පණිවිඩයක් යැවීම**

සහනාධාර ගෙවීම් වවුචරය පිළියෙළ කිරීම අවසන් කළ පසු ගොවීන්ගේ බැංකු ගිණුම්වලට මුදල් බැරකළ බව සඳහන් කරමින් ව්‍යාපෘති කාර්යාලයේ දත්ත පද්ධතිය මගින් ගොවීන්ගේ ජංගම දූරකතන අංකයට කෙටි පණිවිඩයක් යවනු ලබුවද විවිධ අඩුපාඩු හේතුවෙන් බැංකුව විසින් Slip Run නොකර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයට ආපසු එවීම හේතුවෙන් ගොවීන්ගේ බැංකු ගිණුම්වලට මුදල් බැරවීම සිදු නොවන බව නිරීක්ෂණය විය. කෙටි පණිවිඩය මගින් ලැබුණු තොරතුරු අනුව මුදල් ලබාගැනීම සඳහා බැංකුවට ගිය ගොවීන්ට මුදල්

ලබාගැනීමට නොහැකිවීමෙන් අපහසුතාවයට පත් වූ අවස්ථා පවතින බව විගණනයේ දී ලබාගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

**(ඇ)** 2022/23 මහ කන්නයේ වී වගාකළ ගොවීන් සඳහා හෙක්ටයාරයකට රුපියල් 10,000 ක් වන සේ මුදල් සහනාධාරයක් වී වගාකළ ගොවීන් සඳහා අනුපාතිකව ගෙවීම සිදු වූ වන බැවින් හෙක්යටයාර 0.2 ක් වගාකළ ගොවියෙකුට ලැබෙන මුදල රුපියල් 2000 කි. මෙම මුදල අදාල ගොවියාගේ බැංකු ගිණුමට බැර කරන අවස්ථාව වන විට ගොවීන්ගේ බැංකු ගිණුම් අක්‍රියව පැවතීම නිසා ගිණුම් සක්‍රිය කිරීමට නැවත මුදල් තැන්පත් කළ යුතු බැවින් හා අදාල සංශෝධිත තොරතුරු ඉදිරිපත් කළයුතුව පැවති බැවින් ඇතැම් ගොවීන් මුදල් සහනාධාර ලබාගැනීම ප්‍රතික්ෂේප කර තිබූ අතර එය මුදල් සහනාධාර ලබාදීමට නොහැකි වීමට හේතු වූ බව කෘ.ප.නි.ස.නිලධාරින් මගින් ලබාගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

## 3.7 ප්‍රතිලාභ සමෘද්ධි බැංකු මගින් ගෙවීමේ කාර්යක්ෂමතාවය

### 3.7.1 ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීම

ප්‍රතිලාභීන්ට මූල්‍යාධාර ගෙවීමේ දී සමෘද්ධි බැංකු හා රජයේ බැංකු හරහා ගෙවීම් සිදු කිරීමට තීරණය කිරීම, සමෘද්ධි බැංකු තුළ මෙහෙයුම් කටයුතු manual ලෙස සිදු කිරීම, ප්‍රතිලාභ ගෙවීම සඳහා භාවිතා කළ ක්‍රමවේද සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ දී පහත තත්ත්වය නිරීක්ෂණය විය.

| අනු අංකය | ප්‍රතිලාභීන් වර්ගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිලාභ ගෙවීමට පෙර භාවිතා කළ ක්‍රමය | | | | | ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිලාභ ගෙවූ ක්‍රමය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගෙවූ ක්‍රමය | ශාඛා ගණන | ATM කිරීම | පරිගණකගත ගිණුම් ක්‍රමය ශාඛාතය | පාස්පොත පරිගණකගත් මුද්‍රණය කිරීම | ගෙවූ ක්‍රමය | ශාඛා ගණන | ATM කිරීම | පරිගණකගත ගිණුම් ක්‍රමය ශාඛාතය | පාස්පොත පරිගණකගත් මුද්‍රණය කිරීම |
| 01. | සමෘද්ධිලාභීන් (ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව ස්ථිර හා පොරොත්තුගත සංඛ්‍යාව) | 2,490,000 | සමෘද්ධි බැංකු මගින් | 1090 | නැත | 1024 | 891 | සමෘද්ධි බැංකු මගින් | 1090 | නැත | 1024 | 891 |
| 02. | වැඩිහිටි පුද්ගලයන් (ව්‍යාපෘති පරිපාලන අත්පොත ස්ථිර හා | 660,000 | තැපැල් කාර්යාලය මගින් | 3995 | නැත | නැත | නැත | සමෘද්ධි බැංකු මගින් | 1090 | නැත | 1024 | 891 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පොරොත්තුගත සංඛ්‍යාව) | | | | | | | | | | | |
| 03. | ආබාධිත තැනැත්තන් හා වකුගඩු රෝගීන් (ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව ස්ථිර හා පොරොත්තු සංඛ්‍යාව) | 180,000 | රාජ්‍ය බැංකු මගින් | 1926 | ඇත | ඇත | ඇත | සමෘද්ධි බැංකු මගින් | 1090 | නැත | 1024 | 891 |
| 04. | ගර්භණී හා කිරිදෙන මවුවරුන් (ප්‍රතිලාභ ගෙවා ඇති සංඛ්‍යාව) | 153,320 | මුලින් මුදලින් ප්‍රතිලාභ ගෙවා නොමැත | | | | | සමෘද්ධි බැංකු මගින් | 1090 | නැත | 1024 | 891 |

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර ව්‍යාපෘතිය යටතේ අදාල ප්‍රතිලාභීන් වර්ග 4ක් වෙනුවෙන් ප්‍රතිලාභීන් 3,486,449ක් (මිලියන 3ක ආසන්න) සඳහා ප්‍රතිලාභ ගෙවීමට සමෘද්ධි බැංකුව වෙත යොමු කිරීමේදී, ඉහත බැංකු වල ප්‍රතිලාභීන්ට පහසුවෙන් මුදල් ලබාගත හැකි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (Automated Teller Machine) නොතිබීම, බැංකු 66 ක පරිගණක පද්ධතියක් හරහා ගිණුම් කටයුතු සිදු නොවීම, බැංකු 199 ක පරිගණක පද්ධතිය හරහා පාස් පොත් මුද්‍රණය නොවීම නිසා ප්‍රතිලාභීන් හා බැංකු නිලධාරීන් වෙහෙසට හා කලකිරීමට පත්වී තිබුණි. ඉහත කරුණු අනුව ඉහත ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් මිලියන 3කට ආසන්න ප්‍රමාණයකට අදාළ ප්‍රතිලාභ කාලීනව නිසි ක්‍රමවේදයක් හරහා හා ව්‍යාපෘති අරමුණු ඉටු වන ආකාරයට සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

### 3.7.2 පරිගණක මෘදුකාංග භාවිතයෙන් බැංකු මෙහෙයුම් කටයුතු සිදු කිරීම

ගනුදෙනුකරුවන්ගේ සහ බැංකු කටයුතු වේගවත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා සමෘද්ධි බැංකු තුළ ක්‍රියාත්මක SLTS හා SOFTWATCH පරිගණක මෘදුකාංග තුළ මොඩියුල් ස්ථාපිත කිරීම අවසන් කර නොතිබීම හේතුවෙන් 2023 මැයි 18 දිනට සමෘද්ධි බැංකු පරිගණක ගත කිරීමේ ප්‍රගතිය දැක්වෙන වාර්තාවේ සඳහන් කරුණු හේතුවෙන් සමෘද්ධි බැංකු තුළ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදු කර ගැනීම හා වඩාත් ඵලදායී සේවාවක් සේවා දායකයින්ට ලබා දීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

#### 3.7.2.1 පරිගණක මෘදුකාංග භාවිතයෙන් ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර කිරීම

(අ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 අප්‍රේල් 25 වැනි දින පැවති රජයේ ගිණුම් කාරක සභා රැස්වීමේ දී කාරක සභාව විසින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ වර්තමාන ප්‍රගතිය දැක්වෙන වාර්තාව දැක්වෙන තොරතුරු අනුව සමෘද්ධි බැංකු පරිගණක ගත කර අන්තර්ජාලය හරහා සේවා සැපයීම පිළිබඳ වැඩසටහන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සමෘද්ධි බැංකු පරිගණක ගත කිරීමේ ප්‍රගතිය දැක්වෙන වාර්තාව අනුව 2023 මැයි 18 දිනට දිවයින පුරා පිහිටි සමෘද්ධි බැංකු පද්ධතිය තුල ක්‍රියාත්මක සමෘද්ධි බැංකු 1090 අතුරින් පරිගණක පද්ධතිය හරහා ගණුදෙනු සිදු කරන බැංකු 1024 පවතින බවත් ඒ තුලින් ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට සහනාධාර බැර කිරීම සිදු කරන බවත් දක්වා තිබුණි. ඒ පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු පහත පරිදි වේ

| දිස්ත්‍රික්කය | බැංකු ගණන | පරිගණක පද්ධතිය තුලින් ගණුදෙනු කරන බැංකු | පරිගණක පද්ධතිය තුලින් සහනාධාර බැර කිරීම සිදු කරන බැංකු | පරිගණක පද්ධතිය තුලින් පාස් පොත් මුද්‍රණය සිදු කල හැකි බැංකු |
|---|---|---|---|---|
| කොළඹ | 42 | 39 | 39 | 38 |
| කළුතර | 56 | 56 | 56 | 56 |
| ගම්පහ | 88 | 84 | 84 | 84 |
| මහනුවර | 91 | 90 | 90 | 85 |
| නුවරඑළිය | 38 | 32 | 32 | 32 |
| මාතලේ | 40 | 35 | 35 | 35 |
| අනුරාධපුර | 55 | 55 | 55 | 44 |
| අම්පාර | 45 | 42 | 42 | 42 |
| ත්‍රිකුණාමලය | 21 | 18 | 18 | 15 |
| කුරුණෑගල | 120 | 111 | 111 | 110 |
| මඩකලපුව | 31 | 31 | 31 | 31 |
| පුත්තලම | 49 | 48 | 48 | 48 |
| කිලිනොච්චිය | 8 | 8 | 8 | 8 |
| මන්නාරම | 10 | 10 | 10 | 10 |
| යාපනය | 33 | 33 | 33 | 32 |
| මුලතිව් | 10 | 10 | 10 | 10 |
| වවුනියාව | 10 | 9 | 9 | 9 |
| පොළොන්නරුව | 22 | 21 | 21 | 21 |
| මොණරාගල | 27 | 23 | 23 | 17 |
| මාතර | 50 | 47 | 47 | 20 |
| කෑගල්ල | 45 | 34 | 34 | 16 |
| ගාල්ල | 69 | 68 | 68 | 65 |
| බදුල්ල | 42 | 38 | 38 | 4 |
| හම්බන්තොට | 42 | 38 | 38 | 15 |
| රත්නපුර | 46 | 44 | 44 | 44 |
| එකතුව | 1090 | 1024 | 1024 | 891 |

*මූලාශ්‍රය : සමෘද්ධි බැංකු පරිගණක ගත කිරීමේ ප්‍රගති වාර්තාවේ ඇමුණුම අංක 03-1*

දිවයින පුරා ක්‍රියාත්මක වූ මෙම මූල්‍යාධාර වැඩසටහන හරහා කඩිනමින් ප්‍රතිලාභීන් සඳහා මුදල් ගෙවීම අපේක්ෂා කල අතර මෘදුකාංග භාවිතයේ දී ලබා ගත හැකිව තිබූ පහසුකම් නොතිබීම හේතුවෙන් ප්‍රතිලාභීන්ට කාර්යක්ෂමව ප්‍රතිලාභ ලබා දීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය කෙරේ.

(ii) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017 මාර්තු 31 දිනැති ගිණුම් චක්‍රලේඛ අංක 8/2017 හි 5.2 අනුව සහනාධාර අදාළ ප්‍රතිලාභී ගිණුම් වලට බැර කිරීම අදාළ මාසයේ මුදල් ලැබී දින 03ක් ඇතුලත කළ යුතු බව දක්වා ඇත. ඒ අනුව ආසියානු බැංකු සහනාධාර ඉහත නිර්ණායක යටතේ අදාළ ප්‍රතිලාභීන් වෙත කාලීනව ලබා දීමට ගණුදෙණු අතින් සටහන් කිරීම මගින් නොහැකි වී ඇත. ඒ අනුව ඉහත වැඩසටහනේ කාර්යක්ෂමතාවය හා ඵලදායකත්වයට මෙයින් බලපෑමක් සිදු වී ඇත.

(ආ) සමෘද්ධි බැංකු පරිගණක ගත කිරීමේ ප්‍රගති වාර්තාවේ දැක්වෙන ඇමුණුම 3 පරිදි 2023 මැයි 18 දිනට module ලෙස අවසන් කර නොමැති බැංකු පිළිබඳ ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව පහත නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

(i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ට අදාළ පහත වගුවේ දැක්වෙන සමෘද්ධි බැංකු තුල සන්නිවේදන සංඥා නොමැති වීම හේතුවෙන් ප්‍රතිලාභීන්ට මුදල් බැර කිරීම කඩිනමින් සිදු කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව පරිගණක මෘදුකාංගය හරහා කාර්යක්ෂම ප්‍රතිලාභීන් සඳහා මුදල් ලැබීම සිදු වී නොතිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සමෘද්ධි බැංකුව |
|---|---|
| ගිරිබාව | වරා වැව, දම්සෝපුර |
| අඹන්පොළ | බොරවැව |
| පොල්පිතිගම | කළුගල්ල, මඩහපොළ, මොරගොල්ලාගම |
| පඩුවස්නුවර නැගෙනහිර | මූණමල්දෙණිය |
| රිදීගම | දෙල්විට |

(ii) හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අදාල පහත වගුවේ සඳහන් සමෘද්ධි බැංකු තුල ස්ථාපිත සොෆ්ට් වොච් පරිගණක මෘදුකාංගය සඳහා එම බැංකුවල පවතින පැරණි පරිගණක වැඩසටහනින් පිටපතක් ගෙන නව පරිගනක වැඩසටහන ඇතුලත් කර බැංකු කටයුතු සිදු කරනු ලබයි. මෘදුකාංගයට අදාළ module අවශ්‍ය පරිදි සිථාපිත නොකිරීම තුල බැංකු කාර්ය මණ්ඩලයට අනවශ්‍ය කාලයක් ඒ වෙනුවෙන් දැරීමට සිදු වන බව නිරීක්ෂණය විය. ඒ අනුව පරිගණක මෘදුකාංග කාර්යක්ෂමව හා ඵලදායී භාවිතය ප්‍රමාණවත් අයුරින් සිදු නොවන බව නිරීක්ෂණය විය.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සමෘද්ධි බැංකු ශාඛාව |
|---|---|---|
| හම්බන්තොට | අඟුණකොළපැලැස්ස | අඟුණකොළපැලැස්ස |
| | | තලාව |
| | | උඩයාල |
| | අම්බලන්තොට | බෝලාන |
| | | හුංගම |
| | | නෝනගම(2023 මැයි 02 භෞතික පරීක්ෂාවේ දී අනාවරණය විය) |
| | කටුවන | කටුවන |
| | | මැදකන්ද |
| | | වැලිපිටිය |

(iii) මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල හා සෙවණගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් කොටගම, ළිඳ කුඹුර, දොඩම්ගොල්ල හා සෙවණගල සමෘද්ධි බැංකු තුල ක්‍රියාත්මක මෘදුකාංගයන්ගේ ක්‍රියාකාරීත්වය විවිධ අවස්ථාවන්හිදී මන්දගාමී වීම හේතුවෙන් කාර්යක්ෂමව සහනාධාර ප්‍රතිලාභීන්ට ලබා දීම ගැටළු සහගත විය.

(iv) මොණරාගල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක සමෘද්ධි බැංකු 27න් 23ක් පරිගණක පද්ධතිය තුලින් ගණුදෙනු සිදු කරන අතර මොණරාගල දිස්ත්‍රික් සමෘද්ධි අභ්‍යන්තර විගණන අංශයෙන් බැංකු පරිගණක ගත කිරීමේ වැඩසටහන පිළිබඳ ඉදිරිපත් කළ තොරතුරු අනුව බැංකු තුල අන්තර්ජාල පහසුකම් නොමැති වීම, අන්තර්ජාල පහසුකම් මන්දගාමී වීම, පරිගණක මෘදුකාංග ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් රතුගල, සියඹලාණ්ඩුව, හම්බෙගමුව හා තණමල්විල බැංකු තුළ පරිගණක පද්ධතිය හරහා ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර කිරීම සිදු නොවී තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන්ට කඩිනමින් මුදල් ලබා දීම ගැටළු සහගත වී තිබූ බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් බැංකු මෙහෙයුම් කටයුතු පරිගණක මෘදුකාංග හරහා කාර්යක්ෂමව, කාලීනව සිදු කිරීමෙන් සුහදශීලී ගණුදෙනුකාර සේවාවක් ලබා දීම සතුටුදායක මට්ටමින් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

### 3.7.2.2 ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර කිරීම භෞතික පරීක්ෂාව

(අ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක DSD/SCBBU/21/2022/03/XVII හා 2023 පෙබරවාරි 23 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිදි සියළුම සමෘද්ධි බැංකු, පරිගණක මෘදුකාංග ඇසුරෙන් ගණුදෙනු සිදු කරන බවත්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙන් යොමු කරන සියළුම සහනාධාර සෘජුව සමෘද්ධි බැංකු ගිණුමට යොමු කරන බවත් ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර කිරීමක් සිදුවන

බව දක්වා තිබුණද තණමල්විල සමෘද්ධි බැංකු ගිණුම් හිමියන්ගේ ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ හස්ත ක්‍රමයට (Manual) බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) තණමල්විල සමෘද්ධි බැංකුව තුල පරිගණක මෘදුකාංග භාවිතයෙන් ගනුදෙනු කිරීම සිදු නොවූවත් බැංකුව තුල Soft Watch පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 2020 වර්ෂයේ සිට විවිධ කාලවකවානුවල ක්‍රියාමාර්ග ගෙන තිබූ බව බැංකු කළමනාකරුගේ පැහැදිලි කිරීම් අනුව නිරීක්ෂණය විය. එම මෘදුකාංගය වෙනුවෙන් සහාය හා නඩත්තු සේවා සැපයීම සඳහා පෞද්ගලික ආයතනයක් සමග 2022 – 2025 කාලය සඳහා ගිවිසුම් ගත වී තිබූ අතර 2022 වර්ෂය වෙනුවෙන් බැංකුව විසින් ඒ සඳහා රු. 46,502ක් ගෙවා තිබුණි. 2022 ඔක්තෝම්බර් 26 දිනැති හා අංක DSD/HO/05/MF/01/චක්‍රලේඛය අනුව මෙම මෘදුකාංග පද්ධතිය බැංකුව තුල පවත්වාගෙන යාමේ අරමුණු වශයෙන් සමෘද්ධි බැංකු මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධිත ගිණුම් ක්‍රියාවලිය පහසු කිරීම හා කාර්යක්ෂම කිරීම බව දක්වා තිබුණද ඉහත දත්ත පද්ධතිය පවත්වාගෙන යාමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.8 තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් සමඟ ව්‍යාපෘති අරමුණු ගැලපීම

තිරසර සංවර්ධනය යනු අනාගත පරම්පරාවන්ට සිය අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාව අනතුරේ හෙලීමෙන් තොරව වර්තමානයේ අවශ්‍යතා සපුරා ගන්නා සංවර්ධනයයි. මෙහිදී රටක තිරසර සංවර්ධනය කරා ගමන් කිරීමට ආර්ථික සාමාජීය හා පාරිසරික අරමුණ එකට එකතු විය යුතුය.

මේ සඳහා ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනයට අදාල නෛතික ප්‍රතිපාදන යටතේ 2017 අංක 19 දරන ජාතික තිරසර සංවර්ධන පනත සම්මත කර ඇත. එම පනතේ 11 වගන්තිය ප්‍රකාරව සෑම අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් තම විෂය පථයට අදාලව තිරසර සංවර්ධන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපක්‍රමයට අනුකූලව තිරසර සංවර්ධන උපක්‍රමය පිළියෙල කල යුතු බව දක්වා ඇත. 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ වගන්ති අංක 10 හි “ඉ” යටතේ තිරසර සංවර්ධන සභාව විසින් තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යාන්ත්‍රණය සහ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා දත්ත ද්වාරයක් (Digital Portal) සකස් කර ඇත. ඒ අනුව අදාල රාජ්‍ය ආයතන විසින් තම විෂය පථයට අදාල අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඒවාට අදාල දර්ශක සකස් කර ඒවායේ ප්‍රගතිය ඉහත දත්ත ද්වාරයට ලබා දීම මගින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ප්‍රගතිය නිරීක්ෂණය කල හැකිය. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනඅරමුණු හා ඉලක්ක කරා ළඟා වීමේ ප්‍රගතිය (2023 ජූලි 05 දිනට) ඇමුණුම 09 දක්වාඇත.

## 3.9 ව්‍යාපෘති නියාමන කාර්යයන්

### 3.9.1 ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන අතර උපාය මාර්ගික සහ ප්‍රතිපත්තිමය දිශානතීන් සහ මගපෙන්වීම් සැපයීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කර තිබුණි. මුදල් අමාත්‍යාංශයේ ලේකම් මෙහි මුලසුන හොබවන අතර භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ව්‍යාපෘති කළමනාකරණ සහ නියාමන දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

ව්‍යාපෘති පරිපාලන අත්පොත ප්‍රකාරව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත පැවරී ඇති කාර්යභාරයන් සහ වගකීම් පහත පරිදි වේ.

i. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත උපායමාර්ගික සහ ප්‍රතිපත්තිමය උපදෙස් සහ මාර්ගෝපදේශ සැපයීම.
ii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සහ කළමනාකරණයේදී විධායක නියෝජිත ආයතනය (Executing) සහ ක්‍රියාත්මක කරන ආයතන (Implementing) අතර සම්බන්ධීකරණය සිදු කිරීම.
iii. කාර්තුමය ව්‍යාපෘති සැලසුම් සමාලෝචනය කර අනුමත කිරීම.
iv. අනුමැතිය සඳහා ඒකාබද්ධ කාර්තුමය අයවැය අවශ්‍යතා සමාලෝචනය කර නිර්දේශ කිරීම.
v. ව්‍යාපෘති නිමැවුම් සහ ක්‍රියාකාරකම්වල කාලානුරූප කාර්යසාධන සමාලෝචන සිදු කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට සහ ව්‍යාපෘති කළමනාකරණ ගැටළු විසඳීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම.
vi. විගණන නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළුව මූල්‍ය කළමනාකරණයේ කිසියම් දුර්වලතාවයක් පවතී නම් සමාලෝචනය කර විධායක නියෝජිත ආයතනය (Executing) සහ ක්‍රියාත්මක කරන (Implementing) ආයතන විසින් ගත යුතු නිවැරදි ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

මෙම ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘති ගිවිසුම 2022 සැප්තැම්බර් මස 09 දින අත්සන් තබා ඇති අතර ප්‍රතිලාභී කාණ්ඩ වෙත මූල්‍ය දීමනා ලබාදීම 2022 ඔක්තෝම්බර් මස සිට ආරම්භ කර තිබේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත (Project Administration Manual) ප්‍රකාරව මෙම කමිටුව පළමු මාස තුන සඳහා මසකට වරක් බැගිනුත් ඉන් අනතුරුව කාර්තුවකට වරක් බැගිනුත් රැස්වන බව දක්වා තිබේ. එසේ වුවත් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි දැක්වෙන අවශ්‍යතාවයන් ප්‍රකාරව 2022 වර්ෂය තුල එකදු අවස්ථාවක හෝ

රුස්වී නොමැති අතර පළමුවර රුස්වී තිබෙන්නේ 2023 වර්ෂයේ පෙබරවාරි 21 දින වේ. එහිදී ගන්නා ලද තීරණයන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති යෝජනා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙහි නිර්දේශයන් සඳහා ඉදිරිපත් කල යුතු බවත් එම නිර්දේශයන් ලැබීමෙන් පසු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතනය විසින් තම කාර්තුමය ව්‍යාපෘති සැලසුම් තුලට ඇතුළත් කළ යුතු බව හා අනුමැතිය සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කිරීම කල හැකි බව දක්වා තිබුණි. එසේ වුවත් මෙම තීරණය සඳහා එළඹෙන අවස්ථාවේදී 2022 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතියෙහි ණය මුදලින් ලැබී තිබූ රුපියල් 62,311,741.96ක මුදලින් රුපියල් 55,930,396,478ක මුදලක් හෙවත් සියයට 90ක ප්‍රමාණයක් ගෙවීම් කර තිබුණි.

(ආ) එසේම විගණනයේදී ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව තොරතුරු ලබාගැනීමේදී 2022 වර්ෂයේ තුන්වන කාර්තුවේ අවසන් මාසය සහ හතරවන කාර්තුව වෙනුවෙන් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොමැති බවත් නිරීක්ෂණය කරන ලදී.

.

### 3.9.2.ව්‍යාපෘතියේ කාර්යසාධන දර්ශක ප්‍රගතිය

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි අංක 70හි (වගුව 18) ව්‍යාපෘති සැලසුම් හා නියාමන රාමුව දක්වා ඇත. ඒ අනුව අදාළ ප්‍රතිඵලය නිමයුම් හා අවධානමට ලක්වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය සංවර්ධනයේ ප්‍රගතිය පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රතිඵල දාමය | දර්ශකය | දත්ත මූලාශ්‍රය හා වාර්තා ක්‍රමවේදය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01. | ප්‍රතිඵලය (Out Come) දුප්පත් හා අවධානමට ලක්වන පුද්ගලයන්ගේ ආහාර සුරක්ෂිතතාවය (විශේෂයෙන් කාන්තාවන් හා ළමයින්ගේ) ඇති කිරීම | 01. ආහාර අනාරක්ෂිතතාවය සියයට 30කින් අඩු කිරීම (පදනම 2022 වර්ෂය පුද්ගලයන් මිලියන 3.26කි.) | ආහාර සුරක්ෂිතතා ප්‍රගතිය ගණනය කිරීම ශ්‍රී ලංකා රජය හෝ සංවර්ධන පාර්ශවකරුවන් 2024 හෝ 2025 දී කළ යුතුයි. | ආහාර සුරක්ෂිතතා ප්‍රගතිය ගණනය කිරීම ශ්‍රී ලංකා රජය හෝ සංවර්ධන පාර්ශවකරුවන් 2024 හෝ 2025 දී කළ යුතුයි. |
| | | 02. මහ කන්නය (2022 සැප්තැම්බර් - 2023 | ජන සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ | 2021 – 2022 මහ වගා බිම් ප්‍රමාණය |

| | | | | |
|---|---|---|---|---|
| | | මාර්තු) ඉහළ ඵලදාව සහිත කලාපවල ඉඩම් සියයට 80ක් වගා කිරීම (පදනම 2022 වර්ෂයේ වගා කළ ඉඩම්වලින් සියයට 73ක් වගා කිරීමට බලාපොරොත්තු වීම) | දත්ත | හෙක්ටයාර් 685,164 කි. 2022–2023 මහ දත්ත ප්‍රකාශයට පත්කර නොමැති බැවින් ප්‍රගතිය මැනීමට නොහැක. |
| | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු දත්ත | 2021-2022 මහ කන්නයේ දත්ත නොමැති අතර 2022-2023 මහ කන්නය Geo Goviya දත්ත පද්ධතිය අනුව හෙක්ටයාර් 760,498 කි. |
| | | 03. 2020 – 2021 වර්ෂවල මහ කන්නයේ ලැබූ වී අස්වැන්නෙන් අවම වශයෙන් සියයට 75ක් ලබා ගැනීම (පදනම 2020 – 2021 මහ කන්නය වී අස්වැන්න මෙ. ටොන් 3,061,394) | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 2022 – 2023 දත්ත ප්‍රකාශයට පත් වී නොමැත |
| 02. | නිමවුම් (Out Put)<br>දුගී සහ අවදානමට ලක් වූ කණ්ඩායම් සඳහා ඍජු මූල්‍ය සහන ලබා දීම | 01. අඩු ආදායම්ලාභී පවුල් මි. 1.76ක් හා පොරොත්තු ලේඛනගත පවුල් මි. 0.73ක් සඳහා මුදල් ආධාර දීම (පදනම - 2022 අගෝස්තු දක්වා ආධාර ලබා දීම) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ CRM පරිගණක පද්ධතිය | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව 2022 - සැප්තැම්බර් 99%<br>ඔක්තෝබර් 99%<br>නොවැම්බර් 99% |
| | | 02. අඩු ආදායම්ලාභී වැඩිහිටියන් (අවු 70ට වැඩි හා අවුරුදු 100 සම්පූර්ණ කළ) මි. 0.42 හා පොරොත්තු ලේඛනගත මි. 0.24ක් සඳහා මුදල් ආධාර දීම(පදනම - 2022 අගෝස්තු දක්වා ආධාර ලබා දීම) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව 2022 - සැප්තැම්බර් 74%<br>ඔක්තෝබර් 74%<br>නොවැම්බර් 75% |

| | | | | |
|---|---|---|---|---|
| | | 03. අඩු අදායම්ලාභී ආබාධිත තැනැත්තන් 71,000 ක් හා පොරොත්තු ලේඛනගත 61,000ක් සඳහා මුදල් ආධාර දීම (පදනම - 2022 අගෝස්තු ආධාර දක්වා ගෙවීම) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව 2022 - සැප්තැම්බර් 63%<br>ඔක්තෝබර් 63%<br>නොවැම්බර් 63% |
| | | 04. අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් 38,000ක් හා පොරෝත්තු ලේඛනගත 5,000කට ආධාර ලබා දීම (පදනම - 2022 අගෝස්තු දක්වා ආධාර ගෙවීම) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව 2022 - සැප්තැම්බර් 92%<br>ඔක්තෝබර් 93%<br>නොවැම්බර් 92% |
| | | 05. ගර්භනී හා කිරිදෙන මව්වරුන් 300,000 කට මුදල් ආධාර ලබාදීම (පදනම - 2019 මව්වරුන් 300,246කට රු. 2,000 බැගින් වවුචර්පත් ලබාදීම | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව (මාස 04ක කාලය තුළ සුදුසුකම් ලැබූ) 51% |
| 03. | අවධානමට ලක්වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය සංවර්ධනය | අවම වශයෙන් වී ගොවීන් 600,000කට මහ කන්නය (2022 සැප්තැම්බර් 2023 මාර්තු) සඳහා වගා කළ ප්‍රමාණයට මුදල් ආධාර ලබාදීම | Geo – Goviya දත්ත පද්ධතිය | සහනාධාර සඳහා අයදුම්කළ ගොවීන්ගෙන් ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාවේ ප්‍රතිශතය 88% (2022 සැප්තැම්බර්, 2023 ජුලි 31 දක්වා මහ කන්නය සඳහා මුදල් ආධාර අයදුම්කළ ගොවීන් 1,176,655 වේ. 2023 ජුලි 31 දිනට මුදල් ආධාර ලබාදුන් ගොවීන් සංඛ්‍යාව 1,039,961 වේ) |

(අ) ඉහත ව්‍යාපෘතියේ අදාළ වැඩසටහන්වල ප්‍රතිඵලය (Out Come) ලෙස දක්වා ඇත්තේ ආහාර අනාරක්ෂිතතාවය සියයට 30කින් අඩු කිරීමත් මහ කන්නය (2022 සැප්තැම්බර්, 2023 මාර්තු) කුඹුරු ඉඩම්වලින් සියයට 80ක් වගා කිරීමත්, 2020-2021 වර්ෂවල මහ කන්නයේ ලැබූ වී අස්වැන්නෙන් අවම වශයෙන් සියයට 75ක් ලබා ගැනීම වේ. ආහාර අනාරක්ෂිතතාවය අඩු කිරීමේ ප්‍රගතිය 2024 හා 2025 වර්ෂවලදී ශ්‍රී ලංකා රජය හෝ සංවර්ධන පාර්ශවකරු වන ආසියානු සංවර්ධන බැංකු විසින් ගණනය කරන බව දක්වා ඇත. මහ කන්නයේ (2022 සැප්තැම්බර් - 2023 මාර්තු) වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ දත්ත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ Geo – Goviya දත්ත පද්ධතිය අනුව තිබුණත් 2021-2022 මහ කන්නයේ දත්ත Geo – Goviya දත්ත පද්ධතිය තුළ නොමැති වීමෙන් ප්‍රගතිය මැනිය නොහැකි වී ඇත. බලාපොරොත්තු වූ වී අස්වැන්න ලබා ගැනීමේ ප්‍රගතිය මැනීමට ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2022-2023 මහ කන්නයේ දත්ත ප්‍රකාශයට පත් වී නොමැති නිසා ප්‍රගතිය මැනීමට නොහැකි වී ඇත.

(ආ) ඉහත ව්‍යාපෘතියේ නිමවුම් (Out Put) වල ප්‍රගතිය පරීක්ෂාවේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

අඩු ආදයම්ලාභී පවුල් මිලියන 2.49 සඳහා මුදල් ආධාර ලබාදීමේ ප්‍රගතිය සැලසුම් කළ ඉලක්ක හා සසඳා බැලීමේ දී 2022 සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල සියයට 99කි. අඩු ආදායම්ලාභී වැඩිහිටියන් මිලියන 0.66ක් හට මුදල් ආධාර ලබාදීමේ ප්‍රගතිය 2022 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස සඳහා සියයට 74ක් ද 2022 නොවැම්බර් මාසය සඳහා සියයට 75ක් ද වේ.අඩු ආදායම්ලාභී ආබාධිත තැනැත්තන් 132,000ක් සඳහා මුදල් ආධාර ලබාදීමේ ප්‍රගතිය 2022 සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාස සඳහා සියයට 63ක් බැගින් වේ. අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් 43,000ක් සඳහා මුදල් ආධාර ලබාදීමේ ප්‍රගතිය 2022 සැප්තැම්බර් මාසයේ සියයට 92ක් ඔක්තොබර් මාසයේ සියයට 93ක් හා නොවැම්බර් මාසයේ සියයට 92කි. ගර්භනී හා කිරිදෙන මවුවරුන් සඳහා (ප්‍රතිලාභ ගෙවූ මාසවලට හිමිකම් ලැබූ) මුදල් ආධාර ලබාදීමේ ප්‍රගතිය 2023 ජුලි මාසයට සියයට 51ක් වේ.

(ඇ)ඉහත ව්‍යාපෘතිය යටතේ අවධානමට ලක්වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වැඩසටහනක් වූ මහකන්නය (2022/2023) සඳහා වී වගාකල ගොවීන් හට මුදල් ආධාර ලබා දීමේ ප්‍රගතිය ව්‍යාපෘතිය මගින් මුදල් ආධාර ලබාදීම සහනාධාර අයදුම් කළ ගොවීන් 1,176,655 ට සාපේක්ෂව 2023 ජූලි 31 දක්වා දක්වා ප්‍රගතිය සියයට 88 ක් වේ.

04. නිර්දේශ

(අ) 2002 අංක 24 දරන සුබ සාධක ප්‍රතිලාභ පනත අනුව 2022 ඔක්තෝබර් මස නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව සියළු සුබසාධක වැඩසටහන් සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්ගේ බලතල අනුව ක්‍රියාත්මක කිරීම.

(ආ) සමෘද්ධි බැංකු පරිගණක පද්ධතිය (CRM system) නවීකරණය මගින් ප්‍රතිලාභීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දීම.

(ඇ) ප්‍රතිලාභීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දීමටත්, නිලධාරීන්ට තෘප්තිමත්ව රාජකාරී ඉටු කිරීමට සඳහාත් සමෘද්ධි බැංකු සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා දීම.

(ඈ) පහසුවෙන් අවදානමට ලක් වන පුද්ගලයන් (අඩු ආදායම්ලාභීන්, වැඩිහිටි හා ආබාධිත පුද්ගලයන්, රෝගීන්, ළමයින්, කාන්තාවන්) සඳහා ප්‍රතිලාභ ලබා දීමේ දී විශේෂ අවධානයකින් වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඉ) ගොවීන් සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන Geo Goviya පරිගණක පද්ධතියට මිනුම් කළ භූමි ප්‍රමාණ ඇතුලත් කිරීම, වගා කන්නවල ගොවීන් විසින් සපයනු ලබන තොරතුරු අනුව අවශ්‍ය සංශෝධන කඩිනමින් සිදුකළ හැකි පරිදි පරිගණක පද්ධතිය වැඩි දියුණු කිරීම.

(ඊ) ගෙවීම් පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කොමසාරිස්, ප්‍රාදේශීය නිලධාරි ඇතුලු වගකිව යුතු නිලධාරින්ට අවශ්‍යකරන දිනයට කඩිනමින් ලබාගත හැකි පරිදි පරිගණක පද්ධතිය නවීකරණය කිරීම .

(උ) ගොවීන් දිරිමත් කිරීම සඳහා රාජ්‍ය බැංකු පවත්වාගෙන යනු ලබන ගොවි දිරිය බැංකු ගිණුම් සක්‍රීයව පවත්වා ගැනීමට රාජ්‍ය බැංකු සමග එකඟතාවයක් ඇති කර ගැනීම සහ සහනාධාර ගෙවීම සඳහා ගොවිදිරිය බැංකු ගිණුම් භාවිතා කිරීම.

(ඌ) හදිසි ප්‍රතිලාභ ගෙවීමේ දී ලිඛිත චක්‍රලේඛ උපදෙස් නවීන තාක්ෂණික ක්‍රම මගින් අදාළ නිලධාරින් වෙත කාලීනව යොමු කිරීම හා අදාළ ක්‍රියාමාර්ග ගැනීම.

(ඒ) 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට දැනට පවතින අඩුපාඩු (Gaps) හඳුනාගෙන ඒ සඳහා අදාළ වගකිව යුතු ආයතන විසින් පියවර ගැනීම.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති
2024 ජුනි 24 දින

ඇමුණුම **01**

**සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් බැංකු වෙත මුදල් බැර කරන ලද සහ සත්‍ය වශයෙන් ගෙවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව**

| | මාසය | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැප්තැම්බර් | | | | ඔක්තෝම්බර් | | | | නොවැම්බර් | | | | |
| දීමනාව | ගෙවීම් කිරීම සඳහා සමෘ. දෙපා.විසින් සමෘ. බැංකු වෙතමුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සමෘ. බැංකු විසින්මුදල් ගෙවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය % | ගෙවීම් කිරීම සඳහා සමෘ. දෙපා.විසින් සමෘ. බැංකුවෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සමෘ. බැංකු විසින් මුදල් ගෙවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය % | ගෙවීම් කිරීම සඳහා සමෘ. දෙපා.විසින් මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සමෘ. බැංකු විසින් මුදල් ගෙවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙනස | වෙනසේ ප්‍රතිශතය % |
| නිත්‍ය | 415398 | 406983 | 8415 | 2.02 | 416833 | 409451 | 7382 | 1.77 | 418674 | 409612 | 9062 | 2.16 |
| අතිරේක | 243933 | 210909 | 33024 | 13.53 | 235968 | 209968 | 26000 | 11.01 | 237674 | 210531 | 27143 | 11.42 |
| පොරොත්තු ලේඛනගත | 115037 | 83491 | 31546 | 27.42 | 115018 | 83555 | 31463 | 27.35 | 115753 | 83154 | 32599 | 28.16 |

*මූලාශ්‍රය - සමෘද්ධි සං. දෙපාර්තමේන්තුව(All island summary for elderly payment)*

**ඇමුණුම 02**

## වැඩිහිටි නිත්‍ය, අතිරේක හා පොරොත්තු දීමනා ගෙවීම(වයස අවුරුදු 70ට වැඩි)

| මාසය | නිත්‍ය දීමනා ගෙවීම | | | | අතිරේක දීමනා ගෙවීම | | | | පොරොත්තු දීමනා ගෙවීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගෙවීම් කිරීම සඳහා සමෘ. දෙපා.විසින් සමෘ. බැංකු වෙත බැර කරන ලද මුදල් ප්‍රමාණය (රු.) | සමෘ. බැංකු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය (රු.) | වෙනස (රු.) | වෙනසේ ප්‍රතිශතය % | ගෙවීම් කිරීම සඳහා සමෘ. දෙපා.විසින් සමෘ. බැංකු වෙත බැර කරන ලද මුදල් ප්‍රමාණය (රු.) | සමෘ. බැංකු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය (රු.) | වෙනස (රු.) | වෙනසේ ප්‍රතිශතය% | ගෙවීම් කිරීම සඳහා සමෘ. දෙපා.විසින් සමෘ. බැංකු වෙත බැර කරන ලද මුදල් ප්‍රමාණය (රු.) | සමෘ. බැංකු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය (රු.) | වෙනස (රු.) | වෙනසේ ප්‍රතිශතය% |
| **සැප්තැම්බර්** | 789256200 | 773267700 | 15988300 | 2.02 | 731799000 | 632727000 | 99072000 | 13.53 | 575185000 | 417455000 | 157730000 | 27.42 |
| **ඔක්තෝබර්** | 791982700 | 777956900 | 14025800 | 1.77 | 707904000 | 629904000 | 78000000 | 11.01 | 575090000 | 417775000 | 157315000 | 27.35 |
| **නොවැම්බර්** | 795480600 | 778262800 | 17217800 | 2.16 | 713023500 | 631593000 | 81430500 | 11.42 | 578709200 | 415770000 | 162939200 | 28.15 |

*මූලාශ්‍රය - සමෘද්ධි සං. දෙපාර්තමේන්තුව(All island summary for elderly payment)*

ඇමුණුම 03

## ප්‍රතිලාභීන් මුදල් ලබා නොගැනීමට හේතු

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිලාභී කාණ්ඩය | මාසය | ප්‍රතිලාභ ඉල්ලුම් කළ සංඛ්‍යාව | සමෘද්ධි දෙපා.වෙන් මුදල් ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | දීමනාව ලබා නොගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල් ලබා නොගැනීමට හේතුව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ද්විකරණ | බැංකු ගිණුම් නොමැති වීම | වෙනත් * | ද්විකරණය වීමේ ප්‍රතිශතය | ගිණුම් විවෘත නොකළ ප්‍රතිශතය |
| ගල්ගමුව | නිත්‍ය | සැප්තැම්බර් | 1265 | 1265 | 11 | 11 | - | | | |
| | | ඔක්තෝබර් | 1265 | 1265 | 11 | 1 | - | | | |
| | | නොවැම්බර් | 1265 | 1265 | 11 | 1 | - | | | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 456 | 456 | 44 | 44 | - | | 9.6 | |
| | | ඔක්තෝබර් | 456 | 456 | 49 | 49 | - | | 11 | |
| | | නොවැම්බර් | 456 | 456 | 47 | 47 | - | | 10 | |
| | පොරොත්තු | සැප්තැම්බර් | 271 | 271 | 44 | 48 | - | | 18 | |
| | | ඔක්තෝබර් | 271 | 271 | 49 | 38 | - | | 14 | |
| | | නොවැම්බර් | 271 | 271 | 47 | 42 | - | | 15 | |
| නොච්චියාගම | නිත්‍ය | සැප්තැම්බර් | 756 | 756 | 4 | - | 4 | | | |
| | | ඔක්තෝබර් | 756 | 756 | 4 | - | 4 | | | |
| | | නොවැම්බර් | 756 | 756 | 3 | - | 3 | | | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 494 | 494 | 21 | 21 | | | 4.2 | |
| | | ඔක්තෝබර් | 494 | 494 | 22 | 20 | 2 | | 4.4 | |
| | | නොවැම්බර් | 494 | 494 | 22 | 20 | | | 4.4 | |
| | පොරොත්තු | සැප්තැම්බර් | 414 | 414 | 76 | - | 66 | | | 16 |
| | | ඔක්තෝබර් | 414 | 414 | 75 | - | 65 | | | 16 |
| | | නොවැම්බර් | 439 | 439 | 75 | - | 65 | | | 15 |
| අම්බලන්තොට | නිත්‍ය | සැප්තැම්බර් | 1125 | 1125 | 17 | - | - | | | |
| | | ඔක්තෝබර් | 1129 | 1129 | 29 | - | - | | | |
| | | නොවැම්බර් | 1127 | 1127 | 18 | - | - | | | |
| | අතිරේක | සැප්තැම්බර් | 712 | 712 | 45 | 45 | - | | 6.3 | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දීමනා | ඔක්තෝබර් | 712 | 712 | 62 | 62 | - | | 8.7 | |
| | | නොවැම්බර් | 712 | 712 | 53 | 53 | - | | 7.4 | |
| | පොරොත්තු | සැප්තැම්බර් | 276 | 276 | 6 | - | - | | | |
| | | ඔක්තෝබර් | 276 | 276 | 8 | - | - | | | |
| | | නොවැම්බර් | 276 | 276 | 12 | - | - | | | |
| පලුගස්වැව | නිත්‍ය | සැප්තැම්බර් | 426 | 426 | - | - | - | | | |
| | | ඔක්තෝබර් | 426 | 426 | - | - | - | | | |
| | | නොවැම්බර් | 426 | 426 | 1 | - | - | | | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 233 | 233 | 78 | 76 | - | | 33 | |
| | | ඔක්තෝබර් | 233 | 233 | 77 | 76 | - | | 33 | |
| | | නොවැම්බර් | 233 | 233 | 77 | 75 | - | | 33 | |
| | පොරොත්තු | සැප්තැම්බර් | - | - | - | - | - | | | |
| | | ඔක්තෝබර් | - | - | - | - | - | | | |
| | | නොවැම්බර් | 13 | 13 | - | - | - | | | |
| මන්මුනායි (උතුර) | නිත්‍ය | සැප්තැම්බර් | 1597 | 1597 | 7 | - | - | * | | |
| | | ඔක්තෝබර් | 1597 | 1597 | 12 | - | - | * | | |
| | | නොවැම්බර් | 1597 | 1597 | 8 | - | - | * | | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 673 | 673 | 9 | - | - | | | |
| | | ඔක්තෝබර් | 673 | 673 | 22 | - | - | | | |
| | | නොවැම්බර් | 673 | 673 | 17 | - | - | | | |
| | පොරොත්තු | සැප්තැම්බර් | 99 | 99 | 14 | - | - | | | |
| | | ඔක්තෝබර් | 100 | 100 | 18 | - | - | | | |
| | | නොවැම්බර් | 100 | 100 | 19 | - | - | | | |
| මන්මුනායි (බටහිර) | නිත්‍ය | සැප්තැම්බර් | 791 | 791 | 7 | - | - | * | | |
| | | ඔක්තෝබර් | 791 | 791 | 10 | - | - | * | | |
| | | නොවැම්බර් | 790 | 790 | 8 | - | - | * | | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 153 | 153 | 10 | - | - | | | |
| | | ඔක්තෝබර් | 153 | 153 | 11 | - | - | | | |
| | | නොවැම්බර් | 153 | 153 | 11 | - | - | | | |
| | පොරොත්තු | - | - | - | - | - | - | | - | - |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තණමල්විල | නිත්‍ය | සැප්තැම්බර් | 678 | 678 | | | | | | |
| | | ඔක්තෝබර් | 678 | 678 | | | | | | |
| | | නොවැම්බර් | 678 | 678 | | | | | | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 319 | 319 | | | | | | |
| | | ඔක්තෝබර් | 319 | 319 | | | | | | |
| | | නොවැම්බර් | 319 | 319 | | | | | | |
| | පොරොත්තු | සැප්තැම්බර් | 130 | 129 | | | | 11 | | |
| | | ඔක්තෝබර් | 130 | 129 | | | | 11 | | |
| | | නොවැම්බර් | 130 | 129 | | | | 11 | | |
| ඉබ්බාගමුව | නිත්‍ය | සැප්තැම්බර් | 1374 | 1374 | - | - | - | | - | |
| | | ඔක්තෝබර් | 1377 | 1377 | - | - | - | | - | |
| | | නොවැම්බර් | 1377 | 1377 | - | - | - | | - | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 539 | 539 | 14 | 14 | - | | 2.5 | |
| | | ඔක්තෝබර් | 539 | 539 | 13 | 13 | - | | 2.4 | |
| | | නොවැම්බර් | 539 | 539 | 13 | 13 | - | | 2.4 | |
| | පොරොත්තු | සැප්තැම්බර් | 553 | 553 | 75 | 69 | - | | 12 | |
| | | ඔක්තෝබර් | 553 | 553 | 76 | 69 | - | | 12 | |
| | | නොවැම්බර් | 553 | 553 | 77 | 69 | - | | 12 | |
| කතරගම | නිත්‍ය | සැප්තැම්බර් | 375 | 375 | - | - | - | | - | |
| | | ඔක්තෝබර් | 375 | 375 | - | - | - | | - | |
| | | නොවැම්බර් | 375 | 375 | - | - | - | | - | |
| | අතිරේක දීමනා | සැප්තැම්බර් | 219 | 219 | 32 | 32 | - | | 15 | |
| | | ඔක්තෝබර් | 219 | 219 | 24 | 24 | - | | 11 | |
| | | නොවැම්බර් | 219 | 219 | 24 | 24 | - | | 11 | |
| | පොරොත්තු | සැප්තැම්බර් | 44 | 44 | - | - | - | | - | |
| | | ඔක්තෝබර් | 44 | 44 | - | - | - | | - | |
| | | නොවැම්බර් | 44 | 44 | - | - | - | | - | |
| * මියයාම්,පදිංචිය මාරුවීම්,සුදුසුකම්ලාභියකු නොවීම | | | | | | | | | | |

**වැඩිහිටි ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට සහනාධාර බැර වීම ප්‍රමාද වීම පිළිබඳ විස්තර**

| සමෘද්ධි බැංකුව | මාසය | දීමනා වර්ගය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නිත්‍ය | | | අතිරේක | | | පොරොත්තු | | |
| | | ජංගම ගිණුමට මුදල් ලැබුණු දිනය | දීමනා ගෙවීම සඳහා මාසය තුළ ගිණුම් හර කළ දිනයන් | ප්‍රමාද කාලය (දින) | ජංගම ගිණුමට මුදල් ලැබුණු දිනය | දීමනා ගෙවීම සඳහා මාසය තුළ ගිණුම් හර කළ දිනයන් | ප්‍රමාද කාලය (දින) | ජංගම ගිණුමට මුදල් ලැබුණු දිනය | දීමනා ගෙවීම සඳහා මාසය තුළ ගිණුම් හර කළ දිනයන් | ප්‍රමාද කාලය (දින) |
| කතරගම | සැප්තැම්බර් | 2022.10.11<br>2022.11.17 | 2022.10.23<br>2022.11.28 | 12<br>11 | 2022.10.17<br>2022.10.17 | 2022.10.23<br>2022.11.12<br>2022.11.28 | 06<br>25<br>41 | 2022.10.18 | 2022.11.06 | 19 |
| | ඔක්තෝබර් | 2022.11.18 | 2022.11.29 | 10 | 2022.11.28 | 2022.12.04<br>2022.12.15 | 06<br>17 | 2022.11.23 | 2022.12.04 | 11 |
| | නොවැම්බර් | 2022.12.16 | 2022.12.21 | 05 | 2022.12.16 | 2022.12.22 | 06 | 2022.12.16 | 2022.12.22 | 06 |
| නෝනාගම | සැප්තැම්බර් | 2022.10.11 | 2022.10.15 | 04 | 2022.10.17 | 2022.10.20 | 03 | 2022.10.18 | 2022.10.20 | 02 |
| | ඔක්තෝබර් | 2022.11.20 | 2022.11.21 | - | 2022.11.30 | 2022.11.30 | - | 2022.12.02 | 2022.12.02 | - |
| | නොවැම්බර් | 2022.12.19 | 2022.12.19 | - | 2022.12.19 | 2022.12.19 | - | 2022.12.19 | 2022.12.19 | - |
| පුලියන්තිව් | සැප්තැම්බර් | 2022.10.12 | 2022.10.15 | 03 | 2022.10.20 | 2022.11.08 | 19 | 2022.10.20 | - | - |
| | ඔක්තෝබර් | 2022.10.19 | ප්‍රමාදයන් නැත | - | 2022.11.30 | 2022.12.22 | 22 | - | - | - |
| | නොවැම්බර් | 2022.12.17 | 2022.12.22 | 05 | 2022.12.17 | 2022.12.22 | 05 | - | - | - |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුදුමණ්ඩපත්තඩි | සැප්තැම්බර් | 2022.10.12 | 2022.10.18 | 06 | 2022.10.18 | 2022.10.29 | 11 | 2022.10.12 | 2022.11.04 | 23 |
| | ඔක්තෝබර් | 2022.11.18 | 2022.11.19 | 01 | 2022.11.28 | 2022.12.10 | 12 | 2022.11.23 | 2022.11.26 | 03 |
| | නොවැම්බර් | 2022.12.16 | 2022.12.29 | 13 | 2022.12.16 | 2022.12.20 | 04 | 2022.12.16 | 2022.12.29 | 13 |
| ඉබ්බාගමුව | සැප්තැම්බර් | 2022.10.11 | 2022.10.18 | 07 | 2022.10.17 | 2022.11.22 | 35 | 2022.10.18 | 2022.11.11 | 24 |
| | ඔක්තෝබර් | 2022.11.17 | 2022.11.22 | 05 | 2022.11.28 | 2022.12.21 | 23 | 2022.11.22 | 2022.12.14 | 22 |
| | නොවැම්බර් | 2022.12.16 | 2022.12.22 | 06 | 2022.12.16 | 2023.02.14 | 60 | 2022.12.16 | 2022.12.22 | 06 |
| තණමල්විල | සැප්තැම්බර් | 2022.10.11<br>2022.11.17 | 2022.10.27 | 16<br>- | 2022.10.07<br>- | 2022.11.21<br>- | 44<br>- | - | - | - |
| | ඔක්තෝබර් | 2022.11.18 | 2022.11.30 | 12 | 2022.11.28 | 2022.12.16 | 18 | 2022.11.28 | තොරතුරු පැහැදිලි නැත | |
| | නොවැම්බර් | 2022.12.16 | 2022.12.27 | 11 | 2022.12.16 | 2022.12.27 | 11 | 2022.12.16 | 2022.12.19 | 03 |

ඇමුණුම 05

**2022.12.31 දින වන විට ප්‍රතිලාභ ඉල්ලුම් කළ නමුත් 2023.06.30 දින වන විටත් මුදල් නොලැබීම හේතුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කාර්යාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය | හේතු/වෙනත් |
|---|---|---|---|---|---|
| **1** | පුත්තලම | හලාවත | **5** | **50,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **2** | ගාල්ල | කරන්දෙණිය | **2** | **20,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **3** | ගාල්ල | රත්ගම | **1** | **10,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **4** | ගාල්ල | මාදම්පාගම | **1** | **10,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **5** | ගාල්ල | නාගොඩ | **5** | **50,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **6** | හම්බන්තොට | අම්බලන්තොට | **1** | **10,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **7** | මොණරාගල | බිබිල | **1** | **10,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **8** | කුරුණෑගල | මාවතගම | **1** | **10,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **9** | ගම්පහ | මීරිගම | **4** | **40,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **10** | ගම්පහ | පොල්ගහවෙල | **4** | **40,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **11** | ගම්පහ | බියගම | **5** | **50,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **12** | මාතර | පස්ගොඩ | **3** | **30,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **13** | පොළොන්නරුව | වැලිකන්ද | **12** | **120,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **14** | ත්‍රිකුණාමලය | මුතූර් | **92** | **920,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **15** | රත්නපුර | ඇලපාත | **8** | **80,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **16** | අනුරාධපුර | රාජාංගණය | **5** | **50,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **17** | අනුරාධපුර | රඹෑව | **2** | **20,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **18** | අනුරාධපුර | මනුප | **27** | **270,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **19** | අනුරාධපුර | තලාව | **17** | **170,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **20** | අනුරාධපුර | හොරොව්පතාන | **155** | **1,550,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **21** | නුවරඑළිය | නුවරඑළිය | **29** | **290,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **22** | ගාල්ල | බලපිටිය | **5** | **50,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| **23** | පොළොන්නරුව | මැදිරිගිරිය | **7** | **70,000.00** | මුදල් ප්‍රමාණවත් නොවීම |
| එකතුව | | | **392** | **3,920,000.00** | |

*මූලාශ්‍රය : මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය*

**2022.12.31 දින වන විට ප්‍රතිලාභීන් විසින් අයදුම්පත් ඉදිරිපත් කළ ද ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අතපසුවීම් හේතුවෙන් නියමිත දිනෙන් පසුව ඉදිරිපත් කරන ලද ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කාර්යාලය | ප්‍රතිලාභ හිමි වී නොමැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය | හේතු/වෙනත් |
|---|---|---|---|---|---|
| 1 | කලුතර | අගලවත්ත | 10 | 100,000.00 | අතපසු |
| 2 | කුරුණෑගල | රිදීගම | 1 | 10,000.00 | අතපසු |
| 3 | කුරුණෑගල | රිදීගම | 8 | 80,000.00 | බැංකු වෙනස් වීම |
| 4 | මන්නාරම | මාන්දය-බටහිර | 33 | 330,000.00 | අතපසු |
| 5 | ගම්පහ | මීගමුව | 24 | 240,000.00 | අතපසු |
| 6 | අම්පාර | දමන | 43 | 430,000.00 | අතපසු |
| 7 | කෑගල්ල | අරණායක | 2 | 20,000.00 | අතපසු |
| 8 | මහනුවර | හාරිස්පත්තුව | 8 | 80,000.00 | අතපසු |
| 9 | කුරුණෑගල | පඩුවස්නුවර බටහිර | 30 | 300,000.00 | අතපසු |
| 10 | වව්නියා | වව්නියාව | 23 | 230,000.00 | අතපසු |
| 11 | අනුරාධපුර | ගලෙන්බිඳුණු වැව | 3 | 30,000.00 | අතපසු |
| 12 | කෑගල්ල | රඹුක්කන | 1 | 10,000.00 | අතපසු |
| 13 | හම්බන්තොට | වළස්මුල්ල | 2 | 20,000.00 | අතපසු |
| 14 | අම්පාර | අඩ්ඩාලච්චේන | 8 | 80,000.00 | අතපසු |
| 15 | වව්නියා | වව්නියා දකුණ | 1 | 10,000.00 | අතපසු |
| 16 | කලුතර | හොරණ | 7 | 70,000.00 | අතපසු |
| 17 | මාතර | කඩවත්සතර | 2 | 20,000.00 | බැංකු වෙනස් වීම |
| 18 | අනුරාධපුර | කැකිරාව | 1 | 10,000.00 | බැංකු වෙනස් වීම |
| 19 | මාතර | කඩවත්සතර | 3 | 30,000.00 | බැංකු වෙනස් වීම |
| 20 | මොණරාගල | බිබිල | 2 | 20,000.00 | බැංකු වෙනස් වීම |
| 21 | කුරුණෑගල | රිදීගම | 4 | 40,000.00 | බැංකු වෙනස් වීම |
| 22 | ගාල්ල | බෙන්තර | 1 | 10,000.00 | බැංකු වෙනස් වීම |
| 23 | මාතර | කඩවත්සතර | 1 | 10,000.00 | බැංකු වෙනස් වීම |
| 24 | කුරුණෑගල | නිකවැරටිය | 4 | 40,000.00 | බැංකු වෙනස් වීම |
| 25 | කුරුණෑගල | ඉබ්බාගමුව | 1 | 10,000.00 | බැංකු වෙනස් වීම |
| 26 | මාතර | කඩවත්සතර | 2 | 20,000.00 | බැංකු වෙනස් වීම |
| 27 | ගාල්ල | යක්කලමුල්ල | 6 | 60,000.00 | බැංකු වෙනස් වීම |
| 28 | හම්බන්තොට | වීරකැටිය | 1 | 10,000.00 | අතපසු |
| 29 | කුරුණෑගල | බමුණාකොටුව | 3 | 30,000.00 | බැංකු වෙනස් වීම |
| 30 | කුරුණෑගල | පොල්පිතිගම | 6 | 60,000.00 | බැංකු වෙනස් වීම |
| 31 | පොළොන්නරුව | දිඹුලාගල | 17 | 170,000.00 | අතපසු |
| 32 | කුරුණෑගල | වීරඹුගෙදර | 2 | 20,000.00 | බැංකු වෙනස් වීම |
| 33 | කොළඹ | කොළඹ | 37 | 370,000.00 | අතපසු |
| 34 | කලුතර | මතුගම | 1 | 10,000.00 | බැංකු වෙනස් වීම |
| 35 | කුරුණෑගල | කුලියාපිටිය නැ. | 1 | 10,000.00 | බැංකු වෙනස් වීම |
| එකතුව | | | 299 | 2,990,000.00 | |

*මූලාශ්‍රය : මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය*

ඇමුණුම 07

**2022.12.31 දින වන විට ප්‍රතිලාභ ඉල්ලුම් නොකළ/නියමිත කාල සීමාවෙන් පසු යොමු කරන ලද ඇති ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු (නව අයදුම්කරුවන්)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කාර්යාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය | |
|---|---|---|---|---|---|
| 1 | වව්නියා | වව්නියා දකුණ | 1 | 10,000.00 | නව |
| 2 | යාපනය | උඩුවිල් | 77 | 770,000.00 | නව |
| 3 | යාපනය | කරවෙඩ්ඩි | 27 | 270,000.00 | නව |
| 4 | බදුල්ල | බදුල්ල | 1 | 10,000.00 | නව |
| 5 | හම්බන්තොට | වළස්මුල්ල | 1 | 10,000.00 | නව |
| 6 | රත්නපුර | ඇලපාත | 1 | 10,000.00 | නව |
| 7 | නුවරඑළිය | තලවකැලේ | 1 | 10,000.00 | නව |
| එකතුව | | | 109 | 1,090,000.00 | නව |

***මූලාශ්‍රය : මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය***

බැංකු ගිණුම් අක්‍රියව පැවතීම හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකි වූ ගොවීන් සංඛ්‍යාව සහ ගෙවීම් කිරීමට නොහැකි වූ මුදල් සහනාධාර

**2023 මැයි 25 දිනය වන විට සහනාධාර ගෙවීම් ප්‍රතික්ෂේප වී තිබුණු ගොවීන් සංඛ්‍යාව**

| අනු අංකය | දිස්ත්‍රික්කය | රු.4999ට අඩු | | රු.5000 | | රු.5001-9999 | | රු.10000 | | රු.10001-19999 | | රු.20000 | | මුලු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගොවීන් සංඛ්‍යාව | වටිනාකම | ගොවීන් සංඛ්‍යාව | වටිනාකම | ගොවීන් සංඛ්‍යාව | වටිනාකම | ගොවීන් සංඛ්‍යාව | වටිනාකම | ගොවීන් සංඛ්‍යාව | වටිනාකම | ගොවීන් සංඛ්‍යාව | වටිනාකම | ගොවීන් සංඛ්‍යාව | වටිනාකම |
| 1 | අම්පාර | 496 | 1737917 | 30 | 150000 | 739 | 5389072 | 194 | 1940000 | 579 | 7847676 | 151 | 3,020,000 | 2189 | 20084665 |
| 2 | අනුරාධපුර | 1129 | 3661000 | 53 | 265000 | 622 | 4532000 | 212 | 2120000 | 289 | 3878000 | 171 | 3,420,000 | 2476 | 17876000 |
| 3 | බදුල්ල | 1330 | 2989000 | 23 | 115000 | 288 | 2058600 | 77 | 770000 | 61 | 808000 | 19 | 380,000 | 1798 | 7120600 |
| 4 | මඩකළපුව | 70 | 261000 | 7 | 35000 | 262 | 2029000 | 66 | 660000 | 377 | 5034000 | 225 | 4,500,000 | 1007 | 12519000 |
| 5 | කොළඹ | 526 | 1338380 | 18 | 90000 | 85 | 584870 | 7 | 70000 | 18 | 234280 | 3 | 60,000 | 657 | 2377530 |
| 6 | ගාල්ල | 626 | 1621350 | 25 | 125000 | 132 | 881800 | 9 | 90000 | 11 | 147000 | 2 | 40,000 | 805 | 2905150 |
| 7 | ගම්පහ | 1229 | 2760609 | 34 | 170000 | 161 | 1106053 | 12 | 120000 | 40 | 537030 | 3 | 60,000 | 1479 | 4753692 |
| 8 | හම්බන්තොට | 366 | 1048775 | 20 | 100000 | 225 | 1625400 | 121 | 1210000 | 69 | 953250 | 24 | 480,000 | 825 | 5417425 |
| 9 | යාපනය | 32 | 107000 | 9 | 45000 | 35 | 249301 | 3 | 30000 | 25 | 342500 | 10 | 200,000 | 114 | 973801 |
| 10 | කළුතර | 1342 | 3657460 | 69 | 345000 | 241 | 1641380 | 44 | 440000 | 33 | 447100 | 3 | 60,000 | 1732 | 6590940 |
| 11 | නුවර | 770 | 1669320 | 13 | 65000 | 54 | 365000 | 7 | 70000 | 11 | 142000 | 0 | 0 | 855 | 2311320 |
| 12 | කෑගල්ල | 1204 | 2434740 | 33 | 165000 | 86 | 573274 | 4 | 40000 | 2 | 26950 | 0 | 0 | 1329 | 3239964 |
| 13 | කිලිනොච්චිය | 41 | 149000 | 4 | 20000 | 74 | 547000 | 10 | 100000 | 145 | 2082000 | 193 | 3,860,000 | 467 | 6758000 |
| 14 | කුරුණෑගල | 4273 | 10581000 | 169 | 845000 | 875 | 6140500 | 154 | 1540000 | 228 | 3036500 | 55 | 1,100,000 | 5754 | 23243000 |
| 15 | මන්නාරම | 28 | 100000 | 4 | 20000 | 92 | 672000 | 12 | 120000 | 108 | 1553000 | 111 | 2,220,000 | 355 | 4685000 |
| 16 | මාතලේ | 586 | 1549400 | 13 | 65000 | 218 | 1522400 | 17 | 170000 | 46 | 608800 | 9 | 180,000 | 889 | 4095600 |
| 17 | මාතර | 818 | 2018440 | 21 | 105000 | 128 | 851810 | 8 | 80000 | 32 | 422065 | 2 | 40,000 | 1009 | 3517315 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | මොණරාගල | 270 | 904500 | 30 | 150000 | 591 | 4452900 | 41 | 410000 | 109 | 1459500 | 15 | 300,000 | 1056 | 7676900 |
| 19 | මුලතිව් | 12 | 38000 | 0 | 0 | 42 | 309000 | 10 | 100000 | 74 | 960000 | 52 | 1,040,000 | 190 | 2447000 |
| 20 | නුවරඑළිය | 631 | 1579450 | 29 | 145000 | 103 | 700100 | 6 | 60000 | 12 | 156500 | 2 | 40,000 | 783 | 2681050 |
| 21 | පොළොන්නරුව | 241 | 819000 | 5 | 25000 | 311 | 2209000 | 405 | 4050000 | 206 | 2794000 | 157 | 3,140,000 | 1325 | 13037000 |
| 22 | පුත්තලම | 487 | 1542900 | 17 | 85000 | 267 | 1918390 | 56 | 560000 | 73 | 1005500 | 37 | 740,000 | 937 | 5851790 |
| 23 | රත්නපුර | 1151 | 3039370 | 46 | 230000 | 215 | 1484700 | 28 | 280000 | 39 | 500700 | 0 | 0 | 1479 | 5534770 |
| 24 | ත්‍රිකුණාමලය | 86 | 311000 | 40 | 200000 | 558 | 4227000 | 40 | 400000 | 325 | 4416000 | 103 | 2,060,000 | 1152 | 11614000 |
| 25 | වව්නියාව | 74 | 227740 | 16 | 80000 | 75 | 566640 | 13 | 130000 | 97 | 1374000 | 71 | 1,420,000 | 346 | 3798380 |
| | එකතුව | **17818** | **46146351** | **728** | **3640000** | **6479** | **46637190** | **1556** | **15560000** | **3009** | **40766351** | **1418** | **28,360,000** | **31008** | **181109892** |

| ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක | | තිරසර සංවර්ධන සභාවේ දත්ත ද්වාරය තුල ප්‍රදර්ශනය කරන අරමුණු, ඉලක්ක හා ප්‍රගතිය 2023 ජූලි 05 වන දිනට | | | | |
|---|---|---|---|---|---|---|
| අරමුණ | විස්තරය | අරමුණ | ඉලක්කය | දර්ශකය | විස්තරය | ප්‍රගතිය |
| 01. | සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1 | 1 | 1 | ජාත්‍යාන්තර දරිද්‍රතා රේඛාවට පහලින් සිටින ජනගහණයේ ප්‍රතිශතය | 2016 – 0.83% |
| | | 1 | 2 | 1 | ජාතික දරිද්‍රතා රේඛාවට පහලින් සිටින ජනගහණයේ ප්‍රතිශතය | 2019 – 14.31% |
| | | 1 | 3 | 1 | සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ආවරණය වන ජනගහණයේ ප්‍රතිශතය | 2016 – 52.9% |
| | | 1 | a | 1 | දිළිදුභාවය අඩු කිරීම සඳහා නිත්‍යානුකූල සංවර්ධන ආධාර ලැබීම් | 2020 - 0.04 (දළ ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස) |
| | | 1 | b | 1 | දුප්පත් ජනතාවගේ සමාජ වියදම් | දත්ත නැත |
| 02. | සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් සඳහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | 02 | 01 | 02 | ආහාර සුරක්ෂිතතාව නොමැති ජනගහණයේ පරිමාණය | 2019 - 9.1 |
| 12 | තිරසර පාරිභෝජන සහ නිශ්පාදන රටාවන් සහතික කිරීම. | 12 | 01 | 01 | තිරසර පාරිභෝජනය හා නිෂ්පාදනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය | දත්ත නැත. |
| | | 12 | 03 | 01 | එක් පුද්ගල ආහාර අපතේ යෑම අවම කිරීම සහ අස්වනු හානි ඇතුළු නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි අපතේ යෑම අවම කිරීම. | දත්ත නැත. |